# UNEQUAL CITIZENS:

## MUSLIM WOMEN'S STRUGGLE FOR JUSTICE AND EQUALITY IN SRI LANKA

**අසමාන පුරවැසියෝ: ශ්‍රී ලංකාවේ යුක්තිය හා සමානාත්මතාවය සඳහා මුස්ලිම් කාන්තා අරගලය**

**හිෂාමා හමීන් සහ හසනාහ් සේගු ඉස්සඩීන්**

**ඔක්තෝබර් 2016**

## පටුන


**අධ්‍යයනය පිළිබඳව** 2

**ක්‍රමවේදය** 3

**සීමාවන්** 3

**මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතේ නීති සම්පාදනයෙහි දළ විශ්ලේෂණය** 5

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි පරිපාලනය 6

**මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ කාන්තාවන් සහ ගැහැණු දරුවන් මුහුණදෙන ගැටළු** 7

1. විවාහ වීමට අවම වයසක් නොමැතිකම 7
2. මුස්ලිම් මනාලියන් සඳහා ස්වාධීනත්වය සහ තීරණ ගැනීම නොමැතිවීම 10
3. කයිකූලි/කයිකූලි (දෑවැද්ද) 12
4. දික්කසාද වීම සඳහා අසමාන ප්‍රතිපාදන 14
5. බහුභාර්යත්වය 17
6. නඩත්තු 19
7. කාතිවරු 22

**වෙනත් ජාතික නීති යටතේ නෛතික බැහැරකිරීම්** 29

**සිවිල් සමාජ මැදහත්වීම්වල දළ විශ්ලේෂණයක්** 31

**ප්‍රතිසංස්කරණ සඳහා අරගලය** 38

**ප්‍රතිසංස්කරණයට (පවතින) බාධක සහ අභියෝග** 39

**නිර්දේශ සහ ප්‍රධාන නිගමන** 55

***ඇමුණුම*: ක්‍රමෝපායයිය ක්‍රියාකාරී ලක්ෂ්‍යයන්** 60

# අධ්‍යයනය පිළිබඳව

මානව හිමිකම් ක්ෂේත්‍රය තුළ කටයුතු කරන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන මුස්ලිම් කාන්තාවන් ලෙස, මෙම අධ්‍යයනයෙහි ප්‍රාථමික පෙළඹවීම ලබාගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ දහස් ගණන් මුස්ලිම් කාන්තාවන් අත්දකින කටුක යථාර්ථයන්ගෙනි. අපගේ වැඩවලට අදාළ විෂයයන් තුළ 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ එය පරිපාලනය කිරීමට පිහිටුවන ලද කාති අධිකරණ පද්ධතියෙහි විෂයයන් යටතේ කාන්තාවන් ලද අතිශය ඛේදජනක අත්දැකීම් පිළිබඳ අවස්ථාවන් ගණනාවක් ගැන අපට දැනගන්නට ලැබුණි. නීතිය නිසාම, නීතිය ක්‍රියාත්මක කරන ආකාරය සහ නීතිය විසින් වැජඹෙන්නට ඉඩ දී ඇති සංස්කෘතිය නිසාම, නිමක් නැති සිද්ධීන් පවතී.

අපගේ ඇදහිල්ල බෙදා හදා ගන්නා බලපෑමට ලක්වූ කාන්තාවන්ගේ අසහනකාරී සහ පුදුමයට පත්කරන කතාවලින් සහ යුක්තිය සහ සමානාත්මතාවය උදෙසා ඔවුන් ගෙන යන දිගු අරගල ගැන අපි සලිත වුනෙමු. ඒ නිසාම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ එහි ප්‍රතිසංස්කරණ වලට සම්බන්ධ සංකීර්ණතාවන් අවබෝධ කර ගැනීම තවදුරටත් වැඩිකරගැනීම පිණිස අධ්‍යයනයක් නිර්මාණය කිරීමට සහ එය සිදු කිරීමට අපව පොළඹවන ලදී.

මෑතකදී, මුස්ලිම් විවාහ සහ ප්‍රතිසංස්කරණ සාකච්ඡාව, ක්‍රියාකාරීන් සහ ගතානුගතිකයින්ගේ පටු සීමා ඉක්මවා මුස්ලිම් ප්‍රජාව අතර වැඩි ගැම්මක් ලබා ඇත. ශ්‍රී ලංකාව තුළ දැනට සිදුවෙමින් පවතින ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ "අයිතීන් පාදක කරගත් ව්‍යවස්ථාවක්" අපේක්ෂා කිරීම ගැන පවතින සංවාදයද සමග, මෙය ශ්‍රී ලංකාව තුළ සුළුතර මුස්ලිම් කාන්තාවන් වීමෙන් අදහස්කරන්නේ කුමක්ද යන්න පිළිබඳව ඉතා බරපතළ ප්‍රශ්න කිහිපයක් පැන නඟා ඇත. රටෙහි මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙන් පාලනය වන කාන්තා ජීවිතවලට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නීතිය සහ එය ක්‍රියාත්මක කිරීම මගින් ඇතිවන ප්‍රතිවිපාක සහ බලපෑම කුමක්ද? මෙම නීතිය සහ එය ක්‍රියාත්මක කිරීමෙහි අඩුපාඩු පුළුල් ලෙස පිළිගෙන තිබියදීත්, බොහෝ දෙනෙකුගේ කැපවුණු ප්‍රයත්නයන් තිබියදීත්, අද දක්වා මෙම පණතෙහි ප්‍රතිසංස්කරණ මඟහැරී ගොස් ඇත්තේ මන්ද?

මෙම පැනයන්ට පිළිතුරු ලබාදීමේදී අධ්‍යයනය පහත සඳහන් අන්දමින් ව්‍යුහගත වී ඇත: අධ්‍යයනයෙහි 1 වන කොටස විවාහය සහ දික්කසාදය පිළිබඳ සමාන්තර නීති පද්ධතියෙන් මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු දරුවන් සඳහා පවතින ප්‍රධාන ප්‍රායෝගික ගම්‍යාර්ථයන් සමහරක් විශ්ලේෂණය කිරීම සිදුකරයි. 2 වන කොටස සිවිල් සමාජ සංවිධාන විසින් මෙම ගැටළු ආමන්ත්‍රණය කිරීමට කාන්තාවන්ට සහාය දීමේ සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කිරීමේ ප්‍රයත්නයන් සමහරක දළ විශ්ලේෂණයක් ලබාදෙයි. 3 වන කොටස, ජාතික මට්ටමේ බහුවිධ උත්සාහයන් තිබියදීත්, ශ්‍රී ලංකාව තුළ පසුගිය විසිපස් වසර තුළ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සිදුකිරීම සීමාකර ඇති ප්‍රධාන බාධක සහ අභියෝග විශ්ලේෂණය කරයි. මෙම සොයාගැනීම් මත පදනම්ව, 4 වන කොටසෙහි මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට සම්බන්ධ ප්‍රතිසංස්කරණ පිළිබඳව නිර්දේශ සමහරක් කිරීමට මෙම අධ්‍යයනය ඉදිරිපත් වන අතර, එය වර්තමාන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වැටහෙන ආකාරය තුළ කරුණු දක්වයි.

සුළුතර අයිතීන් සහ පුරවැසියන් ලෙස ඇති අයිතීන් ගැන අවධානය උත්සන්න වී ඇති වාතාවරණයක් තුළ, "සමානාත්මතාවය" පිළිබඳ ඉල්ලීම් ගැන යමක් කියාපෑමට අවස්ථාවක් ලබාදීමෙන් මෙම අධ්‍යයනය කාලෝචිත වේ. 16 (1) වගන්තිය අහෝසි කිරීමෙන් පුද්ගලික නීති ඇතුළුව සියළුම නීති සමානාත්මතාවයේ පරීක්ෂණයට සහ අධිකරණ සමාලෝචනයකට ලක්කිරීමේ අවශ්‍යතාවය වටා පවතින සාකච්ඡාව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් කාන්තාවන් සහ ගැහැණු දරුවන් මත ඇතිවන සෘණාත්මක බලපෑම ආමන්ත්‍රණය කිරීම සඳහා ඒකරාශී කිරීමේ ලක්ෂ්‍යයක් බවට පත්ව ඇත.

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් මුස්ලිම් කාන්තාවන්ගේ දෛනික ජීවිතයට මෙතරම් හානිකර සහ අහිතකර වන දැනට පවතින තත්ත්වය වෙනස් කිරීමේ අපේක්ෂාවෙන් ආරම්භ කරන ලද්දකි. මෙය, විමර්ශනය සහජයෙන්ම ඇතුළාන්තය වෙතට, එනම් අප අයිතිවන ප්‍රජාව දෙසටම හැරවීමකි. එමෙන්ම, එය ශ්‍රී ලංකාවෙහි මුස්ලිම් කාන්තාවන් සමාන පුරවැසියන් ලෙස පිළිගැනීමට කරන අරගලය සඳහා මෙම අවස්ථාවේ අපගේ අයිතීන් සඳහා පූර්ණ ඇපයක් සහ ආරක්ෂාව සහිතව ලබාදෙන අපගේ දායකත්වයයි. සිය කාලය වැය කරමින් අප සමග ඔවුන්ගේ දෘෂ්ටිකෝණයන් බෙදාහදාගත් කාන්තාවන්ට සහ පිරිමින්ට අපි ස්තූතිවන්ත වෙමු. සිය ජීවිත තුළ සහ ප්‍රජාවන් තුළ පවතින අසාධාරණයන්ට එරෙහිව අරගල කරන ශ්‍රී ලාංකික එඩිතර සොයුරියන්ට සහ විශාල අපහසුකම් තිබියදීත්, කාන්තාවන් හට වඩාත් හොඳ ගනුදෙනුවක් සඳහා කැපවී සිටි සියල්ලන් වෙත අපි මෙම අධ්‍යයනය කැපකරමු.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහි පරමාර්ථය වෙනුවෙන් ප්‍රාථමික දත්ත සහ ද්විතියික තොරතුරු එක්රැස් කර සමාලෝචනය කරන ලදී. කොළඹ, පුත්තලම, මඩකලපුව, මන්නාරම සහ අම්පාර යන පෙදෙස්වලින් තෝරාගත් පුද්ගල සම්මුඛ සාකච්ඡා හරහා සහ, ප්‍රධාන වශයෙන් පුත්තලම සහ මඩකලපුවෙහි පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හරහා ප්‍රාථමික දත්ත එක්රැස් කරන ලදී. තෝරාගත් පුද්ගල සම්මුඛ සාකච්ඡා 49 ක් (කාන්තාවන් 32 ක් සහ පිරිමින් 17 ක්) සහභාගි වූ අතර, එහිදී අර්ධ-ව්‍යුහගත සහ විවෘත ප්‍රශ්න භාවිතා කෙරුණි. මෙහි අරමුණ වූයේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත වටා පවතින ගැටළු, ප්‍රතිසංස්කරණ, ප්‍රගතියට ඇති බාධා සහ අභියෝග ගැනද, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තවදුරටත් ගෙන යාම සඳහා ක්‍රමෝපායයන් ගැන විවිධ ක්‍රියාකාරීන් සහ පුද්ගලයින්ගේ අදහස් උදහස් (සංජානනයන්) ලබාගැනීමය. මෙම ගැටළු පිළිබඳ වෙනස් වූ දෘෂ්ටිකෝණයන් ඇති පුද්ගලයින් පුද්ගල සම්මුඛ සාකච්ඡා සඳහා තෝරාගැනීමට විශේෂ අවධානයක් යොමුකරන ලදි. ප්‍රතිසංස්කරණ නැඹුරුවක් ඇති ක්‍රියාකාරීන්ගේ සිට පවතින තත්ත්වය එසේම පවත්වාගෙන යාමට උනන්දු වන ආගමික ගතානුගතිකයින් දක්වා පුළුල් පරාසයක පුද්ගලයින් තෝරාගැනීම සහතික කෙරුණි.

සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවන්ට, අදාළ සිවිල් සමාජ ක්‍රියාකාරීන්, විවාහය, දික්කසාදය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැනි අනෙකුත් ගැටළු වලට නීතිමය සහන ලබාදීම ගැන මුස්ලිම් සහ මුස්ලිම් නොවන කාන්තාවන් සමග කටයුතු කරන කාන්තා අයිතීන් පිළිබඳව හඬනගන්නන් සහ උපදේශකයින් ඇතුළත් විය. සම්මුඛ සාකච්ඡාවලට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු සහ අභියෝග ගැන හොඳින් දන්නා පුද්ගලයින්; කාති අධිකරණයේ විනිසුරුවරුන් බෝරා සහ මේමන් ප්‍රජාවන්ගේ රෙජිස්ට්‍රාර්වරු සහ කාතිවරුන්; මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නඩු ගැන කටයුතු කර ඇති නීතිඥයින්; 2009 මුස්ලිම් පුද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුවෙහි සාමාජිකයින්; අධිකරණ සේවා කොමිෂන් සභාව, නීති ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය යන මේවායින් රාජ්‍ය නිලධාරීන්, ආදීහු ඇතුළත් වූහ.

ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ප්‍රාථමිකව පවත්වන ලද්දේ පුත්තලම සහ මඩකලපුවෙහි සිවිල් සමාජ සංවිධාන දෙකක ස්වේච්ඡා නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමගය. තෝරාගත් සංවිධාන වූයේ දෛනිකව කාන්තාවන් සහ කාති අධිකරණ සමග සෘජුවම කටයුතු කරන සහ වෙනස්කොට සැළකීමේ අවස්ථාවලදී බොහෝවිට කාන්තාවන් හට සහාය දෙන ඒවාය.

ද්විතියික දත්ත එක්රැස් කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ ප්‍රධාන ප්‍රකාශන මෙන්ම, අන් රටවල මුස්ලිම් පවුල් නීතිය සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියන් ගැන අදාළ ප්‍රකාශන සහ පත්‍රිකා පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක් කිරීම හරහාය.

## සීමාවන්

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි කාන්තාවන්ට වෙනස්කොට සැළකීමේ විධිවිධාන පිළිබඳව පුළුල් ලේඛන ගත කිරීම් සහ කාති අධිකරණයන් තුළ කාන්තාවන් මුහුණදෙන ප්‍රායෝගික ගැටළු ගැන යම්තාක් දුරට ලේඛණගත කිරීම් පවතින අතර, විවිධ මතිමතාන්තර සහ ප්‍රතිසංස්කරණවලට ඇති අභියෝග ගැන ලේඛනගත කිරීම් ඇත්තේ ඉතා සුළුවෙනි. එබැවින්, මෙම අධ්‍යයනයේදී ලබාගත් තොරතුරු සඳහා බොහෝ දුරට තෝරාගත් පුද්ගල සම්මුඛ සාකච්ඡා මත විශ්වාසය තබා ඇත. සුදුසු සහ අදාළ අවස්ථාවලදී, නඩු පිළිබඳව සහ සමකාලීන ගැටළු පිළිබඳ තොරතුරු බහුවිධ ආරංචි මාර්ග හරහා තහවුරු කර ගැනීමට කණ්ඩායම උත්සාහ කර ඇත.

2009 මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුවෙහි සමහර ප්‍රධාන පුද්ගලයින් සමග මෙන්ම, මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අධිකරණ අමාත්‍යවරයා සමග සම්මුඛ සාකච්ඡා ලබාගැනීමට බොහෝ උත්සාහ දැරුවත්, කර්තෘන්ට එය ඉටුකර ගැනීමට නොහැකි විය. තෝරාගත් පුද්ගලයින් සැමදොනම දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීම් වලට භාජනය වුවත්, අධ්‍යයනයෙහි සීමිත කාල රාමුව නිසා, සම්මුඛ සාකච්ඡාවක් ලබාදීමට පසුබට වූ හෝ අවශ්‍ය වූ විට මුණගැසීමට නොහැකි වූ තෝරාගත් ප්‍රධාන තොරතුරු සපයන්නන් පසුපස දිගටම යාමට කණ්ඩායමට නොහැකි විය.

# PART 1:
# IMPACT OF MUSLIM MARRIAGE AND DIVORCE ACT (MMDA) ON MUSLIM WOMEN AND GIRLS

## 1 වන කොටස:
## මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් මත මුස්ලිම් විවාහය සහ දික්කසාද පනතෙහි බලපෑම

## මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතේ නීති සම්පාදනයෙහි දළ විශ්ලේෂණය

*"ෂරියා" යනුවෙන් හැඳින්වෙන්නේ "මුස්ලිම් නීතිවේදීන් විසින්, විශේෂයෙන් ඉස්ලාම් ධර්මයෙහි පළමු සියවස් තුන තුළ, ඓතිහාසිකව අවබෝධ කරගෙන සකස් කරන ලද ඉස්ලාම් ධර්මයෙහි පොදු ප්‍රතියමාන පද්ධතිය" වේ. ෂාරියා* හුදෙක් නීතිමය මූලධර්මයන් හා සම්මතයන්ට, වඩා බොහෝ දේවල් වලට අදාළ වේ. එහෙත්, නෛතිකව යෙදිය හැකි විට එය නිතර *'ඉස්ලාමීය නීතිය'* ලෙස නම් කෙරේ. ඉස්ලාමීය නීතිය නෛතික අංග පුළුල් පරාසයක් ආවරණය කරන අතර, මුස්ලිම් පවුල්/පෞද්ගලික නීතිය ලොව වටා රටවල් 44 ක පමණ විවිධ මට්ටම් වලින් ක්‍රියාත්මක කෙරෙන ඉස්ලාමීය නීතියෙහි වඩාත් පොදු අංග අතරින් එකක් පමණි.

ද්විත්ව නීති පද්ධති ඇති රටවල *ෂරියා* පවුල් නීතියට අදාළ කරුණුවලට (එනම්, විවාහය, දික්කසාදය, රැකවරණය, නඩත්තු කිරීම, උරුමය) ප්‍රධාන වශයෙන් සීමා කිරීම, දහනව වන සියවසේ අග සහ විසිවන සියවසේ මුල් කාලයේ වර්ධනය වූවක් වන අතර, එය යටත් විජිත බලපෑම් නිසා සිදුවූවක් සේ සැළකිය හැක[1]. ශ්‍රී ලංකාව තුළද, යටත් විජිත යුගයෙන් ඉතිරි වූවක් ලෙස, 'දේශීය නීති' අඛණ්ඩව පවත්වාගෙන යාම සැළකිය හැක. සියළු පුරවැසියන් හට පොදුවේ අදාළ වන පොදු හා වඩා අනාගමික නීතියට සමාන්තරව යන, විශේෂිත ප්‍රජාවක් සඳහා පමණක් අදාළ වන පෞද්ගලික නීතිය මෙයට ඇතුළත් වේ. විශේෂිත වශයෙන් විවාහය සහ දික්කසාදයට අදාළව (සාමාන්‍ය) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණතට අමතරව, මුස්ලිම් සහ උඩරට සිංහල ප්‍රජාවන් සඳහා පෞද්ගලික නීති පැවතීම, මෙහි ප්‍රතිඵලයක් වේ.

1907 ශ්‍රී ලාංකීය (සාමාන්‍ය) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත[2] සිය ඇදහිල්ල තුළ විවාහ වන මුස්ලිම්වරුන්ට හැර, රටෙහි සියළු පුරවැසියන් හට අදාළ වේ[3]. උඩරට සිංහල සහ ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් හට විවාහය සහ දික්කසාදය සඳහා වෙනම පනත් ඇත. මේවා උඩරට සිංහලයින් සඳහා (භූගෝලීය සුදුසුකමක් සමග)ජනවාර්ගිකත්වය මතද, සහ මුස්ලිම්වරුන් සඳහා ආගම මතද, පදනම්ව ඇත. උඩරට සිංහලයින් හට 1952 උඩරට විවාහ සහ දික්කසාද පණත යටතේ මෙන්ම, සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වීමේ විකල්පය ඇත. කෙසේවෙතත්, මෙම විකල්පය මුස්ලිම්වරුන්ට ලබාදී නොමැත. "මුස්ලිම්වරු වන ශ්‍රී ලාංකීය වැසියන්" සහ වෙනත් මුස්ලිම් ජාතිකයෙකු සමග විවාහ වන්නන් (ඉස්ලාම් ධර්මය වැළඳ ගන්නන් ඇතුළත්ව) පාලනය වන්නේ 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙනි. කෙසේවෙතත් මුස්ලිම්වරුන් හට අන් ආගම් හෝ ජාතින් වලට අයත් අයෙක් සමග විවාහ වීමේදී (ඉස්ලාම් ධර්මය වැළඳ නොගන්නන්) සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වීමේ හැකිය.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි සම්භවය වන්නේ 1770 ලන්දේසි නීතිය සමයේ බතාවියා (වර්තමාන ඉන්දුනීසියාව) රටෙන් අපනයනය කරනලද විවාහය සහ දික්කසාදය පිළිබඳ නීති සංග්‍රහයකිනි. වසර 1806 සහ 1951 අතර, මෙම නීති සංග්‍රහය, සංග්‍රහගත කිරීම, සමාලෝචනය සහ සංශෝධන ක්‍රියාවලියකට යටත් විය. එකළ සිටි ප්‍රසිද්ධ නෛතික සහ ආගමික පුද්ගලයින් කිහිපදෙනෙක් මෙම සෑම අවස්ථාවකදීම එයට නායකත්වය ලබාදුන්හ[4]. වර්තමාන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත 1951 වසරේදී නීතිගත කෙරුණු අතර, මීට පෙර තිබූ නියෝග සහ සංග්‍රහයන්වල තිබූ ප්‍රතිපාදන සැළකිය යුතු තරම් අන්තර්ගත වේ. මෙයට එවකට සිටි ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් අනුගමනය කළ *කයිකූලි* (දෑවැද්ද) වැනි ඉස්ලාමීය නෛතික භාවිතයන් සහ දේශීය චාරිත්‍ර වාරිත්‍ර මත පදනම් වූ අමතර ප්‍රතිපාදන ද ඇතුළත් විය[5].

---

1 Ed. Abd Allāh Ahmad Na'īm, 2002, *'Islamic Family Law in A Changing World: A Global Resource Book'*. Law and Religious Program Emory University, USA

2 The Sri Lankan General Marriage Registration Ordinance, No 19 of 1908

3 Long title of the General Marriage Registration Ordinance No 19 of 1908

4 Ed. Zackariya F, Kodikara C, 2014 . *'Women Claiming Rights and Spaces: Activism to Reform Muslim Personal Law in Sri Lanka.'* Muslim Women's Research and Action Forum (MWRAF), Colombo, Sri Lanka

5 Kodikara, Chulani 1999. '*Muslim Family Law in Sri Lanka: Theory, Practice and Issues of Concern to Women*'. Muslim Women's Research and Action Forum (MWRAF)/Women Living Under Muslim Law (WLUML).

## මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි පරිපාලනය

ශ්‍රී ලංකාවේ පුද්ගලයින් මිලියන 20.3 ක් වන මුළු ජනගහනයෙන් මුස්ලිම් ජනතාව 9.66% ක්[6] හෝ මිලියන 1,967,523 ක්[7] (1,011,819 ක් කාන්තාවෝ සහ ගැහැණු දරුවෝ) සිටිති. වැඩිපුරම මුස්ලිම් ජනතාව වාසය කරන්නේ පිළිවෙලින් අම්පාර, කොළඹ, මහනුවර, ත්‍රිකුණාමලය, පුත්තලම සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලය[8]. 'මුස්ලිම් ප්‍රජාව' නිතර එය හඳුන්වන පරිදි, ජනවාර්ගික සම්භවය මත පදනම්ව විවිධ හා බොහෝ වෙනස්වූ සුළු ජාතික ප්‍රජාවන්ගෙන් සමන්විත වේ. මෙයට ශ්‍රී ලංකා මුවර්, වෙරළබඩ ඉන්දීය මුවර්, මැලේ, බෝරා (ඩාවුඩි බෝරා ඇතුළුව)[9] සහ මෙමන් වරු ඇතුලත් වේ. මෙම ප්‍රජාවට සුන්නි (බහුතරයක් ලෙස) සහ ෂියා යන ප්‍රධාන නිකාය දෙකෙහි සාමාජිකයෝද ඇතුළත් වෙති.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත කාතිවරුන්ගේ මණ්ඩලයක්[10] සහ උපදේශක මණ්ඩලයක් ඇතුළුව කාති (මුස්ලිම් විනිසුරු) වරුන්ගේ අධිකරණ පද්ධතියක් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකාව තුළ එක් කාතිවරයෙක් සහිත ආසන්නව මිලියන දෙකක මුස්ලිම් ජනතාවට සේවය සපයන කාති අධිකරණ 65 ක් පවතියි. බොහෝ කාතිවරුන් හට භූගෝලීයව අධිකරණ බලය ඇති නමුත් බෝරා සහ මෙමන් ප්‍රජාවන් සඳහා සිටින කාතිවරුන් වැනි සමහර කාතිවරුන්හට ප්‍රජා සාමාජිකයින් ජීවත්වන ප්‍රදේශ නොතකා දිවයින පුරා අධිකරණ බලය ඇත.

කාති මණ්ඩලය සාමාජිකයින් 5 දෙනෙකුගෙන්[11] සමන්විත වේ. එයට පැවරී ඇති කාර්යයන් වන්නේ, කාති අධිකරණ තීන්දු හෝ නඩු කටයුතු වලින් පැන නඟින අභියාචනා අධීක්ෂණය කිරීම, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත පරිපාලනයට සම්බන්ධව හෝ ඇතිකරන කුමන හෝ රෙගුලාසිවලට සම්බන්ධව පැන නැඟිය හැකි මුස්ලිම් නීතියෙහි ඕනෑම ප්‍රශ්නයක් ගැන පැහැදිලි කිරීම් සැපයීම වේ. කාති මණ්ඩලයෙහි නඩු විභාග කොළඹ සහ කල්මුණේ පමණක් පැවැත්වේ. නඩු විභාග නිරාකරණය නොකිරීමේ හේතුවෙන් හෝ කාති මණ්ඩලයේ තීරණ ගැන අදාළ පක්ෂ අගතියට පත්වේ නම්, අභියාචනා අධිකරණයේ අභියාචනයක් ඉදිරිපත් කෙරේ. තවද, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අනුව, නඩත්තු ගෙවීම පැහැර හැරීම ගැන බලාත්මක කිරීමේ නියෝග පැනවීමට මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය ඇත. ළමා රැකවරණය සහ දෑවැද්දට (*මහර්* සහ *කයිකූලි*) අදාළ හිමිකම් සඳහා හිඟ මුදල් අයකිරීම පිළිබඳව අධිකරණ බලය දිස්ත්‍රික් උසාවිය හට ඇත.

කාතිවරුන් පත්කිරීමෙහි වරය අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර, ඔවුන් "යහපත් චරිත සහ යම් සුදුසුකමක් ලබාගෙන ඇති පිරිමි මුස්ලිම්වරුන්"[12], විය හැකිය. එමෙන්ම, කාතිවරුන්ගේ සහ කාති මණ්ඩලයේ සාමාජිකයින්ගේ සේවාවන් අවසාන කිරීම් සහ ස්ථාන මාරුකිරීම් වල කර්තව්‍යයන්ද පැවරී ඇත . එසේ අධිකරණ කොමිෂන් සභාවට කාතිවරුන් පිළිබඳ පැමිණිලි ගැන පියවර ගැනීමේ කාර්යය පැවරී ඇති නමුත්, එයට වරය ඇත්තේ පැමිණිලි ගැන විමසා බැලීමට සහ විමර්ශනයෙහි ප්‍රතිඵල මත සේවය අවසන් කිරීම/ස්ථාන මාරු ලබාදීමට පමණි.

---

6 Of the total Muslim population 51.4% are female and 48.6% are male.

7 Census of Population and Housing 2012 – Department of Census and Statistics Department of Census and Statistics http://www.statistics.gov.lk/

8 Census of Population and Housing 2012 – Department of Census and Statistics http://www.statistics.gov.lk/

9 Nuhuman, M.A, 2007, *Sri Lankan Muslims: Ethnic Identity within Cultural Diversity*. Colombo: International Centre for Ethnic Studies.

10 Also referred to as 'qadi', 'qazi' or 'kazi'.

11 Section 15 of the 1951 Muslim Marriage and Divorce Act (MMDA)

12 According to the JSC Quazis are chosen based on 4 attainments: they are either lawyers, Moulvis or Alim (religious scholar), retired public officer in the staff grade, and/or a graduate.

### මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි උපදේශක මඬුල්ල ගැන සටහනක්

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 4 වැනි වගන්තියෙන් සාමාජිකයින් සතරක සිට නවය දක්වා ඇති මුස්ලිම් විවාහ සහ දික්කසාද උපදේශක මඬුල්ලක් ස්ථාපිත කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇති නමුත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ ආගම විශේෂිතව සඳහන් කර නැත. රෙජිස්ට්‍රාර් ජෙනරාල් මඬුල්ලෙහි සභාපති වන අතර, සෑම සාමාජිකයෙකුටම වසර තුනක් දක්වා තනතුර හෙබවිය හැක. මඬුල්ලෙහි කාර්යය වන්නේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත පරිපාලනයට සම්බන්ධ සියළු ගැටළු පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල් හට උපදෙස් ලබාදීමය. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් වරයක් ලබාදී තිබියදීත්, පණත සම්මත වී වසර 65 ක් තුළ, කිසිදාක උපදේශක මඬුල්ලක් පත්කර නොමැත. උපදේශක මඬුල්ලට, සුදුසුකම් ඇති කාන්තාවන් සහ මුස්ලිම් නොවන අය ඇතුළත් කළ හැකි ලෙස මෙම විධිවිධානය කියවිය හැකිවීම, මෙයට ආසන්න හේතුවක් විය හැක.

පණතෙහි ක්‍රියා පටිපාටියෙහි නොගැළපීම් සහ උල්ලංඝනය කිරීම් ගැන කාති අධිකරණ පද්ධතිය නියාමන කිරීමේ විභවය ක්‍රියාකාරී මඬුල්ලක් වෙත පවතී. මෙම මඬුල්ලෙහි කාන්තා සාමාජිකයන් හට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ කාන්තාවන් මුහුණ දෙන ගැටළු ඉස්මතු කිරීමටද, පණතෙහි රාමුව තුල හෝ අවශ්‍ය වුවහොත් ඉන් ඔබ්බට තිබිය හැකි උපක්‍රම ගැනද සාකච්ඡා සඳහා පහසුකම් සැළසිය හැක. එහි පවතින තත්ත්වය තුළ වුවද, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන විශේෂඥ දැනුම හා ඇත්දැකීම් ඇති සහ රෙජිස්ට්‍රාර් ජෙනරල් හට අදාළ කරුණු ගැන උපදෙස් දිය හැකි, සුදුසුකම් ඇති පුද්ගලයින් මෙම උපදේශක මඬුල්ලට පත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. උපදේශක මඬුල්ල තුළ සියයට 50 ක් වත් කාන්තාවන්ගෙන් සමන්විත වීම පූර්ව අවශ්‍යතාවක් කළ යුතුය.

## මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ කාන්තාවන් සහ ගැහැණු දරුවන් මුහුණදෙන ගැටළු

කාන්තාවන් සහ ගැහැණු ළමුන් මුහුණදෙන ගැටළුවල ස්වභාවය සහ ප්‍රමාණය ගැන ගැඹුරු අවබෝධයක් ලබාදෙන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතේ උචිත අංශ සමහරක් පහත සඳහන් කෙරේ.

### 1. විවාහ වීමට අවම වයසක් නොමැතිකම

**ප්‍රතිපාදන:** වසර 1995 දී සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණතෙහි සංශෝධනයකින් මෙම ආඥා පණත යටතේ විවාහ වන දෙපාර්ශවයටම විවාහ වනවිට, වයස අවුරුදු 18 ක් වත් වීම අවශ්‍ය වුවත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මුස්ලිම් විවාහ සඳහා අවම වයසක් නියම කිරීමට අසමත්ව ඇත. එබැවින්, වත්මන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් මතුවන ප්‍රාථමික සහ සැළකිල්ලට ගත යුතු කරුණක් වන්නේ, එය ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් සඳහා ළමා විවාහ වලට නිත්‍යානුකූලව ඉඩදෙන බවයි.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 23 වන වගන්තිය කාතිවරයෙකුගේ පූර්ව විමර්ශනයක් සහ බලය දීමකින් තොරව වයස අවුරුදු 12 ට අඩු මුස්ලිම් ගැහැණු ළමයින්ගේ විවාහ සීමා කිරීමට ප්‍රතිපාදන සපයා ඇතත්, එවැනි විවාහයන් අනුමැතියකින් තොරව චාරිත්‍රානුකූලව සිදුකිරීම තවමත් වලංගු ලෙස සැළකේ[13]. මෙම ප්‍රතිපාදනයට අනුකූල නොවීම සාපරාධී අපරාධයක් වුවත්, දඬුවම් අප්‍රමාණ වන අතර එහි ප්‍රතිඵලය වී ඇත්තේ "රුපියල් සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස හයක් නොඉක්මවන සිර දඬුවමක් හෝ මේ දෙකමය"[14].

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයට අනුව,[15] කැමැත්තෙන් හෝ කැමැත්තකින් තොරව වයස අවුරුදු 16 කට අඩු ගැහැණු ළමයෙකු සමග ලිංගික සංසර්ගයේ යෙදීම ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් ලෙස සැළකේ. කෙසේවෙතත්,

---

13 Section 16 of the 1951 Muslim Marriage and Divorce Act (MMDA) indicates that non-registration of marriages does not render the marriage null and void "according to the Muslim law governing the sect to which the parties…belong".

14 Section 82 of the 1951 Muslim Marriage and Divorce Act (MMDA).

15 Section 363 of the Penal Code of Sri Lanka.

1995 වසරේදී ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ ප්‍රතිපාදන ඇතුළත් කිරීමට දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන අවස්ථාවේදී, ප්‍රධාන වශයෙන් මුස්ලිම් ආගමික නායකයින් සහ දේශපාලනඥයින්ගේ පසුබෑමෙන් සිදුවූයේ අධිකරණය හරහා වෙන්වී ඇතොත් මිස, වයස අවුරුදු 16 ට අඩු සහ වයස අවුරුදු 12 ට වැඩි විවාහක මුස්ලිම් ගැහැණු ළමයින් හට මෙම ප්‍රතිපාදනය අදාළ නොවීමයි.[16] එහි ප්‍රතිඵලයක් ලෙස, මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ සඳහා අදාළ වයස අවුරුදු 12 වේ[17]. තවද, *තලාක්*[18] දික්කසාදයක දී (සැමියා විසින් මුල්පුරන දික්කසාදයක දී) නීති මාර්ගයෙන් වෙන්වීම සඳහා ප්‍රතිපාදන නොමැති බැවින්, දික්කසාදය ප්‍රථම වරට ප්‍රකාශ කළ පසු මාස තුනක් දක්වා කාලයක් (*ඉද්දා* කාලය) බිරිඳ සැමියාගේ නිවසෙහි රැඳීසිටීම අවශ්‍ය වේ. මේ කාලය තුළදී බලහත්කාරයෙන් ලිංගික සංසර්ගය (වෛවාහක ස්ත්‍රී දූෂණය) සිදුවුවත්, දණ්ඩ නීති සංග්‍රහයෙහි ප්‍රතිපාදන මගින් කාන්තාවන් ආරක්ෂා කර නොමැත.

**ගැටළු සහ ප්‍රතිවිපාක:** සාහිත්‍ය විමර්ශනයේදී, පුළුල් ලේඛනගත කිරීම් වලින් බොහෝ මුස්ලිම් ගැහැණු ළමුන් සහ කාන්තාවන්ගේ අවාසනාවන්ත තත්ත්වය මත මෙම ප්‍රතිපාදනවල බලපෑම ඉස්මතු කෙරුණි[19]. හරිහැටි තොරතුරු නොදන්නා අය බාල වයස්කාර විවාහයේ ගැටළුව හුදෙකලා සිද්ධි කිහිපයක් ලෙස හෝ, මෙවැනි සියළුම සිද්ධීන් සිදුවන විට ඒවා නියත වශයෙන් ගැහැණු ළමුන් ප්‍රේම සම්බන්ධ පවත්වාගෙන ගිය අවස්ථාවලදී සිදුවූවන් යැයි ඉවත දමති. යථාර්ථය වන්නේ ප්‍රජා මට්ටමේ කටයුතු කරන කාන්තා සංවිධානවල මෙන්ම කාති අධිකරණයේ අවධානයට යොමුවෙන සිද්ධීන් බොහෝ විට බාල වයස්කාර විවාහ සිදුවූ අවස්ථා බව පෙන්වා ඇත. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හරහා එක්රැස් කරගත් තොරතුරු අනුව, පුත්තලම සහ මඩකළපුව වැනි දිස්ත්‍රික්කවල, භාරකරුවන් විසින් සැළසුම් කරන විවාහ වයස අවුරුදු 14 ත් 17 ත් අතර සිදුවේ. කාත්තන්කුඩි හි මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ වාර්තා වලින් හෙළිවූයේ 2015 වසර තුළ ලියාපදිංචි කළ සියළු විවාහ වලින් 22% ක් වයස අවුරුදු 18 ට අඩු මනාලියක් සමග සිදුවූ බවයි. මෙය 2014 වසරේ පැවති 14% ප්‍රතිශතයට වඩා සැළකිය යුතු වැඩිවීමකි. නැගෙනහිර කොළඹ කාති විනිසුරුවරයාට අනුව, මට්ටක්කුලිය සහ මරදාන වැනි පෙදෙස්වල බාල වයස්කාර විවාහ සිදුවන බොහෝ අවස්ථා ඇත. කොළඹ සුළුතර මුස්ලිම් ප්‍රජාව සඳහා සිටින කාති විනිසුරුවරයාද පැවසුවේ ඔහුගේ අදහස අනුව ප්‍රජාවේ ගැහැණු දරුවන් බොහෝ සේ වයස අවුරුදු 15 ත් 17 ත් අතර විවාහ වන්නේ "ගැහැණු ලමයෙකුගේ වටිනාකම ඇයගේ වයස අවුරුදු 17න් පසු අඩුවන නිසාය".

ඉදිරිපත් කල තවත් තර්කයක් වුයේ, විවාහ කර දෙන ගැහැණු ළමයි භාරකරුවන් විසින "පරිණත" සහ විවාහ ජීවිතය සඳහා හැකියාව පවතින ලෙස සළකන බවයි. කෙසේවෙතත්, මෙම තර්කය ප්‍රබල ලෙස ගැටළු සහගත වන්නේ, එය පූර්ණ ළමාවියත්, අධ්‍යාපනයට ඇති අයිතිය, ශාරීරික පරිණත බව සහ විවාහයට සහ ලිංගික සංසර්ගයට සිය නිදහස් කැමැත්ත දීමට ඇති හැකියාව (දණ්ඩ නීති සංග්‍රහයෙන් නිර්ණය කර ඇති සහ සියළු පුරවැසියන්ටම එකම වයසක් විය යුතු බවට නිර්ණය කර ඇති) සහතික නොකරන බැවිනි. නැගෙනහිර පළාතේ සිදුවූ විශේෂිත සිද්ධියක, ඔවුන් වයස අවුරුදු 15 ක් වූ Down syndrome සහිත සහ බාල වයස් දැරියකගේ පරිණත බවින් යුත් ගැහැණු ළමයෙක් වයස අවුරුදු 20 ක් පමණ වූ පිරිමියෙකුට විවාහ කර දෙන ලදී. විවාහය සිදුවී මාස තුනකට පසු එම පිරිමියා ගැහැණු ළමයාව අත්හැර දමන ලදී.

බලපෑමට ලක්වූ කාන්තාවන්ට සහාය වන කාන්තා ස්වේච්ඡා සේවකයින්ට අනුව, සැමියන් බාල වයස්කාර භාර්යාවන්ගෙන් දික්කසාද වීමට සෙවීමට ප්‍රධාන හේතූන්ගෙන් එකක් වන්නේ ඔවුන් "ලිංගික සම්බන්ධතා පැවැත්වීමට නුසුදුසු" සහ "ගෙදරදොරේ වැඩ කිරීමට නොහැකි" වීමය. දික්කසාද වන තරුණ ගැහැණු ළමයින්ගේ තත්ත්වය අස්ථිර බවට පත්වේ. නියමිත කලට පෙර විවාහ වන තරුණ කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය බොහෝ විට නවත්වා දැමේ[20]. මේ මගින් ඔවුන් හට ඔවුන්ගේ උසස් අධ්‍යාපනික සහ ආර්ථික අවස්ථා සැළකිය යුතු අන්දමින් සීමාවේ. මෙහිදී ඔවුනට නඩත්තු සැපයීමට සැමියන්

---

16 In 1995 after extensive lobby by civil society organizations including women and child rights groups, the Penal Code (Section 363) was amended for statutory rape to mean sexual intercourse with any girl below the age of 12, with or without her consent *"...unless the woman is his wife who is over twelve years and not judicially separated from the man*", thereby applicable only to Muslim girls.

17 UNICEF Sri Lanka, July 2013, 'Emerging Concerns and Case Studies on Child Marriage in Sri Lanka' http://www.unicef.org/srilanka/2013_Child_Marriage_Case_Studies.pdf

18 Divorce initiated by husband.

19 A 2015 study was conducted by FOKUS Women in collaboration with the Muslim Women's Development Trust (MWDT) in Puttalam involving 1000 Muslim female heads of household on their access to economic, social and cultural rights. The study found that 42% of respondents had been married below the age of 18 for reasons primarily to do with family tradition and customs (55%) and economic reasons including protection and security (23%). The study also showed a significant difference in the educational attainment of girls who were married before 18 years and those married after 18 years. The majority of respondents who married before 18 years had only studied up to grades 1 – 5. (Source: *FOKUS Women: Survey on Status of Muslim Female Heads of Household and their Access to Economic, Social and Cultural Rights in Puttalam District 2015)*

20 Case 11 – Source: Gul, Begum Safana, 2014. *'Is Equal Justice Possible',* Islamic Women's Association for Research and Empowerment (IWARE), Batticaloa, Sri Lanka

හට හැකියාවක් නොමැති හෝ අකමැති වූ විට, සැමියන් මියයාම, බහු භාර්යා සේවනය, දික්කසාදය හෝ අත්හැර දැමීම වැනි අවස්ථාවලදී ඔවුහු ප්‍රබල මූල්‍ය අපහසුතාවන්ට ලක්වීමට ඉඩ ප්‍රස්තා සලසයි.
ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනක නව යොවුන් වියේ (Teenage) ගැබ් ගැනීම්වල ප්‍රමාණය, නැඹුරුතාවන් සහ නිර්ණායකයන් යන එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලෙහි 2011 වාර්තාවෙහි දත්ත වලින් හෙළි වූයේ, " කාන්තාවන්ගේ හෝ සහකරුගේ මුස්ලිම් ජනවාර්ගිකත්වය මුස්ලිම් සහ/හෝ ඉස්ලාමීය ධර්මය අනුගමනය කරන්නන් වූ විට, නව යොවුන් වියේ ගැබ් ගැනීම් සඳහා අවදානම වැඩිවූ බවයි[21]". තරුණ වයසේදී විවාහ වන ගැහැණු ළමුන්ද, ශාරීරික පරිණත බව සහ ලිංගික ප්‍රජනක තෝරාගැනීම් සහ උත්පත්ති පාලනය ගැන තීරණ ගැනීම නැතිවීමේ හේතුවෙන් ප්‍රජනක සහ මාතෘක සෞඛ්‍ය ගැටළුවල වැඩි අවදානමකට මුහුණදෙති. තවද ඔවුහු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ බලහත්කාර ලිංගික සංසර්ගය (වෛවාහක ස්ත්‍රී දූෂණය) ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක කරගත් ප්‍රචණ්ඩත්වයෙහි වැඩි අවදානමකට ලක්වෙති [22].

## සියළු පුරවැසියන් සඳහා විවාහ වීමේ සම්මත අවම වයස

සිද්ධීන් සංඛ්‍යාව කෙසේ වුවද එනම් හුදෙකලාවුවත්, බහුල වුවත් ළමා විවාහ පිළිගත නොහැකි අතර , මුස්ලිම් ප්‍රජාව සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් ලබාදී නෛතික ආවරණය ඉවත් කිරීමෙන් එය ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වේ.

ළමා විවාහ බොහෝ සමාජ-ආර්ථික සහ සංස්කෘතික හේතූන් නිසා සිදු වන අතර, අනෙකුත් ප්‍රජාවන් තුළද බාල වයස්වල කෙරෙන සහවාසය වැනි දේ හරහා බහුලව පවතී. නමුත් ප්‍රධානතම වෙනස වන්නේ, මුස්ලිම් ප්‍රජාව තුළ මෙය නීත්‍යානුකූල වීම සහ රජය මේ පිළිබඳව කිසිම පියවරක් නොගැනීමය. එහෙත්, අනෙකුත් ප්‍රජාවන් තුල රාජ්‍ය ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජය ළමුන්ගේ යහපත තකා මෙම භාවිතය තුරන් කිරීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන අතර, එය එසේම වීම නිවැරදිය. ඇත්ත වශයෙන් කියතොත්, රාජ්‍ය ක්‍රියාකාරීන් විසින් ළමා විවාහ (බාල වයස් සහවාසය) සහ නව යොවුන් වියේ ගැබ් ගැනීම් ගැන ජාතික මට්ටමේ සාකච්ඡා වලදී, මුස්ලිම් ප්‍රජාව අත්හැර දමන්නේ ගැටළුව "සංකීර්ණ වැඩිය" යන ව්‍යාජ හේතුව මතය.

මුස්ලිම්වරුන් සඳහා විවාහ වීමේ අවම වයසක් පිහිටුවීමට පක්ෂ නොවන අය, ඇමෙරිකා එක්සත් ජනපදයේ ළමා විවාහ සඳහා අඩු අවම වයසක් පවතින සමහර ප්‍රාන්තවල උදාහරණය ගෙන හැර දක්වන්නේ, ළමා අයිතීන් ගැන "බටහිර කුහකකම" හුවාදැක්වීමේ ප්‍රයත්නයක් ලෙසය. කෙසේවෙතත්, ඇල්ජීරියාව, ජෝර්දානය, මොරොක්කෝව, ටියුනීසියාව, තුර්කිය සහ ලෙබනනය වැනි මුස්ලිම් බහුතරයක් සිටින රටවල් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට එකඟවෙමින් විවාහ වීමේ අවම වයසක් පිහිටුවා ඇති බව, සමාන ස්වරූපයකින් කිසිදිනක සැළකිල්ලට ගන්නේ නැත.

එමෙන්ම, මුස්ලිම් දේශපාලඥයින්[23], ආගමික නායකයින් මෙන්ම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණවලට සහයෝගය දක්වන සමහර පුද්ගලයින් සහ සංවිධාන විශ්වාස කරන්නේ, මුස්ලිම්වරුන් සඳහා විවාහ වීමේ අවම වයස මුස්ලිම් ප්‍රජාව තුළින් තීරණය කර මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මගින් තහවුරු කළ යුතු බවයි. කෙසේවෙතත්, විවාහ වීමේ අවම වයස මුස්ලිම් ප්‍රජාව තුළම වුවද වාදයට ලක්ව ඇති මාතෘකාවකි. එමෙන්ම එය තදින් විෂයබද්ධ, අවම වයසක් පිහිටුවීමට සහයෝගය හෝ විරුද්ධත්වය දක්වන විවිධ පාර්ශ්වයන්ගේ ආගමික මතවාද පිළිබඳ දෘෂ්ටිකෝණය මත රඳා පවතින්නකි. එබැවින්, පවතින සන්දර්භය තුළ, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව තුළ සියළු පාර්ශ්වයන් පහත සඳහන් කරුණු දෙක ගැන එකඟවී සම්මුතියකට එළඹේ යැයි සිතිය නොහැක. 1) විවාහ වීමේ අවම වයස 18 ට දැක්වා ඉහළ දැමීම සහ 2) සියළුම පුරවැසියන් සඳහා විවාහ වීම් අවම වයස රජය විසින් නියම කළ යුතු බව තීරණය කිරීම, මේ කරුණු දෙක වේ.

ශ්‍රී ලංකා රජය විසින් සියළු පුරවැසියන් හට ඔහුගේ/ඇයගේ සංස්කෘතිය, සම්ප්‍රදායයන් සහ ආගමික නිදහස භුක්තිවිඳීමට ඇති අයිතීන් පිළිගෙන ආරක්ෂා කිරීම වැදගත් වේ. කෙසේවෙතත්, විවාහවීමේ අවම වයසක් පිහිටුවීම වැනි ප්‍රතිපාදන වලදී - සංස්කෘතිය සහ ආගමෙහි නාමයෙන් ළමා අයිතීන් සම්මුතිවලට ලක්නොකිරීම සහතික කිරීම රජයේ වගකීමකි.

[21] UNFPA, 2012. '*Extent, Trends and Determinants of Teenage Pregnancies in Three Districts of Sri Lanka'* http://srilanka.unfpa.org/publications/extent-trends-and-determinants-teenage-pregnancies-three-districts-sri-lanka

[22] Global data indicate that girls who conceive before the age of 15 are 5 times more likely to die in childbirth. Source: Girls Not Brides http://www.girlsnotbrides.org/what-is-the-impact/

[23] See comments made by Minister Rauff Hakeem in March 2015 http://www.sonakar.com/?p=80151

ශ්‍රී ලංකාව වෙනත් ජාත්‍යන්තර මානව හිමිකම් මෙවලම් අතර ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය[24] ට සහ කාන්තාවන්ට එරෙහි සියළු ආකාර වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතියට පාර්ශ්වකරුවෙක් වන බැවින්, ළමා අයිතීන් සහ කාන්තාවන්ගේ අයිතීන් ගැන ගෝලීය මිනුම්දඬු පිළිපැදීම අවශ්‍යය. ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය වයස අවුරුදු 18 ට අඩු ඕනෑම කෙනෙක් ළමුන් ලෙස පිළිගන්නා අතර, ආගම, ජනවාර්ගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජවාදය ඇතුළුව කිසිම පදනමක් මත කිසිම ළමයෙකු හට අසාධාරණ ලෙස නොසැළකිය යුතු බව 2 වන වගන්තිය පැහැදිලිවම ප්‍රකාශ කරයි. මෙම සම්මුතියෙහි 19 වන වගන්තිය ළමයින් හට "තුවාල කිරීමෙන් සහ ශාරීරිකව හෝ මානසිකව නරක අන්දමින් සැළකීමෙන්" ඇතුළු වූ සියළු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් ළමුන් ආරක්ෂා කළ යුතු බව ප්‍රකාශ කරයි.

කාන්තාවන්ට එරෙහි සියළු අකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතියට අනුව, බාලවයස්කාර සහ බලහත්කාර විවාහය යනු, රජය විසින් අඩුකර ගැනීමට සහ තුරන් කිරීමට බරපතල පියවර ගත යුතු "හානිකර භාවිතයක්" ලෙස සැළකේ. පුරවැසියන් හට ඡන්දය ප්‍රකාශ කිරීම පිණිස දැනුවත් තීරණයක් ගැනීමට යම් වයසක සිටිය යුතු බවට ප්‍රතිපාදන නියම කරන්නේ රජය විසින් නම්, අදාළ පුද්ගලයින් සහ සමස්ථයක් ලෙස ගත් කළ රටටම බලපෑමේ ප්‍රතිවිපාක පවතින විවාහ වීමේ අවම වයසටද එම තර්කයම අදාළ වේ. වයස අවුරුදු 18 ට පෙර, නව යොවුන් වියේ සිටින්නන් සහ ළමුන් විවාහ වීම, ඔවුන්ගේ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යහපැවැත්මට විපත්තිකාරී බව රජය නිර්ණය කරන්නේ නම්, ඔවුන් අයත්වන්නේ කුමන ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමටද යන්න නොතකා, රටෙහි සියළු ළමුන්ට එය අදාළ විය යුතුය.

**ඉල්ලීම: ආගම හෝ ජනවාර්ගිකත්වය නොතකා ශ්‍රී ලංකාව විසින් සියළු පුරවැසියන් සඳහා විවාහ වීමේ අවම වයස අවුරුදු 18 ලෙස සහතික කිරීම අවශ්‍ය වේ. තවද, ඉස්ලාමීය නෛතික නීති මීමංසාව ( jurisprudence) විශේෂ වයසක් නියම නොකරන්නේ නම් සහ, සමහර විශාරදයින් වුවද යම් වයස් සීමාවක් නියම කිරීම අවසර දිය නොහැකි දෙයක් ලෙස සළකන නිසාද, සියළුම අනෙකුත් පුරවැසියන් සඳහා කරන්නාක් මෙන්, විවාහ වීමේ අවම වයස නියම කිරීම පිළිබඳ වගකීම රජය විසින් භාරගැනීම අත්‍යවශ්‍ය ලෙසින්ම කළ යුත්තකි. මේ මගින් මෙම ප්‍රතිපාදනය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි අධිකරණ බලයෙන් ඉවත් කිරීමද (එය සන්දර්භය මත සහ/හෝ පුද්ගලයින්ගේ අත්තනෝමතික තීරණය ගැනීම මත පදනම්ව සමාලෝචනයට සහ ප්‍රතිසංස්කරණයට යටතේ වන්නකි), රජය විසින් නියම කර ඇති වයස යෙදීම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මගින් පිළිබිඹු කරන බව සහතික කිරීමද, අවශ්‍ය කරයි.**

## 2. මුස්ලිම් මනාලියන් සඳහා ස්වාධීනත්වය සහ තීරණ ගැනීම නොමැතිවීම

**ප්‍රතිපාදන:** විශේෂයෙන් සුන්නි මුස්ලිම්වරුන් සඳහා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මගින් විවාහයේදී මනාලියගේ කැමැත්ත පූර්ව අවශ්‍යතාවයක් ලෙස නියෝග නොකරයි. පණතට අනුව මනාලියගේ *වලි* (ළඟම පිරිමි භාරකරු)[25] හට මනාලිය විවාහ කරදීමට අයිතිය ඇත. මනාලිය හට *වලි* කෙනෙක් නොමැති අවස්ථාවලදී කාතිවරයා විසින් විවාහය සඳහා බලය පැවරීමට නියෝගයක් නිකුත් කිරීම අවශ්‍ය වේ[26]. කාන්තාවන් හට සමාන පාර්ශ්වයක් ලෙස විවාහයට කැමැත්ත දීමට සහ නිල විවාහ ලේඛන අත්සන් කිරීමට පැහැදිළි ප්‍රතිපාදන සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණතෙහි ඇත. කෙසේවෙතත්, මුස්ලිම් විවාහයක් සඳහා අවශ්‍ය වන ලියකියවිලිවල මනාලියගේ අත්සන හෝ ඇඟිලි සළකුණ සඳහා ප්‍රතිපාදන නොමැත. මනාලියගේ පාර්ශ්වයෙන්, *නිකා* (විවාහ) උත්සවය සහ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නේ මනාලියගේ *වලි* විසින් කරන ප්‍රකාශයක් (සහ අත්සන) පමණි.

ඉස්ලාමීය නීතියෙහි කැමැත්තෙහි 'අවශ්‍යතා' ඇත්ත වශයෙන් විවිධ *මද්හබ්* අනුව වෙනස් වේ. '*මද්හබ්*' යනු සුන්නි '*ෆික්*' (ඉස්ලාමීය නීති මීමංසාව) තුළ ඇති චින්තනයකි (ගුරු කුලයකි). වර්තමානයේ ප්‍රධාන *මද්හබ්* සතරක් පවතී. මේවා 10 වෙනි ශත වර්ෂයේ පමණ ඉමාම්වරුන් සතර දෙනෙක් විසින් ගුරුකුල සතරක් පදනම් කරගෙන පිහිටුවන ලද ඒවාය. මේවාට: අබු හනීෆා (හනාෆි ගුරුකුලය), මලික් (මලිකි ගුරුකුලය), ෂාෆි'ඉ (ෂාෆි'ඉ ගුරුකුලය) අහ්මද් (හන්බාලි ගුරුකුලය) ඇතුළත් වේ.

---

24 Art 24 (3) of Child Rights Convention (CRC) refers to the obligation of a State Party to "take effective and appropriate measures to abolish traditional practices prejudicial to health." And the CRC General Comment on HIV/AIDS (GC No 3 para 11) recognizes that early marriage comes within the meaning of a "harmful traditional practice".

25 "*Wali* - In the context of marriage, a marriage guardian. Usually recognized by some Schools as the father or paternal grandfather who has authority to contract the marriage on behalf of the bride". (Source: Women Living Under Muslim Law 2006, *Knowing our Rights: Women, Family and Law in the Muslim World* http://www.mediterraneas.org/IMG/pdf/kor_2006_en.pdf)

26 MMDA Section 47(3) - In instances where the woman does not have a *wali* such as in the case of a female head of household with no male relatives,
or a convert to Islam, the male Quazi is required to make an order authorizing the marriage.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත පදනම් වී ඇති, ෂාෆි'ඉ *මද්හබ්* යටතේ, විවාහ වීම සඳහා මනාලියක් හට ඇගේ *වලි* ගේ අවසරය තිබිය යුතුය. හනාෆි *මද්හබ්* යටතේ, සිය *වලි* ගේ අවසරය නොමැතිව වැඩිහිටි (සහ සිහි බුද්ධියෙන් යුත්) කාන්තාවකගේ විවාහය, ඇය 'නිත්‍යානුකූලව සුදුසු' යැයි සැළකෙන තැනැත්තෙකු විවාහ කර ගන්නේ නම්, එය වලංගු ලෙස සැළකේ. කෙසේවෙතත්, මෙම ප්‍රතිපාදනය හෝ විකල්පය, හෝ *වලි* ගේ සාමාන්‍ය චාරිත්‍රානුකූල සිරිත ගැන නොදැනුවත් කමින් සිදුවන්නේ, අවස්ථා බහුතරයකදී මනාලිය හනාෆි, ෂාෆි'ඉ හෝ වෙනයම් *මද්හබ්* එකකින්ද යැයි හඳුනා ගැනීම ගැන නොසළකා හැර, ඇය වෙනුවෙන් අත්සන යෙදීම සහ කැමැත්ත දීම *වාලි* වෙතින් සිදුවීමයි[27].

ෂි'ආ නිකායෙහි ඩාවුඩි බෝරා ප්‍රජාව සඳහා මෙම සිරිත වෙනස්ය. මෙහිදී මනාලියගේ නිල කැමැත්ත තහවුරු කිරීමේ ක්‍රමයක් ලෙස ඇයට අත්සන් කිරීම සඳහා ප්‍රතිපාදන සපයා ඇති විවාහ ආකෘතියක් මෙම ප්‍රජාව සතුව පවතී.

**සිද්ධි අධ්‍යයනය: නැගෙනහිර පළාතේ වයස අවුරුදු 15 ක් වූ ගැහැණු ළමයෙකුට ඇගේ ගමේ පිරිමියෙකු විසින් ඔහු සමඟ විවාහ වන ලෙස නිරතුරුවම කරදර කරන ලදි. ඇය තවමත් පාසැල් යන නිසා, විවාහය ගැන උනන්දුවක් නොදක්වපු බැවින් ඇය දිගින් දිගටම එය ප්‍රතික්ෂේප කළාය. එක් දිනක ඇය තනිවම නිවසේ සිටියදී, මෙම පිරිමියා නිවසට ඇතුළු වී, ඇය ඇගේ ඇඳුම් මාරු කරන විට, ඇයට අතවර කිරීමට උත්සාහ කළේය. ඇය කෑගසන විට ඇයගේ පිහිටට පැමිණි අසල්වැසියෝ මෙම පිරිමියා නිදන කාමරයේ සිටිනු දුටුහ. ටික වේලාවකට පසු ඔවුන් ගැහැණු ළමයා සහ පිරිමියා දෙදෙනාම මුස්ලිම් දේවස්ථාන කමිටුව වෙත රැගෙන ගිය අතර, එම කමිටුව විසින් දැන් ඇයට 'නරක් නමක්' ඇති බැවින් කිසිවකුට ඇයව විවාහ කර ගැනීමට උවමනාවක් නැතැයි යන පදනම මත මෙම ගැහැණු දරුවාට එම පිරිමියා සමග විවාහ වන ලෙස බලකරන ලදි. ගැහැණු දරුවා මෙය ප්‍රතික්ෂේප කළත්, ඇයව බලහත්කාරයෙන් විවාහ කර දුන් අතර, ඇයගේ පවුලද එය මුස්ලිම් දේවස්ථානයේ කමිටුව විසින් නියෝග කරන ලද බැවින් විරුද්ධ නොවූහ. විවාහයෙන් පසු මෙම පිරිමියා ගැහැණු ළමයා සමග මාසයක් පමණක් සිට, පසුව ඇයව අත්හැර දැම්මේය. පාසැල් යාමද නතර කළ මෙම ගැහැණු ළමයා තනිවම ජීවත් වෙමින්, තම පවුලේ සහයෝගයද නොමැතිව පසුගිය වසර දෙක හමාර තුළ සිය ජීවිතය ගැට ගසා ගන්නීය.**

**ගැටළු සහ ප්‍රතිවිපාක:** මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ වැඩිහිටි මුස්ලිම් කාන්තාවන් හට ඔවුන්ගේම නිදහස් කැමැත්තෙන් විවාහයකට ඇතුල් විමට නොහැකි නිසාද, ඒ සඳහා පිරිමි භාරකරුවෙකුගේ අවසරය අවශ්‍ය වන නිසාද, ඔවුන්ට සැළකෙන්නේ බාල වයස්කරුවන් ලෙසය. *වාලි* සංකල්පය කාන්තාවන්ගේ පුද්ගලික සහ සමාන කර්තෘත්වය සහ කුටුම්බයට සම්බන්ධ කාරණා වලදී ඔවුන්ගේ ස්වාධීනත්වය සීමාකරයි. මෙම ප්‍රතිපාදන, විවාහය තුළ කාන්තාවන්ගේ තීරණ ගැනීමේ හැකියාව ඇගේ පවුලේ පිරිමින් සහ දීර්ඝ - ප්‍රජාව මගින් පාලනය කෙරේ යන පීතෘ මූලික සංකල්පය තුළ ශක්තිමත්ව පිහිටයි.

ඔවුන්ගේ නෛතික බලය අනිසිලෙස භාවිතා කරමින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට තරුණ වයසේදී පවා විවාහයට ඇතුල්වීමට බලකරන *වාලි* වරුන්ගේ ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස ගැහැණු දරුවන් බලහත්කාරයෙන් විවාහයට ඇතුළත් වූ අවස්ථා අධ්‍යයනය තුළින් සොයා ගැනිණි. මුලතිව් හි එක් තරුණ දික්කසාද වූ තැනැත්තියක් ඇගේ *වාලි* විසින් ඇයව වයස අවරුදු 14 දී බලහත්කාරයෙන් විවාහ කර දුන් බව පැවසීම මෙවැනි එක් සිද්ධියකි. ඇයට පවසා ඇත්තේ එය ඇයගේ නැන්දාගේ දියණියගේ විවාහ මංගල්‍යලය බවය. පළමුවන රාත්‍රියේදී ඇගේ (හිටපු) සැමියා සමග ඇයව කාමරයකට දමා දොරගුළු ලන තුරු ඇගේ විවාහය ගැන කිසිවක් ඇය දැන නොසිටියාය. මෙම අත්දැකීමෙන් ඇය දිගින් දිගටම ප්‍රබල ලෙස කම්පනයට පත්වන්නීය. එබැවින් ප්‍රායෝගිකව, මනාලියගේ කැමැත්ත සාක්ෂාත් කර ගැනීමට අනිවාර්ය ප්‍රතිපාදන නොමැතිකම මගින්, කාන්තාවන් හා ගැහැණු ළමයින් බලහත්කාරයෙන් විවාහ කර දීමට හෝ ඔවුන්ගේ අනුදැනුම ඇතුව හෝ නොමැතිව බලෙන් විවාහ කරදීමට ඇති අවස්ථා සැළකිය යුතු අන්දමින් වැඩිකරයි.

කාන්තාවන් හට ඔවුන්ගේ විවාහ ආකෘති අත්සන් කිරීමට නොහැකිවීමට හේතුව ලෙස රෙජිස්ට්‍රාර්වරු සහ කාතිවරුන් සාමාන්‍යයෙන් නිදහසට කරුණක් ලෙස ලබාදෙන්නේ, නිකා උත්සව ප්‍රධානව පවත්වන්නේ මුස්ලිම් දේවස්ථානවල බවත්, ඒවායින් බොහොමයකට කාන්තාවන් හට ඇති ප්‍රවේශය සීමාකාරී බවත්ය. කෙසේවෙතත්, ආගමික නායකයින්, රෙජිස්ට්‍රාර්වරුන් සහ පවුලේ සාමාජිකයින් මනාලියගේ කැමැත්තෙහි අත්සන ලබාගැනීම ගැන අවංකව සැළකිලිමත් වන්නේ නම්, එය මනා සංවිධානයට අදාළ කරුණක් පමණි. මෙහිදී බෝරා ප්‍රජාව

---

[27] Marsoof, Saleem 2012, *Muslim Matrimonial Law – Some Grey Areas* https://www.academia.edu/9905307/Muslim_Matrimonial_Law_-_Some_Gray_Areas

ඔවුන්ගේ නිකා උත්සව බොහෝමයක් නිවෙස් තුළ හෝ කාන්තා පිරිමි දෙපිරිසටම ප්‍රවේශය පවතින පුද්ගලික ස්ථානවල පවත්වන බවත්, පසුගිය වසර කිහිපය තුළම ප්‍රජාවේ රෙජිස්ට්‍රාර් විසින් "ඉස්ලාම් ධර්මයෙන් නියෝග කර (තහවුරු කර) ඇති" පරිදි මනාලියන්ද ඔවුන්ගේ විවාහ ලියාපදිංචි කිරීමේ ආකෘති වලට අත්සන් තැබිය යුතු බවට බලකරන බවත්, සඳහන් විය.

හනාෆි නොවන මනාලියන් හට නිකා ක්‍රියාවලියේදී කැමැත්ත ප්‍රකාශ කිරීමට හෝ අත්සන් කිරීමට මාර්ගයක් නැත. අධ්‍යයනයේදී හෙළි වූ එක් සිද්ධියකදී, සිය විවාහය ලියා පදිංචි කිරීමේ ආකෘතිවලට අත්සන් තැබීමට උවමනා කල ෂෆි'ඉ මනාලියකට, ඇගේ අත්සන යෙදීම පිණිස ඇය හනාෆි ලෙස ප්‍රකාශ කළ යුතු බව හනාෆි රෙජිස්ට්‍රාර් විසින් පැවසූ බව සඳහන් විය. කෙසේවෙතත්, මෙය දුර්ලභ සිරිතකි.

ඇදහිල්ල හෝ ජනවාර්ගිකත්වය කුමක් වුවත්, සියළුම යුවල් සඳහා 'මාපිය ආශීර්වාදය' සහ අනුමැතිය සාමාන්‍යයෙන් සළකා බලන්නක් වන අතර, සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ වැඩිහිටි මනාලිය සහ මනාලයා සඳහා විවාහයට ඇතුළුවීමට තීරණ ගැනීමේ බලය එක සමාන වේ. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අනුකූලව මෙය එසේ නොවන බැවින්, ඒ මගින්ද ශ්‍රී ලාංකීය පුරවැසියෙකු ලෙස කැමැත්ත සහ පුද්ගල අයිතීන් අතර පවතින සහජ සම්බන්ධය ගෙන හැර පායි. ඔවුන්ගේම කැමැත්තෙන් විවාහයට සම්පූර්ණයෙන් එකඟවීමට ඇති කාන්තාවන්ගේ අයිතිය ප්‍රතික්ෂේප කිරීම කාන්තාවන් හට පුද්ගලතාව සහ පුරවැසිභාවයට ඇති අයිතිය ප්‍රතික්ෂේප කරයි.

අත්සන හෝ ඇඟිලි සළකුණ ශ්‍රී ලංකාවේ සෑම නිත්‍යානුකූල බැඳීමක් ඇති ක්‍රියාවලියක් සහ ලියවිල්ලක් සඳහා මූලික අවශ්‍යතාවයකි. තවද, ඉස්ලාමීය අගමික පෙළ පොත සහ භාවිතයන් ඓතිහාසිකව පෙන්නුම් කරන්නේ, කාන්තාවන් හට ඔවුන්ගේම කැමැත්තෙන් ගිවිසුම්වලට ඇතුල්වීමට තීරණ ගැනිමේ බලය පැවරී ඇති බවයි. මනාලියගේ අත්සන අනිවාර්ය බව සාක්ෂාත් කිරීමෙන් විවාහයේදී බලහත්කාරය හෝ බලකිරීම සාධකයක් නොවන බව තහවුරු නොකරයි. කෙසේවෙතත්, එය බොහෝදුරට ඔවුන් නිත්‍යානුකූල විවාහයකට ඇතුළු වන බවට කාන්තාවන් දැනුවත් කරයි.

**ඉල්ලීම: ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස මුස්ලිම් කාන්තාවන් ඔවුන්ගේ විවාහ වලට ඇතුළුවීම සම්බන්ධව සමාන ස්වාධීනත්වය සහ තීරණ ගැනීමට හිමිකම් කියන අතර විවාහයට ඇතුළු වීම සඳහා කිසිම පිරිමි නෑදෑයෙකුගේ හෝ කාතිවරයෙකුගේ "අවසරය" අවශ්‍ය නොවිය යුතුය. ඔවුන් හට ඔවුන්ගේ සැමියන් වීමට යන පුද්ගලයින් ලෙසම මූලධර්මය මත මෙන්ම ලියවිල්ල මතද කැමැත්ත ප්‍රකාශ කිරීමට සම අයිතීන් තිබිය යුතුය. සියළුම නිල විවාහ ලේඛන මත අත්සන/ඇඟිලි සලකුණ මනාලයාට සහ මනාලියට අනිවාර්ය කළ යුතුය.**

## 3. කයිකූලි/කයිකූලි (දෑවැද්ද)

*කයිකූලි* යනු ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකීය මුවර් (යෝනක) වරුන් අතර භාවිතා වන දෑවැදි ආකාරයකි. එය ඉස්ලාමීය නීතියට අප්‍රකට දෙයක් වන අතර, බොහෝ දුරට වර්තමාන සිංහල සහ ද්‍රවිඩ විවාහ සිරිත්වල බලපෑමක් යැයි අනුමාන කල හැකි චාරිත්‍රානුකූල සිරිතකි. මනාලියගේ පවුල දෑවැද්දක් ලබාදෙන අතර, සාමාන්‍යයෙන් එය මනාලයාට දෙන්නේ, 'මනාලිය වෙනුවෙන් භාරයේ තැබීමටය'. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් *කයිකූලි* ලෙස පිළිගන්නේ රත්රන්, මුදල් වැනි චංචල වත්කම්[28] පමණි. කෙසේවෙතත්, භාවිතයේදී නිවාස/මහල් නිවාස, ඉඩම් සහ වාහන වැනි වෙනත් වත්කම්ද මනාලයාගේ පාර්ශ්වයෙන් ඉල්ලුම් කල හැක.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 47 වන වගන්තියෙන් විවාහ කාලයේදී හෝ විවාහය අවලංගු කිරීමෙන් පසු කාතිවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ගොනු කිරීමෙන් මනාලිය/බිරිඳ හට චංචල දේපළ සඳහා *කයිකූලි* ආපසු ලබාගැනීමට අවසර ලබාදේ[29]. කෙසේවෙතත්, නිශ්චල දේපොළ ගැන සොයාබැලීමට කාතිවරයා හට අධිකරණ බලයක් නොමැති අතර, දේපොළ හෝ ඉඩම් ආපසු ලබාගැනීම පිණිස කාන්තාව විසින් දිස්ත්‍රික් උසාවියේ නඩුවක් ගොනු කළ යුතුය.

[28] Section 97, 1951 Muslim Marriage and Divorce Act (MMDA)

[29] Section 47 (1)(f), 1951 Muslim Marriage and Divorce Act (MMDA)

**සිද්ධි අධ්‍යයනය:** නැගෙනහිර පළාතේ අවුරුදු 16 ක් වයසැති ගැහැණු ළමයෙකු එම දිස්ත්‍රික්කයේම පිරිමියෙකුට විවාහ කර දුන්නේ ඔහු ඇයගේ මව හා සොහොයුරා වෙත පැමිණ විවාහ යෝජනාවක් ඉදිරිපත් කළ පසුවය. ඔහු විශාල කයිකුලි (දෑවැද්දක්) ප්‍රමාණයක් ඉල්ලා සිටි බැවින්, එම පවුල ඔවුන්ගේ ඉඩමෙන් භාගයක් විකුණා, ඔහුට යතුරුපැදියක් මිලයට ගෙන දී, ඉතිරිය කයිකුලි ලෙස මුදලින් ලබා දුන්හ. නිකා උත්සවයෙන් පසු ඇය ඔහු සමග ජිවත්වීමට ගියාය. විවාහය සිදුවී දින තුනකට පසු ඔවුන්ගේ ඉඩමෙහි ඉතිරි කොටස විකුණා එම මුදල් ඔහුට ලබාදෙන ලෙස දෙමාපියන්ගෙන් ඉල්ලීමට ඔහු බිරිඳට බල කළේය. ඔවුන් එසේ කළහොත් ඇයගේ පවුලට ජිවත්වීමට වෙනත් ස්ථානයක් නැතිවේයැයි පවසා ඇය එයට විරුද්ධ වූවාය. මෙම පිරිමියා එවිට ඇයට තදබල ලෙස ශාරීරික හිංසාවට ලක්කිරීමට පටන්ගෙන, විවාහයෙන් පසු 10 වන දින ඇයට හෙල්මටයකින් (හිස් ආවරණයකින්) පහර දීමෙන් ප්‍රබල තුවාල සහිතව රෝහල් ගතකිරීමට සිදුවිය. රෝහලේදී ඇය පැවසුවේ ඇය වැටීමෙන් තුවාල වූ බවය. එයට හේතුව වූයේ ගෘහස්ත ප්‍රචණ්ඩත්වය ගැන කිසිවෙකුට පැවසීමට ඇය ලැජ්ජාවට පත්වූවා මෙන්ම බිය වූ නිසාය. ඉන්පසු සැමියා ඇයව ඇගේ දෙමාපියන්ගේ නිවසට ගෙන ගොස් අතහැර දැමුවේය. දැන් වයස අවුරුදු 18 දී, ඇය ෆසා (fasah) දික්කසාදයක් ලබාගෙන ඇති නමුත්, යතුරුපැදිය හැර ඇගේ කයිකුලි කිසිවක් ආපසු ලබාගැනීමට ඇයට නොහැකි වී ඇත.

**ගැටළු සහ ප්‍රතිවිපාක:** මනාලියගෙන් බලෙන් දෑවැද්ද ඉල්ලීම ඉස්ලාම් ධර්මයේ *හරාම්* හෝ තහනම් ලෙස සැළකේ. එහෙත් මුවර් මුස්ලිම්වරුන් අතර පවතින සිරිත නිසා, එය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත පිළිගනී. කෙසේවෙතත්, විවාහය ලියාපදිංචි කිරීමේ ආකෘතියෙහි *කයිකුලි* ලියාපදිංචි/වාර්තා කිරීම විකල්පයක් පමණක් නිසා, බොහෝ මනාලයන් එක්කෝ එය ලියාපදිංචි නොකර සිටී. නැතහොත් අඩු ප්‍රමාණයක් ලියාපදිංචි කරති. මේ නිසා, විවාහය අසාර්ථක වුවහොත්, *කයිකුලි* ආපසු ලබා ගැනීමට සොයන බිරියන් හට අභියෝගයන්ට මුහුණදීමට සිදුවේ. නිකා උත්සවයේදී නිශ්චල දේපොළ වාර්තා කිරීමට ප්‍රතිපාදන නොමැති බැවින් ඒවා වාර්තා නොකරයි.

බොහෝ අවස්ථාවලදී මනාලයන් පවසන්නේ ඔවුන් *කයිකුලි* නොඉල්ලූ බවත්, මනාලියගේ පවුල විසින් එය කැමැත්තෙන් දෙන ලද බවත්ය. එහෙත්, විවාහ ගැලපීමේදී සහ විවාහ සාකච්ඡා කිරීමේදී සමාජ පීඩනය සහ නොයෙක් ආකාරයේ බලකිරීම් පවතී. *කයිකුලි* යනු පවුල් ආතතිය, ලේලිවරුන්ට  වෙනස්කම් කිරීම, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ දික්කසාදවලට පොදු හේතුවකි. "පොරොන්දු" වූ දෑවැදි ප්‍රමාණය නොදීම නිසා හෝ වඩාත් විශාල දෑවැද්දක් ඉල්ලීම නිසා කාන්තාවන්ව දික්කසාද කර ඇති අවස්ථා ඇත. බොහෝ තලාක් හෝ ෆාසා දික්කසාද වලදී, කාතිවරයා විසින් කාන්තාවන්ට සිය *කයිකුලි* ආපසු ලබාදීම සහතික කිරීම අතපසු කරයි. එමෙන්ම, ඔවුන්ට චංචල දේපළ ගැන තීරණ ගැනීමට අධිකරණ බලය ඇති බව පවා ඔවුහු නොදනිති[30]. වාචික සාක්ෂි මත කාතිවරුන්ට තීරණ ගතහැකි වුවත්, කාතිවරු සහ කාන්තාවන් වුවද විවාහ ලියාපදිංචි කිරීමේ ආකෘතියෙහි වාර්තා කර නැතත්, *කයිකුලි* ආපසු ලබාගත හැකි බව නොදනී[31]. ප්‍රයෝගිකව, සැමියා *කයිකුලි* ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, සමහර කාතිවරු බිරිඳගෙන් නොවිමසා හෝ ඇයට විකල්ප ලබා නොදී අවම මුදලක් ගෙවීමට බොහෝදුරට සැමියා සමග කතිකා කරගනිති[32].

ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවලින් හෙළිවූ පරිදි, බහු භාර්යා සේවනය පවතින්නේ සැමියන්ට *කයිකුලි* ලබාගැනීම පිණිසය. සැමියන් සිය බිරියන් තලාක්/දික්කසාද කරනවිට, දික්කසාද ක්‍රියාවලියේ කොටසක් ලෙස, බොහෝ කාතිවරුන් සැමියාට බිරිඳගේ පවුලෙන් ලබාදුන් කයිකුලි ආපසු ලබාදීම ගැන නොසළකති. අවසානයේදී තමාට නිත්‍යානුකූලව හිමිවිය යුතු *කයිකුලි* බොහෝ කාන්තාවන් හට අහිමි වේ.

[30] Case 42, Source: Gul, Begum Safana, 2014. *'Is Equal Justice Possible',* Islamic Women's Association for Research and Empowerment (IWARE), Batticaloa, Sri Lanka

[31] P.18, Source: Gul, Begum Safana, 2014. *'Is Equal Justice Possible',* Islamic Women's Association for Research and Empowerment (IWARE), Batticaloa, Sri Lanka

[32] Case 52 Source: Source: Gul, Begum Safana, 2014. *'Is Equal Justice Possible',* Islamic Women's Association for Research and Empowerment (IWARE), Batticaloa, Sri Lanka,

**ඉල්ලීම : *කයිකුලි* වනාහි ඉස්ලාමීය නොවන සිරිතක් පමණක් නොව, එය බරපතල ලෙස මුස්ලිම් කාන්තාවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට හානිකර වන අතර, එය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් ඉවත් කළ යුතුය. කෙසේවෙතත්, පවතින සන්දර්භයට අනුව, මෙම සිරිත තුරන් කිරීම පිණිස, විවාහ ලියාපදිංචි කිරීමේදී සියළු *කයිකුලි* ගණුදෙනු (චංචල හා නිශ්චල දේපළ) දැඩිව හා අනිවාර්ය ලෙස වාර්තා කිරීම සිදුකළ යුතුය. තවද විවාහයේ ඕනෑම අවස්ථාවකදී, වෙන්වීමේ කාලයේදී හෝ දික්කසාද වීමේදී *කයිකුලි* ආපසු ලබාගැනීමට පැහැදිලි ක්‍රියාපටිපාටීන් තිබිය යුතුය.**

## 4. දික්කසාද වීම සඳහා අසමාන ප්‍රතිපාදන (විධිවිධාන)

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත පිරිමින් සහ කාන්තාවන් සඳහා දික්කසාද වලදී, එහි වර්ග, කොන්දේසි සහ ක්‍රියාපටිපාටි අතර විශේෂණය කිරීමක් සිදුකරයි. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ සැමියන් හට '*තලාක්*' දික්කසාද ප්‍රකාශ කිරීමට ප්‍රතිපාදන පවතින අතර, බිරියන් හට '*ෆසා*' දික්කසාද ලබාගැනීමට ප්‍රතිපාදන ඇත.

කාති මණ්ඩලයට අනුව[33], ඔවුන්ට ලැබෙන බොහෝ අභියාචනා කාතිවරුන් විසින් දික්කසාද නඩු වලදී ලබාදෙන ලද විනිශ්චයන් පිළිබඳව වේ. අභියාචනා විශාලම සංඛ්‍යාව මූලිකව නැගෙනහිර පළාතෙන්ද (විශේෂයෙන් කින්නියා සහ සමන්තුරේ ප්‍රදේශ), ඉන්පසුව කොළඹ දිස්ත්‍රික්කයෙන්ද, වේ.

## 4.1. *තලාක්* (සැමියා විසින් දික්කසාද කිරීම)

**ප්‍රතිපාදන:** තලාක් (වචනාර්ථයෙන්ම "මම ඔබ දික්කසාද කරමි" යන ප්‍රකාශනයක් ලෙස පරිවර්තනය කෙරේ) යනු සැමියා විසින් මුලපුරන දික්කසාදයකි. දික්කසාද සඳහා විශේෂිත පදනමක් හෝ හේතුවක් සැමියාට තිබීම තලාක් වෙතින් අවශ්‍ය නොකෙරේ. තවද, දික්කසාදය ඉල්ලීම සඳහා හේතුවක් ඇතත්, චෝදනා කරන හේතුව/පදනම කාතිවරයා විසින් වාර්තා කිරීමට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් ඉඩ නොසළසයි[34].

තලාක් දික්කසාද සඳහා විවිධ ක්‍රම ඇත. මේවා රඳා පවතින්නේ සැමියා අදහස් කරන්නේ දික්කසාදය තිබිය යුතු අහෝසි කළ නොහැකි ලෙසද නැතහොත් අහෝසි කල හැකි ලෙසද යන්න මතය. '*තලාක් අසාන්*' යනුවෙන් හැඳින්වෙන අහෝසි කළ හැකි විවාහයකට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මගින් අවසර දෙන විට, මාස තුනක් ඇතුළත සැමියා විසින් '*තලාක්*' ප්‍රකාශ කරයි. (මාස තුනක් ඇතුළත සෑම මසකටම වරක්) සැමියා විසින් දැනුම්දීමෙන් පසු, කාතිවරයා විසින් දින 30 ක සමගි කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ යුතුය[35]. එසේ සමගිවීමක් සිදුනොවේ නම්, මාස තුන (*ඉද්දා* කාලය ලෙසද හැඳින්වෙන) හමාරවීමෙන් දික්කසාද කටයුතු අවසන් කෙරේ. බිරිඳ ගැබ්ගෙන ඇත්නම්, දරුවා ප්‍රසූත කිරීමෙන් පසු, එය සිදුකෙරේ[36].

**ගැටළු සහ ප්‍රතිවිපාක:** තලාක් දික්කසාදයක් ඉල්ලුම් කරන සැමියෙක් ඔහුගේ බිරිඳ ජීවත්වන ප්‍රදේශයෙහි කාතිවරයා වෙත දැනුම්දීම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් අවශ්‍ය කෙරේ. එහෙත්, තලාක් ප්‍රකාශ කරන විට බිරිඳගේ පෙනී සිටීම අවශ්‍ය නොකරන නිසා කාතිවරයා බිරිඳට දැනුම් දෙන තුරු, දික්කසාද වීමට සැමියා අදහස් කරන බව ගැන බිරිඳ බොහෝවිට නොදන්නා බව කාන්තා කණ්ඩායම් වාර්තා කර ඇත. කාතිවරු විසින් සිය බලය භාවිතකර හෝ අල්ලස් ලබාදී දික්කසාදය හැකි ඉක්මණින්, සමහර විට දිනයක් ඇතුලත, අවසන් කර ඇති බොහෝ අවස්ථා ඇත.

බහු භාර්යා විවාහවලදී බිරියන් කිහිපදෙනෙක් නඩත්තු කිරීමට සිදුවූ විට සහ පවුල් බර වැඩිවූ විට, තලාක් දික්කසාද සොයන අවස්ථාද ඇත. සිය බිරියන් සහ පවුල් නඩත්තු කිරීමට නොහැකි පිරිමින් හට විකල්පයක් ලෙස කාතිවරුන් විසින්ම දික්කසාදය නිර්දේශ කර ඇති අවස්ථා ගැන පුත්තලමෙහි කාන්තා ස්වේච්ඡා සේවකයින් හට දැනගන්නට ලැබී ඇත. *ඉද්දා* හෝ පිටත නොගොස් සිටීමේ කාලය තුළ සැමියන් විසින් නඩත්තු ගෙවීම සිදුකළ යුතු තලාක් දික්කසාදවලදී දරුවන් සඳහා නඩත්තු ගෙවීම් පිහිටුවීම, *කයිකුලි* ආපසු ලබාදීම

---

[33] 1951 Muslim Marriage and Divorce Act (MMDA) Section 60 (1) mandates that "*Any party aggrieved by any final order made by a Quazi under the rules in the Third Schedule or in any inquiry under section 47 shall have a right of appeal to the Board of Quazis.*"

[34] Second Schedule, 1951 Muslim Marriage and Divorce Act (MMDA)

[35] Kodikara, Chulani 1999. '*Muslim Family Law in Sri Lanka: Theory, Practice and Issues of Concern to Women'*. Muslim Women's Research and Action Forum (MWRAF)/Women Living Under Muslim Law (WLUML).

[36] Section 30, 1951 Muslim Marriage and Divorce Act (MMDA)

හෝ *මහර්* බේරුම් කිරීම ආදියට පෙර කාතිවරුන් විසින් දික්කසාද ලබාදුන් අවස්ථා නිසා, කාන්තාවන් (සහ ගැහැණු ළමයින්) මූල්‍යමය වශයෙන් සහ සමාජීය වශයෙන් අපහසු සහ අවදානම් සහිත තත්ත්වයන්ට පත්වූ අවස්ථා ඇත.

## 4.2. *ෆසා* (බිරිඳ විසින් දික්කසාද කිරීම)

*ෆසා* යනු සුන්නි බිරිඳක් විසින්, සැමියාගෙන් වෛවාහික වරදක පදනම මත, සැමියාගේ කැමැත්තෙන් තොරව මුලපුරන දික්කසාද වර්ගයකි. මෙය බහුලව සිදුවන දික්කසාද වර්ගය ලෙස බොහෝ කාතිවරුන් මෙන්ම කාන්තා ස්වේච්ඡා සේවකයින් විසින් වාර්තා කරන්නකි. *ෆසා* සඳහා ඇතුළත්වන හේතූන් අතර, පීඩා කිරීම්, කෲරකම්, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය (වාචික හිංසනය ඇතුළු) නඩත්තු කිරීමට අසමත් වීම සහ අත්හැර යාම සහ "පාර්ශ්වයන් අයත්වන නිකායන් පාලනය වන මුස්ලිම් නීතිය"[37] යටතේ "වැරදි" ලෙස සැළකෙන අනෙකුත් හේතු ඇතුළත් වේ. බෙලහීනකම සහ උමතුව වැනි, වරදවල් නොවන පදනම් මතද *ෆසා* ලබාගත හැක[38].

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගෙන හැර දක්වන තුන්වන න්‍යාය පත්‍රයට අනුව, මැදිහත් වීම අසාර්ථක වන්නේ නම්, කාතිවරයා විසින් පාර්ශ්වයන් දෙකම සමග තමාම සහ පිරිමි මුස්ලිම් ජූරි සභිකයින් තිදෙනෙක් සහිතව විනිශ්චය දීම පිණිස නඩු විභාග කිරීම අවශ්‍ය කෙරේ[39]. සැමියා වරද පිළිගන්නා අවස්ථාවක හැර, බිරිඳගේ සාක්ෂි සහ ප්‍රකාශ සනාථ කිරීම පිණිස බිරිඳගේ පාර්ශ්වයෙන් සාක්ෂිකරුවන් (අවම වශයෙන් දෙදෙනෙක්) අවශ්‍ය වේ.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ නිකායේ (ලිඛිත නොවන) නීතිය සඳහා *ෆාසා* දික්කසාද සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රතිපාදන ඇත. එබැවින්, යම් විශේෂිත නිකායක් හෝ *මද්හබ්,* බිරිඳ විසින් දික්කසාද කිරීම (ෆසා) පිළිනොගන්නේ නම්, එවිට එවැනි නිකායයන් හෝ *මද්හබ්* වල කාන්තාවන් හට, වරදක පදනම මත වුවද දික්කසාදයකට මුල පිරීම සිදුකළ නොහැකි අතර, පිළිගනු ලබන්නේ සැමියා විසින් ඉදිරිපත් කරන *තලාක්* දික්කසාදය පමණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස තත්ත්වය කුමක් වුවත්, කාන්තාවන් හට දික්කසාද වීමට නම්, ඔවුන්ගේ සැමියන්ගේ 'අවසරය' අවශ්‍ය කෙරේ. එමනිසා ශ්‍රී ලංකාවේ නිකාය හෝ *මද්හබ්* හරහා දික්කසාදය සඳහා ඇති ප්‍රතිපාදනද, සමාන නොවේ. මේමන් ප්‍රජාවේ කාතිවරයාට අනුව, හනාෆි *මද්හබ්* යටතේ *ෆාසා* දික්කසාද සඳහා ප්‍රතිපාදන නොමැති බැවින්, ඔහු වෙත මෙමන් ප්‍රජාවෙන් ලැබෙන නඩු ෂාෆි'ඉ *මද්හබ්* අනුගමනය කරන කාතිවරයෙකු වෙත යොමුකෙරේ.

**ගැටළු සහ ප්‍රතිවිපාක:** හිංසාකාරී විවාහවල සිටින කාන්තාවෝ දික්කසාද ලබාගැනීමේදී, සාක්ෂි ඉදිරිපත් කිරීම, සාක්ෂිකරුවන්, සහ විනිශ්චයකරන්නන් ඉදිරියේ සාක්ෂි දීම පිළිබඳව අමතර බාධක සහ අභියෝගවලට මුහුණදෙති. ප්‍රබල මානසික අපයෝජනයන් හෝ මානසික කම්පනයට මුහුණදී ඇති සහ ඔවුන්ගේ නඩුවට සහාය දැක්වීමට කැමති සාක්ෂිකරුවන් නොමැති කාන්තාවෝ, දික්කසාදයක් ලබාගැනීමේදී සුවිශේෂී ගැටළුවලට මුහුණදෙති. තවද, නඩත්තු නොගෙවීමේ සිට බරපතළ ශාරීරික සහ ලිංගික අතවර දක්වා පරාසයක ඇති ඔවුන්ගේ නඩු, නඩු විභාගවලට ඉදිරිපත් කිරීමේදී, කාන්තාවන් සහ ගැහැණු ළමයින් හට, මෙවැනි නඩු විමර්ශනය කර විනිශ්චය ලබාදීමට, වෘත්තීමය පුහුණු ලබා නැති, සියල්ලන්-පිරිමින් වන මණ්ඩලයක් ඉදිරියේ කියාපෑමේ අමතර කම්පන සහගත කාර්යයට මුහුණදීමට සිදුවේ.

*ෆසා* දික්කසාද සඳහා නියමිත ක්‍රියාවලිය තදබල ලෙස අනුගමනය කල යුතු බවත්, නැතහොත්, දික්කසාදය ශූන්‍ය සහ බලරහිත ලෙස සැළකෙන බව කාතිවරුන් විසින් සඳහන් කර ඇත. ක්‍රියාපටිපාටියෙහි වරදක පදනම මත, උදාහරණයක් වශයෙන් නඩු විභාගය නොපැවැත්වීම මත, සැමියන් හට කාති මණ්ඩලයට අභියාචනා කළ හැක. එය ඔප්පු වුවහොත් *ෆසා* දික්කසාදයක විනිශ්චය අහෝසි විය හැක. කාති මණ්ඩලයේ නියෝජිතයෙකුට අනුව, බිරිඳ දැනටමත් නැවත විවාහ වී දරුවන් සිටී නම්, විවාහය බල රහිත කරන අතර, පෙර විවාහ නඩුව නිරාකරණය කරන තුරු දරුවන් නිත්‍යානුකූල නොවන (අවජාතික) ලෙස සැළකේ. තවද, ෆසා දික්කසාදය, අයදුම්කරු හෝ කාතිවරයා අයත්වන *මද්හබ්* මත තීරණය වේ.

---

37 Section 28, 1951 Muslim Marriage and Divorce Act (MMDA)

38 Kodikara, Chulani 1999. '*Muslim Family Law in Sri Lanka: Theory, Practice and Issues of Concern to Women'*. Muslim Women's Research and Action Forum (MWRAF)/Women Living Under Muslim Law (WLUML).

39 Rule 7 required the Quazi to empanel 3 Muslim accessors to support him in hearing of the *fasah* application (Source: Kodikara, Chulani 1999. '*Muslim Family Law in Sri Lanka: Theory, Practice and Issues of Concern to Women'*. Muslim Women's Research and Action Forum (MWRAF)/Women Living Under Muslim Law (WLUML)

කාන්තා ක්‍රියාකාරින්ට අනුව, සැමියන් විසින් තලාක් ප්‍රකාශ කිරීම වෙනුවට ඔවුන්ගේ බිරියන් හට *ෆාසා* දික්කසාදයක් ලබාගන්නා ලෙස බලහත්කාරකම්/බලකරන සිද්ධීන් ඇත. පුත්තලමේ ස්වේච්ඡා සේවකයින් බෙදාහදා ගත් එක් සිද්ධියක සැමියෙකු හට ඔහුගේ බිරිඳව දික්කසාද කිරීමට අවශ්‍ය වූ නමුත්, ඔහු *තලාක්* දික්කසාදයක් තෝරාගත හොත්, ඔහුට ගෙවීමට සිදුවන *මාතාඅ්*(වන්දිය) ගෙවීමට අකමැති විය. ඒ වෙනුවට ඔහු ඔහුගේ බිරිඳ *ෆසා* දික්කසාදයක් ඉල්ලන තුරු ඇයව ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ පහරදීම්වලට ලක් කළේය. *ෆාසා* දික්කසාදයේ කොන්දේසිවලට අනුව ඇයට වන්දි නොලැබුණාක් මෙන්ම, ඇගේ සැමියා හට නීතිමය ප්‍රතිවිපාකද නොතිබුණි. සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ, බිරිඳගේ ආර්ථික තත්ත්වය කුමක් වුවත්, පිරිමියෙකු විසින් භාර්යාව නඩත්තු කිරීමට බැඳී සිටියි. බිරිඳට “ප්‍රමාණවත් ස්වාධීන ආදායම් මාර්ග” පවතී නම්, ඇයගේ සහකරුව නඩත්තු කිරීමට ඇය බැඳී සිටින්නීය. මේ අවස්ථා දෙකෙහිදීම, දික්කසාදයේ කොටසක් ලෙස නිත්‍ය නඩත්තුව සඳහා වෙනම නියෝගයක් ලබාගන්නා අවස්ථාවකදි හැර, දික්කසාද ආඥාව ලබාදෙන තුරු එසේ වේ[40].

**සිද්ධි අධ්‍යයනය:** සුළුතර ෂි’ආ නිකායක කාන්තාවක් එම ප්‍රජාවේම පිරිමියෙකු සමග විවාහ වී ප්‍රථම දෙමස ඇතුළත, සිය සැමියාගෙන් මානසික අපයෝජනය සහ පාලනය කරන හැසිරීම් අත්දකින ලද අතර, එය ශාරීරික අපයෝජනය දක්වා උග්‍රවිය. මෙවැනි විවාහයක් තුළ දිගටම සිටීමට නොහැකි වීම නිසා, ඇයට සිය සැමියාගෙන් වෙන්වීමට සිදුවිය. සමගි කිරීමට ගත් උත්සාහ නොකතා, මෙම කාන්තාව තමා ලද අපයෝජන අත්දැකීම් සහිතව ආපසු එම විවාහයට නොයාමට තීරණය කළාය. නමුත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ ඇයට *ෆසා* දික්කසාදයක් ලබාගැනීමට නොහැකි වුයේ, වාතාවරණය නොසළකා, එම නිකාය යටතේ දික්කසාද වීම පිණිස සැමියාගේ අවසරය අවශ්‍ය වූ නිසාය. මේ පිළිබඳව ඇයට ඇයගේ පවුලෙන්, ප්‍රජාවෙන් සහ ආගමික නායකයින්ගෙන් සහයෝගය ප්‍රබල ලෙස ලැබුණු අතර, දික්කසාදයට අවසර දෙන ලෙස ඔවුහු සැමියා වෙත තදබල පීඩනයක් ඇති කළහ. කෙසේවෙතත්, මේ ගැන නොසළකා වසර තුනක් ගතවන තුරු මෙම සැමියා ඇයට දික්කසාදය ලබානොදුන්නේ, ඔහුගේ නිකායට අනුව නීතියේ (ලිඛිත නොවන) ප්‍රතිපාදන වලින් ඔහුට එය අත්හිටුවීමට ලබාදී ඇති අයිතිය නිසාය.

## 4.3. සුන්නි මද්හබ් යටතේ අවසර ඇති මුත් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නොමැති දික්කසාද

### *මුබාරත් සහ කූලා*

*මුබාරත්* යනු සුන්නි නිකායේ සමහර මද්හබ් මගින් පිළිගන්නා අන්‍යෝන්‍ය කැමැත්තෙන් සිදුවන දික්කසාදයකි. එහෙත් මෙය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් විශේෂිතව නියම කර නොමැත. කෙසේවෙතත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතේ 98 වෙනි වගන්තියෙහි පදනම යටතේ කාතිවරුන් විසින් *මුබාරත්* දික්කසාද ලබාදී ඇත. එයින් නියම කෙරෙන්නේ - “... මුස්ලිම් විවාහය හෝ දික්කසාදයට අදාළ සියළු කාරණා, තත්ත්වය, සහ පාර්ශ්වයන්ගේ අන්‍යෝන්‍ය අයිතීන් සහ වගකීම් එම පාර්ශ්වයන් අයත්වන නිකාය පාලනය වන මුස්ලිම් නීතියට අනුව නිර්ණය වේ” යන්නයි.*කූලා* යනු භාර්යාව විවාහය තුළ සතුටු නොවන්නේ නම් සහ ඇය සැමියාට වන්දි මුදලක් ගෙවන්නේ නම් ඇයට ලබාගත හැකි දික්කසාදයකි. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ 28 (2) වගන්තිය[41] යටතේ කාන්තාවන් හට *කූලා* දික්කසාදය සඳහා අයදුම් කළ හැක. කෙසේවතත්, ඇය වන්දි ගෙවීමට කැමති විය යුතු අතර, එමෙන්ම “පාර්ශ්වයන් හට සාමයෙන් සහ සමගියෙන් ජීවත්වීම කල නොහැක්කක් බව තහවුරු කළ යුතුය”[42].

**ගැටළුව සහ ප්‍රතිවිපාක:** අධ්‍යයනය තුළදී, හෙළිදරව් වූයේ, වෛවාහක වරදක් නිසා කාන්තාවන් *ෆසා* දික්කසාදය තෝරාගන්නා අවස්ථාවලදී, ඒ වෙනුවට *මුබාරත්* දික්කසාදයක් කරගන්නා ලෙස කාතිවරයා විසින් බලකරන බවයි. මේ සඳහා දෙන ලද එක් හේතුවක් වුයේ, එය දෙපාර්ශවයෙහිම සාමකාමී තිරණයක් බවත්, වෛරය හෝ “නරක හැඟීම්” ඇතිවීම අඩුවිය හැකි බවත්ය. කාතිවරයෙකු විසින් දෙන ලද තවත් හේතුවක් වුයේ, *මුබාරත්* දික්කසාදයක් දීමෙන්, කාතිවරයාගේ විනිශ්චයට අභියාචනා කිරීමේ අවස්ථාවක් නොලැබෙන බවයි. සමහර

---

40 Muttetuwagama, Ramani, 1997. *Parallel Systems of Personal Laws in Sri Lanka*. Muslim Women’s Research and Action Forum (MWRAF)

41 Section 28(2) of the MMDA states that *“Where a wife desires to effect a divorce from her husband on any ground not referred to in subsection (1), being a divorce of any description permitted to a wife by the Muslim law governing the sect to which the parties belong, the procedure laid down in the Third Schedule shall be followed…”*

42 Kodikara, Chulani 1999. ‘*Muslim Family Law in Sri Lanka: Theory, Practice and Issues of Concern to Women*’. Muslim Women’s Research and Action Forum (MWRAF)/Women Living Under Muslim Law (WLUML).

*මුබාරත්* දික්කසාද සිද්ධීන්හි දී, භාර්යාව තමා වෙනුවෙන් හෝ දරුවන් වෙනුවෙන් කිසිම නඩත්තුවක් නොලබන අවස්ථා ඇත. මන්දයත්, මෙහිදී දික්කසාදයේ අන්‍යෝන්‍යය ස්වභාවය පියාව ඔහුගේ යුතුකම් වලින් නිදහස් කරන බව සිතීම එයට හේතුවය. කෙසේවෙතත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ළමා නඩත්තු ගෙවීමෙන් පියා නිදහස් කිරීමට එවැනි ව්‍යතිරේකයක් නොමැති අතර, එය සාමාන්‍යයෙන් කාතිවරයා විසින් ගන්නා අත්තනෝමතික තීරණයකි.

කූලා දික්කසාදයට සම්බන්ධව, සැමියාගේ කැමැත්ත අවශ්‍ය වීම ඉතා ගැටළු සහගත වේ. චූලනි කොඩිකාර "ශ්‍රී ලංකාව තුල මුස්ලිම් පවුල් නීතිය" යන්නෙහි විග්‍රහ කල නඩු නීතිය, භාර්යාවන් *කූලා* දික්කසාද ලබාගැනීමට උත්සාහ කරන විට, වන්දි ලෙස ඔවුන්ගේ *මාහර්*, *ඉද්දා*, සහ අනෙක් දේපොළ ආපසු ගෙවන ලෙස අණ දුන් අමතර අභියෝගාත්මක අවස්ථා පෙන්වයි.

**ඉල්ලීම: ඉස්ලාමීය නීතිය යටතේ විවිධ වර්ගවල දික්කසාදයන්ට හුදෙක් අවසර දීමෙන් ඔබ්බට, මෙම විවිධ වර්ගවල දික්කසාදයන්හි සමාජමය ගම්‍යර්ථයන්, ඒවා භාවිතා/අවභාවිතා කළ හැකි අන්දම සහ සහකාර සහාකාරියන් මත ඇති කල හැකි ප්‍රතිවිපාක තක්සේරු කිරීමද, වැදගත් වේ. ඒක පාක්ෂික දික්කසාද සහ සැමියා විසින් හෝ භාර්යාව විසින් හේතුවක් නොමැතිව දික්කසාද වීම, සහකාර සහකාරියන් මත සහ පවුල් මත භයංකාර බලපෑම් ඇතිකරන අතර එය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් ඉවත් කළ යුතුය. තවද නිකාය හෝ *මද්හබ්* මත පදනම්ව ශ්‍රී ලාංකීය මුස්ලිම් කාන්තාවන්ගේ විවිධ කොට්ඨාශවලට විවිධ වර්ගවල දික්කසාද අදාළ වීමද තදබල ලෙස ගැටළු සහගත වේ. එමනිසා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට කෙරෙන ප්‍රතිසංස්කරණ, සැමියාට සහ බිරිඳට, දික්කසාදය සඳහා වලංගු හේතු සහිතව, ඒකාකාරත්වයක් තිබිය යුතු අතර, ලිංග සහ නිකාය/මද්හබ් හරහා මුස්ලිම් පිරිමින් සහ කාන්තාවන් හට අදාළ වන වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් උපදවිය යුතුය.**

## 5. බහුභාර්යත්වය

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මුස්ලිම් පිරිමියෙකුට භාර්යාවන් සතර දෙනෙක් දක්වා විවාහ කර ගැනීමට අවසර දෙන අතර, ඉන්පසු සිදුකෙරෙන විවාහ නීතිවිරෝධී ලෙස නොසැළකුණත්, 'අවිධිමත්' (නෛතික ප්‍රතිවිපාක නොමැතිව තාවකාලිකව අවලංගු වන) වේ. මැලේසියාව වැනි රටවල මෙන් නොව, බහු විවාහවලට ඇතුළු වීමට තීරණය කරන සැමියන් සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මගින් දැනට සිටින භාර්යාවන්ගේ පූර්ව කැමැත්ත හෝ සැමියා හට බහු භාර්යාවන් සහ පවුල් නඩත්තු කිරීමට හැකියාව පවතී දැයි කාතිවරයා විසින් සොයාබැලීම අවශ්‍ය නොකෙරේ.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 24 වෙනි වගන්තියෙන් සැමියා විසින් ඔහුගේ වර්තමාන සහ විවාහ කර ගැනීමට අදහස් කරන භාර්යාවන් ජීවත්වන ප්‍රදේශයේ කාතිවරයා වෙත යෝජිත විවාහය ගැන දින 30 ක දැනුම්දීමක් කිරීම අවශ්‍ය කෙරේ. විවාහය ගැන ප්‍රදේශයේ ප්‍රධාන මුස්ලිම් දේවස්ථානයේ (සහ අනෙකුත් කැපී පෙනෙන ස්ථානවල) දැන්වීම් දැමීමේ වගකීම කාතිවරයා සතුය. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මගින් විවාහ ලියාපදිංචි කිරීම අනිවාර්ය කෙරුණත්[43], දැනට පවතින හෝ මීට පෙර පැවති විවාහ ගැන සඳහන් කිරීමට ලියාපදිංචි කිරීමේ ආකෘතියෙහි ප්‍රතිපාදන නොමැත. විවාහය ලියාපදිංචි කරන විට මනාලයා ඊට පෙර කළ විවාහයන් ප්‍රකාශ කළ යුතුය. කෙසේවෙතත්, සාවද්‍ය ප්‍රකාශ කිරීම් සඳහා දඩය අවම රුපියල් 100/- ක් හෝ සය මසක සිර දඬුවමක් වන නමුත්, විවාහයේ වලංගු බවට එය බල නොපායි.

දැන්වීම් නිකුත් කරන කාතිවරයා සහ විවාහ ලියාපදිංචි කරන රෙජිස්ට්‍රාර් අතර ඇත්තේ සීමිත සම්බන්ධීකරණයක් වන අතර, බොහෝ අවස්ථාවලදී රෙජිස්ට්‍රාර් විසින් කාතිවරයා සමග විමසීම් නොකරයි.

**ගැටළු සහ ප්‍රතිවිපාක:** මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ ඇති ප්‍රතිපාදන, බහු භාර්යාවන් පාවා ගැනීමේදී පූර්ණ තීරණ ගැනීමේ බලය සැමියාගේ අභිමතයට ලබාදී ඇත. මෙහිදී කලින් සිටි භාර්යාවන් සහ දරුවන් මත මෙවැනි විවාහයක් නිසා ඇතිවන මනෝවිද්‍යාත්මක, සමාජීය සහ මූල්‍යමය බලපෑම් ගැන කිසිසේත් සළකා නොබලයි. බහු භාර්යත්වයට ඇති බාධාරහිත අයිතියෙන් සිදුවන්නේ බහු විවාහ නඩත්තු කිරීමට නොහැකි මුස්ලිම් පිරිමින්ටද ඒවාට ඇතුළු විය හැකි බව සහ, ඒ නිසා බහු කාන්තාවන් සහ දරුවන් අවදානම් තත්ත්වයන්ට පත්වන බවයි. බහු භාර්යා විවාහවලට ඇතුළු වන බොහෝ මුස්ලිම් කාන්තාවන්, ඔවුන් බහු විවාහවල කොටසක් බවට පත්වී ඇති බව නොදන්නා නිසා, එම කාරණය ගැන යම් කර්තෘත්වයක් හෝ ස්වාධීනත්වයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

[43] Section 16 and 17, 1951 Muslim Marriage and Divorce Act (MMDA)

ජ්‍යෙෂ්ඨ නීතිඥයින්ට අනුව, සැමියා සිදුකිරීමට යන විවාහයකට අදාළ දැන්වීම් පළ කිරීමෙහි පරමාර්ථය වන්නේ, "බහු විවාහවලට ඇතුළුවන සැමියෙකු මත සමාජ පීඩනය ඇතිකිරීමය"[44]. කෙසේවෙතත්, පුත්තලමෙහි කාන්තා ක්‍රියාකාරින්ට අනුව, සමහරවිට කාතිවරයා විසින් දැන්වීම් අලවන ලෙස සැමියාට පැවසීම නිසා, ඔහු එය නොකරන විට, දැන්වීම් ඇලවීම නිසියාකාරව සිදු නොවේ. එමෙන්ම, සමහර මුස්ලිම් දේවස්ථාන ඒවායේ පරිශ්‍රය තුළ දැන්වීම් ඇලවීමට ඉඩනොදේ. මුස්ලිම් කාන්තාවන් හට බොහෝවිට මුස්ලිම් දේවස්ථානවලට ඇතුළුවීම තහනම් කර ඇති අතර, එසේ ප්‍රවේශ වීමට ඉඩදෙන මුස්ලිම් දේවස්ථාන පවා, එසේ කරන්නේ සීමිත දින/කාලවල පමණි.

තවත් භාර්යාවක් ගැනීමට සැමියා ගන්නා තීරණය ගැන කතා කිරීම කාන්තාවන් සඳහා, පීඩාවට ලක්කිරීම, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ මානසික කම්පනය ඇති වීමට හේතුවිය හැක. සමහර අවස්ථාවලදී කාන්තාවන් හට තර්ජනය කර බහු විවාහවල ජීවත්වන ලෙස බලකෙරේ. තවද, සැමියන් තවත් භාර්යාවක් ගන්නා විට නිතරම පවුල සහ කාතිවරයා කාන්තාවන් හට දොස් පවරති. මේ අනුව බහු විවාහවල භාර්යාවන්ට සහ දරුවන්ට බරපතළ මූල්‍යමය ප්‍රතිවිපාකද පවතී. විෂය මූල සාක්ෂිවලින් ඇඟවෙන්නේ, සැමියන් විසින් බහු විවාහ නඩත්තු කිරීමට මූල්‍යමය ලෙස නොහැකිවීමේ පදනම මත පූර්ව හෝ පසු භාර්යාවන් දික්කසාද කර ඇති බවයි. කෝරානය වැනි ඉස්ලාමීය පෙළ පොත්වල ලියා ඇති පරිදි බහු භාර්යත්වය සඳහා ඇති සුවිශේෂී කොන්දේසිවල, සැමියා විසින් ඔහුගේ සියළුම භාර්යාවන් සමානව නඩත්තු කළ යුතු බවට පූර්ව අවශ්‍යතාවයක් තිබියදීත්, මෙය මෙසේ සිදුවේ.

නව මනාලියගෙන් *කයිකූලි* ලබාගැනීම සඳහාද, පිරිමි බහු විවාහවල නියැලෙති. එක් විශේෂ සිද්ධියක, විවාහයෙන් පසු සැමියා භාර්යාවගේ දේපොළ ඔහුගේ නමට මාරුකරගෙන, දෙවැනි විවාහයක් කරගෙන, පළමු භාර්යාව ඇයට අයිති නිවසින් පිටමං කර ඇත. තවත් සිද්ධියක, එක් පිරිමියෙක් නිවස සෑදීමට මුදල් එවීම පිණිස සිය භාර්යාව රැකියාවක් සඳහා පිටරට යැව්වේය. ඉන්පසු ඔහු වෙනත් කාන්තාවක් විවාහ කර ගෙන, ප්‍රථම භාර්යාවගේ ආදායමින් ඇය සමග ජීවත් වෙයි. සමහර අවස්ථාවලදී, ශ්‍රී ලාංකීය මුස්ලිම් සැමියන් හට විවිධ දිස්ත්‍රික්කවල සහකාරියෝ සහ පවුල් සිටිති. එමෙන්ම, සමාන මුස්ලිම් නීතිය පවතින මාලදිවයින වැනි රටවලද ඔවුන්ට පවුල් සිටිති.

කාන්තාවන් හට, පැහැදිළි බල නොකෙරුන, සහ දැනුවත් තෝරාගැනීමක් ඇත්නම්, ඔවුන් කැමැත්තෙන්ම බහු භාර්යා විවාහවලට එකඟවේයැයි සිතීම අපහසුය. මුස්ලිම් පිරිමින් බහුභාර්යත්වය දකින්නේ, ඔවුන්ගේ ඇදහිල්ල සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා ඔවුන්ට ලබාදී ඇති 'දිව්‍යමය අයිතිය' ක් ලෙසය. සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ පණත මඟින් බහුවිවාහ දකින්නේ බහුභාර්යා සේවනය සහ සාපරාධී වරදක් ලෙස බැවින්, අනෙකුත් ඇදහිලිවල පිරිමින්ට නැති 'වරප්‍රසාද' යක් තමන්ට ඇති ලෙසටද මුස්ලිම් පිරිමි දකිති. මෙම ආකල්පය බහු භාර්යත්වයට විරුද්ධවන ඕනෑම කෙනෙකුට මෙන්ම, බහු විවාහවල සිටීමට අකමැති මුස්ලිම් කාන්තාවන් හට එම සිරිතට අභියෝග කිරීමද, ඉතා අපහසු කාර්යයක් බවට පත්කරයි.

බහු භාර්යත්වයට සහාය දක්වන අය අතර ඇති ප්‍රධාන සාධාරණීකරණය වන්නේ එය මුස්ලිම් පිරිමියෙකු හට ඇති 'දිව්‍යමය අයිතියක්' බවයි. අනෙකුත් සමාජයීය සාධාරණීකරණය කිරීම් වන්නේ, එය අවිවාහක සහ වැඩිහිටි කාන්තාවන්ට, අඩු ආදායම් තත්ත්වවල සිටින කාන්තාවන්ට, දික්කසාද වූ, වැන්දඹු හෝ මධ්‍යම වයසේ සිටින කාන්තාවන්ට සමාජමය සහ ආර්ථික ආරක්ෂාවක් ලබා දිය හැකි සැලැස්මක් බවයි. සත්‍ය වශයෙන්, ශ්‍රී ලංකාවේ බහුභාර්යත්ව විවාහ, සැමියන් විසින් මුස්ලිම් කාන්තාවන් අත්හැර දැමීම සහ නඩත්තු නොකිරීමට ප්‍රධාන හේතුවක් වී ඇතිවාක් මෙන්ම, මුස්ලිම්වරුන් අතර පවතින දික්කසාද අනුපාතය ඉහළ යාමටද හේතු වී ඇත.

මුස්ලිම් බහුතරයක් සිටින විවිධ රටවල බහුභාර්යත්වයට ප්‍රවේශය වෙනස් වේ. මැලේසියාව වැනි රටවල බහුභාර්යත්වයට පවතින පූර්ව අවශ්‍යතා ඉතා දැඩිය. මේවාට, ප්‍රදේශයේ විනිසුරුවරයා විසින් සැමියාගේ මූල්‍යමය තත්ත්වය ගැන පූර්ණ විමර්ශනයක් කිරීම, පෙර භාර්යාවන්ගේ අවසරය සහ ඔවුන්ගේ අවසරයේ කොන්දේසි මත කොන්ත්‍රාත්තුවක් පිළියෙල කිරීමේ අවස්ථාව, ඇතුළත් වේ. තුර්කිය වැනි වෙනත් රටවල් බහුභාර්යත්වය 1926 දී නීති විරෝධී කළ අතර, ටියුනීසියාව 1956 දී එය තහනම් කළේ, එම සිරිත යල් පැනපු සහ නවීන සන්දර්භය තුළ තවදුරටත් සිදු කළ නොහැකි හෝ අදාළ නොවන ලෙස ප්‍රකාශ කිරීමෙනි.

[44] Marsoof, Saleem, 2011. *'The Quazi Court System in Sri Lanka and Its Impact on Muslim Women',* Muslim Women's Research and Action Forum (MWRAF)/Women Living Under Muslim Law (WLUML)

**ඉල්ලීම: බහුභාර්යත්වය යනු පැහැදිලිවම නීතිය මගින් පිරිමින්ට සහ කාන්තාවන්ට අසමානව සැළකීමේ උදාහරණයකි. ඉස්ලාමීය නීතිය තුළ බහුභාර්යත්වයට අවසර ඇතත්, කරානයේ නියම කර ඇති පරිදි එය කොන්දේසිවලට යටත් වේ. බහු විවාහක පිරිමින් ගන්නා නිදහස ඉස්ලාමීය මූලධර්මව වලට එකඟද නැද්ද යන්න බෙහෙවින් සැක සහිතය. බහුභාර්යත්වය සත්‍ය වශයෙන් කාන්තාවන්ගේ සහ පවුල්වල සුභ සිද්ධියට දායක වන්නේද, නැද්ද සහ වර්තමාන ශ්‍රී ලංකාවට මෙය අදාළ සහ යෙදිය හැකිද යන්න ගැන ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු බරපතළ ලෙස මෙනෙහි කළ යුතුය.**

**පවතින සන්දර්භය තුළ, බහුභාර්යත්ව භාවිතය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි තිබීමට නම්, යුවළ් සඳහා විවාහයට පෙර ඉස්ලාමීය විවාහ ගිවිසුම් කෙටුම්පත් කිරීමට, බහුභාර්ය විවාහයකින් ඉවත්වීමට පූර්ණ අයිතිය සහිතව ප්‍රතිසංස්කරණ තුළින් ප්‍රතිපාදන ගෙන ආ යුතුය. කාන්තාවන් හට, ඇගේ සැමියා බහුභාර්යත්වය ඇතුළුවීමේ හැකියාවක් ඇති හෝ නැති බව විවාහයට පෙර දැනුම් දිය යුතුය. පසුව භාර්යාවන් ගැනීමට කලින්, සැමියා විසින් සියළුම භාර්යාවන්ගේ සහ භාර්යාව/භාර්යාවන් වීමට සිටින්නන්ගේ කැමැත්ත ගත යුතුය. මීට අමතරව, කාතිවරයා විසින් බහුභාර්යා විවාහයට අනුමැතිය දිය යුත්තේ සමානව නඩත්තු කිරීමට (විශේෂයෙන් මූල්‍යමය හැකියාව) හැකියාව තිබේදැයි යන්න විමර්ශනය කිරීමෙන් පසුවය. පවතින සියළු විවාහ, විවාහ ලියාපදිංචි කිරීමේ ආකෘති තුළ අනිවාර්යයෙන් නියම කර තිබිය යුතුය.**

# 6. නඩත්තු

## 6.1. වෙන්ව වෙසෙන කාලය තුල නඩත්තු

**භාර්යා නඩත්තු සඳහා ප්‍රතිපාදන:** මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 47 වන වගන්තිය යටතේ, සැමියා නඩත්තු ගෙවීමේ වගකීම පැහැර හරින්නේ නම් (එනම් එසේ කළ නොහැකි හෝ අකමැති වූ විට) භාර්යාව විසින් ඇයට ලැබිය යුතු නඩත්තුව ලබාගැනීම පිණිස කාති උසාවියෙහි අයදුම්පතක් ගොනු කළ හැකිය. නඩත්තුවට හිමිකම් කීම පිණිස "යුක්ති සහගත හේතුවක්" මත කාන්තාවක් සිය සැමියාගෙන් වෙන්වී සිටිය යුතුය[45]. අධ්‍යයනයට සහභාගිවූ කාතිවරයා සහ කාති මණ්ඩලයේ සාමාජිකයින්ට අනුව, නඩත්තු ගෙවීම් පැහැර හැරීම, කාති උසාවිය ඉදිරියේ නඩු සඳහා පෙනී සිටීමට මූලික හේතුවක් වේ.

**ළමා නඩත්තු සඳහා ප්‍රතිපාදන:** මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ පිරිමියෙකු විසින් (සුජාත වූ හෝ විවාහයකින් තොරව උපන් යන දෙකෙහිම) තම දරුවන් නඩත්තු කිරීමට බැඳී සිටියි. ළමා නඩත්තුවට අදාළව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 35 වැනි වගන්තිය ප්‍රකාශ කරනුයේ, ළමයෙකු සිය පියා සමග ජීවත්වන හෝ නඩත්තු කරන කාලය තුළ, දරුවෙකුට හෝ ඔහු/ඇය වෙනුවෙන් වෙනත් කෙනෙකුට හෝ, නඩත්තු ඉල්ලීමට හෝ ලබාගැනීමට හිමිකම් නොමැති බවය. දරුවෙකු වෙනුවෙන් පියෙකුගේ වගකීම දරුවාට වයස අවුරුදු 21 ක් වනතුරු පමණක් බව නියම කෙරෙන සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත මෙන් නොව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත එවැනි වයසක් නියම නොකරයි.

**ගැටළු සහ ප්‍රතිවිපාක:** නඩත්තු සඳහා කොන්දේසි වලට සම්බන්ධව මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු සහගත ප්‍රතිපාදන ඇත. ප්‍රථමයෙන්ම, භාර්යාවට නඩත්තු නොලැබුනත්, ඇය සැමියා සමග ජීවත්වන/ ජීවත්ව සිටි කාලය නඩත්තුවලට හිමිකම් කියන කාලයෙන් බැහැර කරයි. එම නිසා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපණතෙහි මෙන්, සිය සැමියා සමග ජීවත්වන කාලය තුළ කිසිම සහයෝගයක් නොලබන කාන්තාවන් හට, නඩත්තු සඳහා නඩු දැමිය නොහැකිය. දෙවනුව, මුස්ලිම් විවාහ දික්කසාද පණතෙහි පෙන්වා දෙන පටිපාටියට අනුව, භාර්යාවන් හට නඩත්තු ඉල්ලිය හැක්කේ අයැදුම් කළ දිනයේ සිට මිස ඇයගේ නඩත්තු නතර කළ කාලයේ සිට නොවේ.

දරුවන් නිසි ලෙස රැක බලා නොගත්තත්, දරුවන් පියා සමග ජීවත් වන්නේ නම්, ළමා නඩත්තු වලට හිමිකම් කීමට බැරිවෙන ළමා නඩත්තු සඳහාද ඉහත ප්‍රතිපාදන අදාළ වේ.

බලපෑමට ලක්වූ කාන්තාවන් සමග සමීපව කටයුතු කරන කාන්තා අයිතීන් පිළිබඳ සංවිධාන වලින් නිරීක්ෂණය කළ පොදු සිදුවීමක් නම්, කාති වරුන් නඩත්තු මුදල ගැන අත්තනෝමතික ලෙස තීරණය කරන බවයි. ඔවුහු

[45] Kodikara, Chulani, 2011. *"Muslim Family Law in Sri Lanka: Theory, Practice and Issues of Concern to Women"*. Muslim Women's Research and Action Forum (MWRAF), Sri Lanka

නිතරම ප්‍රමාණවත් නොවන මුදලක් නියම කර, කාන්තාවන් අභියාචනා කළත් එය වැඩි කිරීමට මැලි වෙති. තවද, සමහර විට සැමියා යම් ප්‍රමාණයක් ගෙවීමට එකඟ නොවුන හොත්, ඔවුහු එය අඩු කරති. සාමාන්‍ය විවාහ ලියා පදිංචි කිරීමේ ආඥා පණත යටතේ මාසික නඩත්තු තීරණය කිරීමට මහේස්ත්‍රාත් වරුන් භාවිතා කරන පොදුවේ එකඟ වුනු ක්‍රම ඇත. මෙය සැමියාගේ ආදායම මත අවිනිශ්චිත වේ. එහෙත් බෙහෝ කාතිවරු මෙවැනි පද්ධති අනුගමනය නොකරති.

සැමියාගෙන් ලද නඩත්තු කාතිවරුන් විසින්ම අත් හිටුවා, ඒවා ඔවුන්ගේම අරමුණු වෙනුවෙන් භාවිතා කර, වෙනත් දිනයක එය ලබා ගැනීමට පැමිණෙන ලෙස භාර්යාවගෙන් ඉල්ලා ඇති සිද්ධීන්ද පවතී.[46] මෙයින් පෙන්වන්නේ අධිකරණ සේවා කොමිසම වැනි ආයතන විසින් පත් කරන කාති අධිකරණ මගින් මුදල් පරිපාලනය කරන අන්දම ගැන දැඩි අධීක්ෂණයක් නොමැති කමය. මෙය සාමාන්‍ය විවාහ ලියා පදිංචි කිරීමේ ආඥාපණත යටතේ අධිකරණය විසින් නඩත්තු හසුරුවන ආකාරයට හාත්පසින්ම වෙනස් වේ.

**බලාත්මක කිරීමේ නියෝග:** සැමියෙකු විසින් ඔහුගේ නඩත්තු ගෙවීම පැහැර හරින අවස්ථාවකදී, මහේස්ත්‍රාත් උසාවියෙන් බලාත්මක කිරීමේ නියෝගයක් ලබාගැනීමට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 66 වැනි වගන්තියෙන් කාතිවරයා හට අවසර ලබාදේ. කෙසේවෙතත්, නඩත්තු සැපයීමට සැමියන්ට ඇති අනිවාර්ය වගකීම ගැන සහ බලාත්මක නියෝග ලබාගැනීමේ ප්‍රතිපාදන ගැන කාතිවරුන් නොදැනුවත්ව සිටි අවස්ථා ඇත. මේ හේතූන් නිසා, නඩත්තු ගෙවීමට සැමියන් හට ඇති නොහැකියාව ගැන ඔවුන්ට ඒත්තු ගැන්වීමට ඉඩදුන් හෝ අප්‍රමාණවත් මුදලක් ගෙවීමට ඉඩදුන් අවස්ථා ඇත. මෙවැනි බොහෝ අවස්ථාවලදී කාන්තාවන්ට බලාත්මක නියෝග ලබාගැනීමට බලකරන ලද්දේ කාන්තා සංවිධාන මගිනි.

කෙසේවෙතත්, බලාත්මක කිරීමේ නියෝග ලබාගන්නේ සැමියා පදිංචි ස්ථානයෙහි පිහිටි මහේස්ත්‍රාත් උසාවියෙනි. මේ මගින් කාන්තාවන්ට අමතර බරක් පැටවේ. උසාවිය ඇත්තේ, වෙනත් දිස්ත්‍රික්කයක නම්, නඩත්තු ලබාගන්නා කාන්තාවන් හට රු. 3000 - 5000 /- වැනි කුඩා ප්‍රමාණවල නඩත්තු ලබාගැනීම සඳහා දුර ගෙවා නිතර යා යුතුවේ. මේ නිසා මුදල් සහ කාලය සැළකිය යුතු ප්‍රමාණයක් ගමන් සඳහා වැය කිරීමට සිදුවේ. සාමාන්‍යයෙන් කාන්තාවෝ මෙම ක්‍රියාවලිය ගැන බොහෝ සේ කළකිරීමට පත්ව, එම නිසාම, නඩත්තුවට ඇති සිය අයිතිය අත්හැර දමති.

**සිද්ධි අධ්‍යයනය:** නැගෙනහිර පළාතේ වයස අවුරුදු තුනක් සහ මාස 11 ක් වයසැති දරුවන් දෙදෙනෙක් සිටින තරුණ විවාහක කාන්තාවක් ඇගේ විවාහය තුළ දැඩි අමාරුකම්වලට මුහුණ දුන්නාය. දෙවැනි භාර්යාවක් සිටි ඇගේ සැමියා, ඇයගේ දරුවන්ට හෝ ඇයට කිසිම නඩත්තුවක් හෝ මූල්‍යමය සහයක් නොදුන්නේය. කාන්තාව නඩත්තු නඩුවක් ගොනුකිරීමට ප්‍රදේශයේ කාති උසාවියට ගිය නමුත්, ඇගේ සැමියා ලවා නඩත්තු ගෙවීම් කරවීමට වෙනත් විකල්පයක් තිබේදැයි මෙම කාන්තාව කාතිවරයා ගෙන් විමසූ විට ඔහුගේ ප්‍රතිචාරය වුයේ, "ඔබගේ ගෙදර දරුවන් වෙතට ගොස්, ඔවුන්ගේ ගෙල මිරිකා මරා දමන්න. නමුත් නඩත්තු ඉල්ලමින් මෙහි එන්න එපා" යන්නයි. මැදහත්වීමේ කරුණුවලදී ප්‍රජාවට සහාය දක්වන්නේයැයි දැන සිටි දිස්ත්‍රික් ලේකම් හට ඇය ඉන්පසු පැමිණිලි කළාය. මේ කාරණය ගැන සොයාබලන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් කාතිවරයා හට සටහනක් යවන ලදී. කෙසේවෙතත්, මෙම සටහන කියවූ කාතිවරයා තවදුරටත් කලබල වී කාන්තාවට බැණ වැදීමට පටන්ගෙන, මොන යම් හේතුවක් මත හෝ එම කාන්තාව හට නඩත්තු ලබාගැනීමට ඔහු ඉඩ නොතබන බව පැවසීය.

## 6.2. දික්කසාද කාලය තුළ සහ ඉන්පසු නඩත්තු

### 6.2.1. *ඉද්දා නඩත්තු*

*ඉද්දා* කාලය යනු දික්කසාදයෙන් පසු හෝ සැමියාගේ මරණයෙන් පසු රැඳී සිටීමේ කාලයකි. එය ඔසප් චක්‍ර තුනක් (මාස තුනක්) හෝ ඒ වනවිට ගැබිණියක් නම් දරුවා බිහිකරන තුරු කාලය වේ. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අනුව, භාර්යාවට *ඉද්දා* කාලය තුළ නඩත්තුවලට මෙන්ම තිඹිරිසමයට (ගැබිණි කාලයට) අදාළ වියහියදම්වලට හිමිකම් පවතී[47].

### 6.2.2. *මතාහ්* (දික්කසාද දීමනාව)

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ භාර්යාව සඳහා හෝ ඇය ගර්භණී නම් තිඹිරි (ගැබිණි) වියහියදම් ලෙස මාස තුනක *ඉද්දා* නඩත්තු ලබාගැනීම සඳහා පමණක් ප්‍රතිපාදන ඇත. අනෙකුත් රටවල සිරිතට අනුව, සමහර කාතිවරුන් *තලාක්* දික්කසාදයකදී *මාතා* ගෙවීම එක්වර ගෙවන වන්දියක් ලෙස ගෙවීමට සැමියන් හට

46 Case 13 - Gul, Begum Safana, 2014. *'Is Equal Justice Possible',* Islamic Women's Association for Research and Empowerment (IWARE), Batticaloa, Sri Lanka

47 Section 47(1)(d), 1951 Muslim Marriage and Divorce Act (MMDA)

නියෝග කර ඇත. කෙසේවෙතත්, මෙය සමහර කාතිවරුන් ඔවුන්ගේ අභිමතය පරිදි සිදුකරන අත්තනෝමතික සිරිතක් මිස, මේ සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නියම කළ ප්‍රතිපාදන නොමැත.

**ගැටළු සහ ප්‍රතිවිපාක:** කාන්තාවන් සඳහා විශේෂයෙන් *තලාක්* දික්කසාදයකට පසු, මුදල් වන්දි ආකාරයෙන් *මතාහ්* දීමනා සඳහා කාතිවරුන් විසින් නියෝග කළ අවස්ථා ඇති අතර, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ අනිවාර්ය ප්‍රතිපාදන නොමැතිවීම *මාතා* දීමනා අත්තනෝමතික සහ තනි කාතිවරයාගේ අභිමතය මත රඳා පවතින්නන් කරයි. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ මේ සඳහා කිසිම ප්‍රතිපාදනයක් නොමැති පදනම මත, හිටපු සැමියෙකු *මතාහ්* දීමනාව ගෙවීමට නියම කල කාතිවරයෙකුට අභියෝග කළ නඩුවක් දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතී[48].

සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ, දික්කසාදයක් හෝ වෙන්වීමක් සිදුවන විට, අධිකරණය මගින් තීන්දු කරන පරිදි, එක්වර ගෙවිය හැකි, හෝ වාර්ෂික හෝ මාසික වාරිකවලින් ගෙවිය හැකි මුදල් වන්දි/දික්කසාද දීමනා[49] වලින් කාන්තාවට ආරක්ෂාව සැපයේ. එමනිසා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණතට ප්‍රතිවිරුද්ධව, දික්කසාදයට පසු සහකාරියන් හට ලබාදෙන ආරක්ෂාව සහ මූල්‍යමය සහාය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ නොලැබේ.

*තලාක්* දික්කසාදයක් සිදුවන බොහෝ අවස්ථාවලදී, දික්කසාද කිරීමට සැමියා තුල ඇති අදහස ගැන කාන්තාව දැනගන්නේ කාතිවරයාගෙන් හෝ දික්කසාදවීමේ අදහස ප්‍රකාශ කරන අවස්ථාවේදීය. මේ නිසා, දික්කසාදය සඳහා මුළුමනින්ම සූදානමක් නොමැති තත්ත්වයකට ඇය පත්වේ. සැමියන් විසින් කාතිවරුන්ගේ නියෝග පරිදි නඩත්තු නොගෙවන අවස්ථා[50] ඇත.

බාල වයස්කාර විවාහ, අධ්‍යාපනය සහ රැකියා අවස්ථා සීමාකිරීම් මගින්, මුස්ලිම් කාන්තාවන් හට ආර්ථික සහාය සඳහා ඔවුන්ගේ සැමියන් මත යැපීම වැඩිකිරීමට දායක වන අතර, දික්කසාදයෙන් පසු ඔවුන් නිතර අවදානම් තත්ත්වයන්ට වැටේ. මෙය විශේෂයෙන් මාස තුනක *ඉද්දා* කාලය (ගැබිණි මවක් නම් තවත් දිගු කාලයක්) පිළිපදින කාන්තාවන් සඳහා විශේෂයෙන් සත්‍ය වේ. *ඉද්දා* නඩත්තුව නිතරම අවම වන අතර, "*ඉද්දා* " කාලය තුළ, කාන්තාවන් පදිංචි නිවසින් පිටතට යාමෙන් වැළකීම හෝ ආසන්නම පවුල් සාමාජිකයන් නොවන අය සමග සම්බන්ධකම් පැවැත්වීමෙන් වැළකී සිටීම අවශ්‍ය කෙරේ. *ඉද්දා* කාලයෙන් පසු කාන්තාවන් මුහුණදෙන මූල්‍යමය අපහසුතා පිළිබඳ ගැටළු කාතිවරයා සමග මතු කළ පසු, සාමාන්‍යයෙන් ප්‍රතිචාරය වන්නේ, දික්කසාද වූ කාන්තාවන් හට ඇයව නඩත්තු කළ හැකි වෙනත් සැමියෙකු සොයාගත හැකි නිසා, *ඉද්දා* නඩත්තුව පමණක් ගෙවීම ප්‍රමාණවත් වන බවයි.

දික්කසාදය වන විට කාන්තාව ගර්භණී වුවහොත්, ඇය ප්‍රසූතිය හමාර කළ විගස නඩත්තු ගෙවීම නවතී. කෙසේවෙතත්, ඇයට මූල්‍යමය සහාය අවශ්‍ය වන්නේ, විශේෂයෙන් ඇය රැකියා විරහිත නම් වහාම ප්‍රසූතියට පසු කාලය තුළය. දික්කසාදයට වහාම පසුව එන කාලය තුළ, විශේෂයෙන් දරු ප්‍රසූතියකට පසු, කාන්තාවන් හට ජීවනෝපාය අවස්ථා සොයාගැනීම සඳහා ඇති විකල්ප ඉතා අල්ප වේ.

**ඉල්ලීම : අවම වශයෙන්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය විසින්, සියළු වර්ගයේ නඩත්තු ගණනය කිරීම පිණිස ප්‍රතිපාදන සහ උපදෙස් සඳහා විශේෂිත කොන්දේසි නියම කිරීමට, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සඳහා නිර්දේශ කළ යුතු අතර, එය කාතිවරයාගේ අත්තනෝමතික තීරණ ගැනීමට නොහැරිය යුතුය. නඩත්තු ගෙවීමේදී නඩත්තු ගෙවීම නැවැත්වූ කාලයේ සිට නඩත්තු ආපසු ලබාගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු අතර, එය අයදුම්පත ගොනුකළ දිනයේ සිට ගෙවිය යුතුය. මෙය නඩත්තු ගණනය කිරීම සඳහා වඩාත් ශක්තිමත් ආකාරයකට ඉඩදෙන අතර, කාතිවරයාගේ අභිමතය සහ පක්ෂපාතිත්වය සීමා කරයි. නඩත්තු ආපසු ලබාගැනීම සඳහා ඵලදායී ක්‍රමයක් තිබිය යුතු අතර, මෙයට සැමියා/දරුවන්ගේ පියා විදේශගතව සිටින අවස්ථාද ඇතුළත් විය යුතුය.**

---

48 Fathima Minnah vs. Tuan Muthalif Tuan Nazar SC SPI LA 174/13

49 Section 615: (1), Civil Procedure Code of Sri Lanka: "*The court may, if it thinks fit, upon pronouncing a decree of divorce or separation, order for the benefit of either spouse or of the children of the marriage or of both, that the other spouse shall do any one or more of the following:- (a) make such conveyance or settlement as the court thinks reasonable of such property or any part thereof as he may be entitled to ; (b) pay a gross sum of money;*
*(c) pay annually or monthly such sums of money as the court thinks reasonable; (d) secure the payment of such sums of money as may be ordered under paragraph (b) or paragraph (c) by the hypothecation of immovable property or by the execution of a bond with or without sureties, or by the purchase of a policy of annuity in an insurance company or other institution approved by court. (2) The court may at any stage discharge, modify, temporarily suspend and revive or enhance an order made under subsection (l)"*

50 Cases 2, 16, 17, 20: Gul, Begum Safana, 2014. *'Is Equal Justice Possible',* Islamic Women's Association for Research and Empowerment (IWARE), Batticaloa, Sri Lanka

# 7. කාතිවරු

ශ්‍රී ලංකාවේ කාති අධිකරණ 65 ක් ඇත. මුස්ලිම්වරුන් අධික ගහණයන් ජීවත්වන පෙදෙස්වල වැඩි අධිකරණ සංඛ්‍යාවක් ඇත. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 12 වන වගන්තියෙන් යම් පෙදෙසක කාතිවරයෙක් ලෙස "යහපත් චරිත සහ යම් සුදුසුකමක් ලබාගෙන ඇති පිරිමි මුස්ලිම්වරුන්" පත් කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවට බලතල පැවරේ. මෑතකදී ශ්‍රේෂ්ඨාධිකරණයෙහි රෙගුලාසියකින් කාතිවරුන්ගේ අත්පත් කර ගැනීම් (ලබාගෙන ඇති යම් දේ) වලට නීතිඥයින්, මවුලාවි හෝ ආලිම් (ආගමික විද්වතෙක්), මාණ්ඩලික ශ්‍රේණියක විශ්‍රාමික රාජ්‍ය නිලධාරියෙක්, සහ/හෝ උපාධිධරයෙක්[51] ඇතුළත් කිරීමට නියම කෙරිණි. කෙසේවෙතත්, භාවිතයේදී මෙම අත්පත් කර ගැනීම් වලට නොගැලපෙන පුද්ගලයින් කාතිවරුන් ලෙස පත්කර ඇත. බොහෝ කාතිවරුන් මුස්ලිම් දේවස්ථාන කමිටු වලින් සහ මුස්ලිම් දේවස්ථාන සම්මේලන වලින් නිර්දේශ කිරීමෙන් පසුව හෝ, දේශපාලනික සම්බන්ධතා හරහාද, පත්කර ඇත.

## 7.1. කාතිවරුන් සඳහා යෝග්‍ය සුදුසුකම් සහ ප්‍රතිපාදන නොමැතිකම

අධිකරණ සේවා කොමිෂන් සභාවට අනුව, සීමිත වැටුප් සහ සම්පත් ප්‍රතිපාදන හේතුවෙන් කාතිවරුන් සොයාගැනීමේදී සැළකිය යුතු අභියෝග පවතී. මීට අමතරව, සමහර පෙදෙස්වල පෙර සිටි සමහර කාතිවරුන් අල්ලස් ගැනීම සහ දූෂිත වීම පිළිබඳව ප්‍රසිද්ධ වීම නිසා, සමහර සුදුසුකම් ඇති පුද්ගලයෝ කාති තනතුරු සඳහා අයදුම් කිරීමට අකමැති වෙති. මෙහි ප්‍රතිඵලය වශයෙන්, තත්කාර්ය පත්වීම් සිදුකර ඇත. එවැනි උදාහරණයක් නම්, කල්කුඩා හි සිදුකළ පත්වීමක, තනතුර පිරවීමට බොහෝ උත්සාහ දැරීමෙන් පසු, කාතිවරයා ලෙස හිටපු කාතිවරයාගේ කාර්යාල සහායක පත්කිරීම ගෙන හැර දැක්විය හැක.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝජිතයෙකුගේ වචනවලින් කිවහොත් –

> *"මාස කිහිපයකට පෙර පෙදෙස් 6 ක කාති තනතුරු සඳහා දැන්වීමක් ගැසට් කරන ලදී. තවමත් හම්බන්තොට සහ හැටන් සඳහා කිසිම අයදුම්පතක් අප වෙත ලැබී නොමැත. සාමාන්‍යයෙන් සමහර පෙදෙස්වල තරඟයක් නොමැති බැවින්, අධිකරණ සේවා කොමිෂන් සභාව සුදුසු යැයි සැළකෙන සහ කැමැත්තක් දක්වන කෙනෙක් පත් කරයි. ගැටළුව වන්නේ වැටුප අඩු නිසා (මසකට රු.6000 ක් පමණි) සුදුසුකම් ඇති පුද්ගලයෝ අයැදුම් නොකරති. තවද කාතිවරයා එම ප්‍රදේශයෙන්ම වීමද අවශ්‍ය වන නමුත්, ඔවුන්ගෙන් බොහෝදෙනෙකුට එම පෙදෙස්වල නෑදෑයින් සහ පවුල් සිටින නිසා, අයැදුම් කිරීමට අකමැති වෙති. සමහර පෙදෙස්වල කාතිවරුන්, නැතහොත්, මෙම ක්‍රමය කෙතරම් දූෂිතද කිවහොත්, වැදගත් පුද්ගලයෝ තනතුර සඳහා අයැදුම් කිරීමට අකැමති වෙති."*

හම්බන්තොට කාති තනතුර වසර එකහමාරකට වඩා හිස්ව ඇති බව අධ්‍යයනය තුළදී සඳහන් කෙරිණි. කොළඹ දකුණ වැනි අන් පෙදෙස්වල පසුගිය මාස 18 ඇතුළත කාතිවරයා කිහිපවරක්ම වෙනස් වී ඇත. තවද අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝජිතයා පැවසුවේ, කාතිවරුන් සඳහා විශ්‍රාම යාමේ වයසක් නොමැති බැවින් සමහර කාතිවරුන් හට ඔවුන්ගේ වයස සහ සෞඛ්‍යය ගැටළු නිසා, ඔවුන්ගේ යුතුකම් ඵලදායි ලෙස ඉටුකිරීමට අපහසු වන අතර, අධිකරණය තුළ දීර්ඝ පැය ගණන් තුළ පෙනී සිටීමට නොහැකි බවයි.

## 7.2. සංවේදීතාව නොමැතිකම සහ කාතිවරුන්ගේ නුසුදුසු හැසිරීම් සහ ආකල්ප

කාති අධිකරණ පද්ධතිය පිළිබඳව පවතින ප්‍රධානම ගැටළු සහගත ප්‍රශ්නය වන්නේ, අධිකරණය පරිශීලනය කරන කාන්තාවන් කෙරෙහි බොහෝ කාතිවරුන්ගේ හැසිරීම සහ ආකල්පයයි. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝජිතයාට අනුව, පැමිණිලි වැඩිම සංඛ්‍යාව ලැබී ඇත්තේ කාන්තාවන් සහ ගැහැණු දරුවන් කෙරහි කාතිවරුන්ගේ නුසුදුසු සහ අසංවේදී හැසිරීම පිළිබඳවය. දික්කසාද වීමට හෝ නඩත්තු නියෝග ඉල්ලන කාන්තාවන්ට දක්වන සැළකිල්ල ඔවුන්ට එරෙහිව අගතිගාමී වී ඇති බොහෝ අවස්ථා ගැන කාන්තා සංවිධාන සටහන් කරති. සමහර කාතිවරු කාන්තාවන්/ භාර්යාවන් ගේ නිශ්චිත භූමිකා ගැන මුල් බැසගත් මත පවත්වා ගනිමින්, දික්කසාදයට එරෙහිව සහ/හෝ බහුභාර්යත්වය වැනි භාවිතයන්ට පක්ෂ වෙති. මෙම අගතිගාමී නැඹුරුව සහ වෘත්තීමය පුහුණු නොමැති කම කාන්තාවන්ට එරෙහි පූර්ව මත සහිත විනිශ්චයන්ට දායක වේ. උදාහරණයක් වශයෙන් සිය සැමියන් වෙතින් ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සහ කෲර සැළකිලිවලට මුහුණ දී ඇති කාන්තාවන් සහ ගැහැණු ළමයින් නිතරම කාතිවරුන් විසින් නිෂ්ප්‍රභ කර, ඔවුන්ගේ සැමියන්ගේ එම සැළකිලි ඉවසන ලෙස ඉල්ලති.

51 Personal Interview Judicial Service Commission Representative, March 2016.

**සිද්ධි අධ්‍යයනය:** 2014 දී, නැගෙනහිර පළාතේ අවුරුදු 14 ක් වයසැති ගැහැණු ළමයෙකු පාසැල් යාම නවත්වා විවාහ කර දෙන ලදී. ඇගේ සැමියාගෙන් සිදුවූ දැඩි ලිංගික වධ හිංසා නිසා ඇය විවාහ වී මාස කිහිපයකට පසු *ෆසා* දික්කසාදයක් සඳහා අයැදුම් කළාය. කාතිවරයා සංවේදීව සහ උචිත අන්දමින් නඩුව ගැන සොයා බලනවා වෙනුවට, තෝරාගත්තේ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව විශේෂ විස්තර ගැන පැය දෙකකට වඩා ඇගෙන් ප්‍රශ්න කිරීමටය. මේ හේතුවෙන් ඇය තවදුරටත් දැඩි මානසික වධහිංසනයට ලක්වීම නිසා සිය දිවි හානිකර ගැනීමට උත්සාහ කළ අතර, ප්‍රබල මානසික අවපීඩනයකට මුහුණු දුන්නාය.

කාතිවරුන් හට අධිකරණය පැවැත්විය යුතු ලෙස ස්ථාවරව නියම වී ඇති, වැඩකිරීමේ සතියක් (දින සහ පැය) නොමැත. කාන්තා සංවිධානවලට අනුව, සමහර කාතිවරු ඔවුන්ගේ නිවාස තුළ රාත්‍රි කාලයේ නුසුදුසු පැය වල අධිකරණ පවත්වති. මෙය කාති අධිකරණවල පිහිට පතන කාන්තාවන් හට අතිරේක දුෂ්කරතා ඇතිකරයි. සමහර පෙදෙස්වල කාතිවරුන් විසින් ධනවත් පුද්ගලයින් වෙනුවෙන් පැමිණිය යුතු වේලාවල් සහ ස්ථාන පිළිබඳව වැඩි නම්‍යතාවක් පෙන්වීම පොදුවේ සිදුවන්නකි. මඩකළපුවේ එක් කාන්තා ක්‍රියාකාරිනියක් පැවසූ පරිදි "දුප්පතුන් කාති අධිකරණය වෙත යන අතර, ධනවතුන් හට ඔවුන්ගේ අනන්‍යතාව සහ අභිමානය රැකගැනීම පිණිස කාතිවරයා ඔවුන්ගේ නිවෙස්වලට යයි". මෑතකදී වූ සිද්ධියකදී, කාතිවරයා විසින් වගඋත්තරකරුව කාති අධිකරණයට කැඳවීම ප්‍රතික්ෂේප කරන ලදී. ඔහු පැවසුවේ "මොහු (සැමියා) ධනවත්ය, මුස්ලිම් දේවස්ථානයට බොහෝ අරමුදල් ලබාදෙන්නෙකි. තවද, දේශපාලඥයින් අතර ඉමහත් බලපෑමක් ඇති නිසා, ඔහුව කාති අධිකරණයට කැඳවීම නුසුදුසුය" යන්නයි. මෙම සිද්ධියේදී සැමියාගේ හිංසා ඉවසා සිටින ලෙසටද, ඇගේ සැමියා වෙත ආපසු ගොස් ජීවත්වන ලෙසටද, කාතිවරයා විසින් බිරිඳට උපදෙස් දෙන ලදී.

කාති අධිකරණ පද්ධතියෙහි ක්‍රියාකාරිත්වය ගැන රාජ්‍ය අධීක්ෂණය හෝ නියාමන යාන්ත්‍රණයක් නොමැතිවීම නිසා අධිකරණ සේවා කොමිෂන් සභාවට යොමුකෙරෙන පැමිණිලි වලට අමතරව, රජය විසින් අධීක්ෂණය සහ නිවැරදි කිරීම් ලබාදිය හැකි වෙන යම් මාර්ගයක් නොමැත.

කාතිවරුන් පිළිබඳව අතිශයින් සිත් සසල කරවන සිදුවීම්ද ඇත. කාති අධිකරණය ඉදිරිපිට පෙනී සිටින එක් පාර්ශ්වයකින් හෝ පාර්ශ්ව දෙකින්ම අල්ලස්ගෙන, එම පාර්ශ්වයන්ගේ අපේක්ෂිත ප්‍රතිඵලය මත නඩු තීන්දු දෙන අවස්ථා තිබී ඇත. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ අධිකරණ සේවා කොමිෂන් සභාවෙහි නියෝජිතයාද පැවසුවේ, අල්ලස් චෝදනා සහ පැමිණිලි එය වෙත ලැබුණත්, යම් ආකාරයක විමර්ශනයකින් පසු කාතිවරුන් සේවයෙන් පහ කිරීම හැර නීතිමය පියවර ගැනීමට අධිකරණ සේවා කොමිසන් සභාවට බලය පැවරී නැති බවය. අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ගෙන එන පැමිණිලි කෙතරම් දුරට ඒ මගින් විමර්ශනය සඳහා පසුපස යන්නේද සහ අදාළ කාතිවරුන් ගැන ගන්නා පසුවිපරම් ක්‍රියාකාරිත්වයෙහි ස්වභාවය ගැනද මේ අවස්ථාවෙහි අපැහැදිලිතාවයක් පවතී.

## 7.3. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත, ක්‍රමවේදයන් සහ අධිකරණ බලය ගැන පවතින සුවිශේෂී පරතරය (හිදැස)

කලින් කලට පුහුණුවීම් ලබාගන්නා ජාතික අධිකරණවල අනෙකුත් අධිකරණ නිලධාරින් මෙන් නොව, කාතිවරුන් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන හෝ චර්යා ධර්ම සංග්‍රහය සහ සමාජ චාරිත්‍ර විධි ගැන විධිමත්, ව්‍යුහගත සහ අනිවාර්යයෙන් කෙරෙන පුහුණුවීම් නොමැත. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන පූර්ව දැනුම හෝ ඒ සමග කටයුතු කිරීමේ අත්දැකීම් තිබීම කාතිවරයෙක් වීම සඳහා අවශ්‍ය නොකෙරෙන බැවින්, එය විශේෂයෙන් ගැටළු සහගත වේ. මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය (Muslim Women's Research and Action Forum-MWRAF) වැනි සිවිල් සමාජ සංවිධාන වසර කිහිපයක් තුළ වසරකට වරක් පුහුණුවීම් පැවැත්වුවද, සේවයෙන් ඉවත්වීමේ අනුපාතය වැඩි නිසා, පුහුණුව ලද බොහෝ කාතිවරුන් අනුගාමී පුහුණු සඳහා ලබාගත නොහැකි විය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ කාතිවරුන් තනතුර ලබාගෙන එහි කාර්යයන් ඉටුකරන්නේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන අල්ප, නැතහොත්, කිසිදු දැනුමක් නොමැතිවය. මේ නිසා එහි දක්වා ඇති ප්‍රතිපාදන සහ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීමට ඔවුන්ට නොහැකි වේ. තවද ලිපිගොනු පවත්වාගෙන යාම සහ නඩු තීන්දු වාර්තාගත කිරීම පිළිබඳව සියළුම කාතිවරුන් විසින් අනුගමනය කරන ප්‍රමිතිගත පද්ධතියක් නොමැත. එමෙන්ම ස්ථාන මාරුවීම් සහ ඉල්ලා අස්වීම් වැනි අවස්ථාවලදී, වැඩ භාරදීමේ පටිපාටියක් නොපවතී.

සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ කාතිවරයෙක් පැවසුවේ, ඔවුන් වැඩ භාරගන්නා විට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි පිටපතක් නිල වශයෙන් නොලද බවය. බොහෝ කාතිවරුන් ඔවුන්ගේ නෛතික අධිකරණ බලයෙහි ක්ෂේත්‍ර (විෂය) සහ එයට ඇති සීමාවන් ගැන දැනුවත් වී නැත. සමහර කාතිවරුන් ඔවුන්ගේ අධිකරණ බලයෙන් ඔබ්බට පවතින, ළමා ආරක්ෂාව, *කයිකූලි* (දෑවැද්ද) ආපසු ලබාගැනීම සහ *මතා* (භාර්යාව සඳහා වන්දි) වැනි කාරණාවලදී තීන්දු ලබාදෙති.

## 7.4. කාන්තාවන් හට වෘත්තීන් සඳහා ඉඩනොදීම

ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන් හට අධිකරණ නිලධාරීන් සහ විනිසුරුවරියන් ලෙස නෛතික වෘත්තීන් පසු පස යාම ගැන රාජ්‍ය අධිකරණ පද්ධතිය තුළ සීමා කිරීම් නැතත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අනුව ඔවුන්ට කාතිවරුන්, කාති මණ්ඩලයේ සාමාජිකයින්, අභිනිර්ණකයින් (විනිශ්චය කරන්නන් - adjudicators) හෝ විවාහ රෙජිස්ත්‍රාර්වරුන් විය නොහැක. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි 'මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීම' ගැන ඇති 8 වන වගන්තිය, කාතිවරුන් ගැන ඇති 12 වන වගන්තිය සහ කාති මණ්ඩලයේ සාමාජිකයින් ගැන ඇති 15 වන වගන්තිය යන මේ සියල්ලම මෙම අදාළ තනතුරු 'පිරිමි මුස්ලිම්' වරුන්ට සීමා කරයි. මෙම සීමාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සුදුසුකම් ඇති මුස්ලිම් කාන්තාවන් හට මෙම තනතුරුවලට අයැදුම් කළ නොහැක.

### 'කාන්තා කාතිවරියන්'ගේ ගැටළුව සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ කාන්තාවන් හට කාතිවරුන් විය හැකිද නැද්ද යන්න ගැන ප්‍රතිපාදන, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණවලට අදාළව පවතින අතිශයින්ම මතභේදාත්මක සහ අතිශයින් වාදයට ලක්ව ඇති ගැටළුව වේ. ප්‍රබල ගතානුගතික කණ්ඩායම් සහ පුද්ගලයෝ කාන්තා කාතිවරියන්ට එරෙහිව පහත සඳහන් හේතූන් ප්‍රකාශ කරති:

සමහර ආගමික නායකයින් සහ ගතානුගතිකයින් ලබාදී ඇති ප්‍රත්‍යක්ෂ 'ඉස්ලාමීය' හේතු:

1. ඉස්ලාමීය ඉතිහාසයෙහි කාන්තා නායකයින් ගැන සාක්ෂි නොමැතිය;
2. වෙන්කර තැබීමේ (විසංගමනය - practice of segregation) සිරිතෙන් කියාපාන්නේ කාන්තාවන් හට තමාට කිට්ටු සම්බන්ධකම් නැති පිරිමින් සමග අන්තර්ක්‍රියා කළ නොහැකි බවය;
3. කාන්තාවන්ගේ සාක්ෂිය පිරිමියෙකුගේ සාක්ෂියෙන් අඩක් වන බවට ඉස්ලාමීය නීතියෙහි සමහර අර්ථ දැක්වීම් යටතේ පවතින අවබෝධය;
4. ආගමික පෙළ පොත්වලට අනුව, කාන්තාවන් හට නායකත්ව තනතුරු දැරීම තහනම්ය යන අවබෝධය.

ප්‍රත්‍යක්ෂ ජීව විද්‍යාත්මක හේතු:

- සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ එක් කාතිවරයෙක් පැවසූ පරිදි, කාන්තාවන් හට ඔවුන්ගේ ඔසප්කාලය තුළ ඔවුන්ව "චිත්තවේගාත්මක සහ බුද්ධි හීන (irrational)" කරන නිසා, කාන්තාවන්ට විශ්වාශනීය ලෙස විනිශ්චය කිරීමට/ලබාදීමට නොහැකිය යන ප්‍රසිද්ධ මිථ්‍යා ප්‍රබන්ධයක්.

මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුවෙහි සාමාජිකයෙකුට අනුව, කාන්තා කාතිවරියන් ගැන ගැටළුව ප්‍රමුඛතාවයක් නොවන්නේ විශේෂයෙන්ම එය "මුළු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියම අවහිර කරන එකම ගැටළුව" ලෙස දැකීමය. ඉන්දුනීසියාව සහ මැලේසියාව වැනි රටවල් කාන්තා කාතිවරියන් සාධාරණීකරණය කිරීම සඳහා ඉස්ලාම් ආගම තුළ පවතින විකල්ප භාවිතා කර පවුල් නීතිය ප්‍රතිසංස්කරණය කළ බවට පවතින සාධකය, "එය ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට අදාළ නොමැති බව" කියා නිතරම ඉවත දමති. සමහර උලමාවරුද, මෙම රටවල් තුළ කාන්තාවන්ට කාතිවරියන් වීමට ඉඩදීමට තැත් කිරීම ගැන එය 'බටහිර බලපෑමක්' හෝ මෙම රටවල් භාවිතා කරන්නේ "ඉංග්‍රිසි නීතිය" යැයි පවසා එය ඉවත දමති. විවිධ නිකායන් හට ඔවුන්ගේ භාවිතයන් යොදාගැනීමට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිපාදන මගින් ඉඩ සලසා ඇතත්, සියළු නවීන පවුල් නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියන්ට පෙර පැවති හනෆි *මද්හබ් (madhab)* යටතේ කාන්තාවන් හට කාතිවරුන් වීමට අවසර දීමේ විකල්පය, සම්පූර්ණයෙන් නොසළකා හැරීම බරපතළ උපහාසයකි.

නඩත්තු නියෝග බලාත්මක කිරීම, *කයිකූලි* ආපසු ලබාගැනීම සහ *මහර්* සහ ළමා ආරක්ෂාව පිළිබඳ නඩු මෙන්ම, මුස්ලිම් තෙස්තමේන්තු නොමැති අනුප්‍රාප්තිය සහ ආඥා පණත (1931) (Muslim Intestate

Succession and Ordinance) යටතේ පවතින උරුම නඩු වැනි මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ඇතැම් අංග, සිවිල් අධිකරණය තුළ ගනු ලබන බව සඳහන් කළ යුතුය. මෙම අධිකරණවලද නඩුවල තීරණ ගන්නා කාන්තා විනිසුරුවරියෝ සිටිති. උරුම නඩුවලදී, මුලසුන දරන විනිසුරුවරුන් (මුස්ලිම්, මුස්ලිම් නොවන, පිරිමි සහ කාන්තා) ඉස්ලාමීය නීතිය පදනම් කරගත් නෛතික නීති සංග්‍රහය අර්ථ දක්වන්නේ, මුස්ලිම් තෙස්තමේන්තු නොමැති අනුප්‍රාප්තිය සහ ආඥාපණතට අදාළවය.

**ඉල්ලීම: කාති අධිකරණ පද්ධතියට අදාළව මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නියම කර ඇති තනතුරුවලින් කාන්තාවන් බැහැර නොකළ යුතුය. කාතිවරුන්, අභිනිර්ණකයින්, විවාහ රෙජිස්ට්‍රාර්, සහ කාති මණ්ඩලයේ සාමාජික තනතුරු කාන්තාවන් හට අහිමිකිරීම, ශ්‍රී ලාංකිය පුරවැසියෙකු ලෙස ඇය තෝරාගන්නා වෘත්තියක් පසුපස යාමට මුස්ලිම් කාන්තාවක් හට ඇති අයිතිය සෘජුවම උල්ලංඝනය කිරීමකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගෙන රජයේ වැටුප් සහිතව, බදු අරමුදල්වලින් පවත්වාගෙන යන මෙම තනතුරුවලින් කාන්තාවන් බැහැර කිරීම, ශ්‍රී ලාංකීය මුස්ලිම් කාන්තාවන්ට එරෙහිව රජය විසින් කරන සෘජු වෙනස්කොට සැළකීමකි. ජූරි සභාවක් අවශ්‍ය කරන නඩු වලදී, ජූරි සභිකයින් දෙදෙනෙක්වත් කාන්තාවන් විය යුතු බවට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් අනිවාර්ය කල යුතුය. අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් කාතිවරුන් සහ කාති අධිකරණ මෙහෙයවීම ගැන විධිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් තිබීම අවශ්‍ය වේ.**

## 7.5. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්ව නඩුවල කාති මැදහත්වීම

මුස්ලිම් ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමේදී, විශේෂයෙන් කාති අධිකරණවල, බලපෑමට ලක්වූ කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ නඩු ගැන ආමන්ත්‍රණය කරන ආකාරය පිළිබඳව අතිරේක සංකීර්ණතා පවතී. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණය හෝ ව්‍යාභිචාරය ගැන නඩු සමග කටයුතු කිරීමට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට හෝ කාති පද්ධතියට යම් නෛතික වරයක් නොමැත. කෙසේවෙතත්, අතිප්‍රමුඛ අවබෝධය වන්නේ, මුස්ලිම් කාන්තාවන් විසින් රාජ්‍ය විසඳුම් සෙවීම නොකළ යුතු බව මෙන්ම, මෙම ප්‍රචණ්ඩත්ව වලදී සහාය පිණිස 'මුස්ලිම් නොවන' ආයතන ප්‍රවේශ නොකළ යුතු බවය. මන්දයත්, විසඳුම් සෙවිය යුත්තේ, 'ප්‍රජාව තුළ' නිසාය.

### 7.5.1. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙදී ප්‍රජා මැදහත්වීම්

ශාරීරික ප්‍රචණ්ඩත්වය දණ්ඩ නීති සංග්‍රහය යටතේ සාපරාධී වරදක් වන අතර, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පණත අංක 34, 2005 මඟින්, මානසික අපයෝජනය වැනි අනෙක් ආකාරවල ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයන් පිළිගෙන, රැකවරණ නියෝග සැපයීම හරහා සිවිල් විසඳුමක් ලබාදෙයි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව මැදහත්වීම් ගැන මීට පෙර කළ අධ්‍යයනයකදී හෙළිවූයේ, දිවි බේරාගත්-වින්දිත කාන්තාවන්[52] සුළු ප්‍රමාණයක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පණත හරහා රැකවරණ නියෝගවලට ප්‍රවේශය ලබාගන්නා නමුත්, මුස්ලිම් කාන්තාවන් අතර එය අඩු බව ය.

ප්‍රජා කාන්තාවන් සමග කටයුතු කරන සංවිධාන *ගසා* දික්කසාද සඳහා කාන්තාවන් කාති අධිකරණය වෙත යන බොහෝ අවස්ථා ගැන පවසති. සාමාන්‍යයෙන් මෙයට හේතුව වන්නේ, කෲරත්වය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යන පදනමය. කාතිවරුන් හට දික්කසාද නඩුවලදී මැදහත්වීමට කාර්යභාරයක් ඇති බැවින්, ඔවුහු නිතරම මැදහත්වීම සහ හැකිනම් සමගි කිරීම සඳහා, මේවා මුස්ලිම් දේවස්ථාන කමිටු, මුස්ලිම් දේවස්ථාන සම්මේලන[53] සහ/හෝ අනෙකුත් උපදේශන කණ්ඩායම් වලට යොමු කරති. බොහෝ අවස්ථාවලදී, මුස්ලිම් දේවස්ථාන කමිටු හෝ සම්මේලන සාමාජිකයින් නඩු ගැන කාතිරවුන්ට උපදෙස් දෙන ජූරිසභිකයින් ලෙසද කටයුතු කරති.

පුත්තලම සහ මඩකළපුව යන දිස්ත්‍රික්කවලින් ලැබුණු සිද්ධීන්ගෙන් හෙළි වන්නේ, පිරිමින්ගෙන් පමණක් සමන්විත මුස්ලිම් දේවස්ථාන කමිටු සහ සම්මේලනවල 'පවුල් සමගි සන්ධාන කිරීමේ කමිටු' පවතින බවය. මේවා වෙත තදබල ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් ඇතුළුව සියළු වර්ගවල පවුල් ආරාවුල් ගෙනැවිත් මැදහත්වීම් කෙරේ. කාන්තා සංවිධානවලින් සඳහන් කළේ, ප්‍රචණ්ඩත්වය ගැන සාක්ෂි තිබියදීත්, පොලීසිය සහ විශේෂයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ගැටළු ගැන කටයුතු කරන සංවිධාන, ප්‍රාථමික යොමුකිරීමේ ලක්ෂ්‍යය නොවන බවයි. පුත්තලමෙහි මුස්ලිම් දේවස්ථාන කමිටුවක ප්‍රතිචාර දක්වන්නන් අධ්‍යයන කණ්ඩායම වෙත දැනුම් දුන්නේ, 'ඉස්ලාමීය වන්නේ කුමක්ද, නොවන්නේ කුමක්ද' යන්න ගැන මුස්ලිම් දේවස්ථාන කමිටු

---

52 Chulani, Kodikara, '*Domestic Violence Intervention Services in Sri Lanka: An exploratory mapping 2009-2011*'. International Center for Ethnic Studies, Colombo, Sri Lanka.

53

සාමාජිකයින් අතර පවතින මතය වෙනස් වන බවත්, මෙහි ප්‍රතිඵලයක් ලෙස අත්තනෝමතික ක්‍රියා සිදුවන බවත්ය.

බරපතළ ගැටළු ලෙස පවතින්නේ, මැදහත්වීම සඳහා පොලීසිය කැඳවීම හෝ සමගි සන්ධාන වීමට උපදෙස් සඳහා යැවීම හෝ නිර්ණය කරන, ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය, ප්‍රමාණය සහ මට්ටම ගැන දැනුවත් තීරණ ගන්නේද නැද්ද, තීරණ ගන්නේ කවුද, සහ කාන්තාවන්ව ඔවුන් හට ඇති විකල්ප ගැන දැනුවත් කරන්නේද නැද්ද යන මේවාය.

සමහර කාතිවරුන් රාජ්‍ය නොවන සංවිධාන වැනි මුස්ලිම් කාන්තාවන් නායකත්වය ලබාදෙන උපදේශන මුල්පිරීම් වලටද, ආගමික සම්බන්ධතා සහිත වෙනත් කණ්ඩායම් වලටද සිද්ධීන් යොමුකරති. අයිතීන් පාදක කරගත් රාජ්‍ය නොවන සංවිධානවලට සිද්ධීන් යොමුකරන විට, උපදේශකයින් විසින් බොහෝවිට පොලීසියට යාම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පණතෙහි නීති සම්පාදනයෙහි පිහිට පැතීමේ විකල්පය වෙත කාන්තාවන් යොමුකිරීමට ඉඩ ඇත. කොළඹ පිහිටා ඇති සමස්ථ ලංකා ජමියියාතුල් උලමා (All Ceylon Jamiyyathul Ulama) සංවිධානය කාන්තාවන් සඳහා උපදේශන සේවාවලට මුල පුරා ඇත. ඔවුන්ගේ උපදේශකයින්ට අනුව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පණත වැනි නෛතික යාන්ත්‍රණ හරහා යෑමට වඩා පවුල තුළ ගැටළු විසඳා ගැනීමට උත්සාහ දැරීම මෙහිදී සිදුකෙරේ. විශේෂයෙන් කාන්තා උපදේශන කණ්ඩායම වෙත මැදහත්වීම් සහ උපදේශන සඳහා කාති අධිකරණ වලින් බොහෝ යොමුකිරීම් ඇත. මේවා විශේෂයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගැන යොමුකිරීම් කිහිපයක්ද ඇතුළුව පවුල් ආරවුල් සහ නඩත්තු ගැටළුවලට අදාළ ඒවා වෙති.

ප්‍රජා මූලික සංවිධාන සහ කාතිවරුන් මඟින් කරන ඉහත සඳහන් කළ උපදේශන සහ මැදහත්වීම්වල අමතර ගැටළු වන්නේ, පළමුව, මෙම සිද්ධීන් සහ ගැටළු පරිහරණය කරන අත්තනෝමතික ස්වභාවයයි. දෙවනුව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සමන්විත වන්නේ නිශ්චිතව කුමන ඒවායින්ද යන්න ගැන අවබෝධයක් සුවිශේෂී අන්දමින් නොමැති ලෙස පෙනේ. මෙහිදී ශාරීරික ප්‍රචණ්ඩත්වය නිතර දකින්නේ හානිකර ආකාරයේ එකම ප්‍රචණ්ඩත්වය[54] ලෙස වන අතර, වාචික සහ මානසික අපයෝජනය සාමාන්‍යයෙන් හානිකර ලෙස නොසැළකේ.

## 7.5.2. සාපරාධී අපරාධයක් සඳහා සංක්ෂේපණීය යුක්තිය (summary justice): ස්ත්‍රී දූෂණය සහ ව්‍යාභිචාරය

පවුල් කාරණා ගැන ප්‍රජා මූලික මැදහත්වීම්වලට  අදාළව සඳහන් කෙරුණු තවත් සිත සසළ කරන අංගයක් වුයේ, ප්‍රජා මට්ටමේ සිදුවන ස්ත්‍රී දූෂණය සහ ව්‍යාභිචාරය වැනි සාපරාධී අපරාධ සඳහා සංක්ෂේපණීය යුක්තිය පවතින අවස්ථා තිබිය හැකි බවය. මෙම අධ්‍යයනය තුළ සංක්ෂේපණීය යුක්තිය යනුවෙන් අදහස් කෙරුණේ "නීතියෙහි පිහිට නොමැතිව සෙසු පුරවැසියන් විසින් නියම කරන"[55] සුපරීක්ෂාකාරීව සිටීමේ යුක්තිය වර්ගයකි. කාන්තා අයිතීන් පිළිබඳ සංවිධානවලින් සඳහන් කරන ලද්දේ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය මෙන්ම, ස්ත්‍රී දූෂණය සහ ව්‍යාභිචාරයෙහි දිවි බේරාගත් වින්දිතයින් සහ/හෝ ඔවුන්ගේ පවුල් පොලීසිය වෙත යාමෙන් තොරව, පළමුව ප්‍රජාව තුල පිහිට සහ පිළියම් (වන්දි) ලබාගැනීමට සොයන බවය. මෙයින් අදහස් කෙරෙන්නේ, මෙවැනි සමහර සිද්ධීන් සඳහා සම්බන්ධතා ඇති කරගන්නා ප්‍රථම ස්ථානය වන කාතිවරුන්, මුස්ලිම් දේවස්ථාන කමිටු සහ සම්මේලන නැවත වරක් සම්බන්ධ වීමයි. සඳහන් කෙරුණු විශේෂ සිද්ධියකදී, මුස්ලිම් දේවස්ථාන කමිටු මඟින් වින්දිතයා හට වන්දි මුදලක් ගෙවන ලෙස ස්ත්‍රී දූෂණයක අපරාධකරු හට නියම කර ඇති නමුත්, සිද්ධිය පොලීසිය වෙත වාර්තා කිරීම සම්බන්ධයෙන් කිසිවක් නොකරන ලදී.
අවාසනාවකට මෙන්, සිද්ධි වලින් ඇතිවන ලැජ්ජාව සහ අපකීර්තිය පිළිබඳ බිය මෙන්ම, වර්ගවාදී බලපෑම් වලට ඇති බියද නිසා දිවි බේරාගත් වින්දිතයින් සහ ඔවුන්ගේ පවුල් සිද්ධීන් පිළිබඳව නිහඬව සිටීම තෝරාගන්නා අතර, පොලීසිය හරහා කටයුතුකිරීම වෙනුවට අවිධිමත් පියවර ගනිති. සිද්ධීන් සමග පොලීසිය වෙත යෑමට පසුබට වීමට විශාල වශයෙන් හේතු වන්නේ, පොලිස් නිලධාරින් හට භාෂාව කතා කිරීමට නොහැකි වීම නිසා භාෂා සහාය ලබාගැනීම සීමාවීම හෝ, ඔවුන් සිද්ධිය සහ අදාළ පුද්ගලයින්, විශේෂයෙන් කාන්තාවන් සහාය පතනවිට ඒ පිළිබඳව සංවේදීව කටයුතු නොකිරීමයි.
සංක්ෂේපණීය යුක්තිය සහ නීතියට බාහිරව කෙරෙන නිරාකරණය කිරීම්වල නිශ්චිත සංඛ්‍යා, තිව්‍රතාව, ස්වභාවය සහ ප්‍රමාණය මේ අවස්ථාවේ නොදන්නා අතර, රට වටා මෙම භාවිතය කෙතරම් පැතිරී පවතීදැයි තක්සේරු කිරීමට වැඩිපුර තොරතුරු එක්රැස් කිරීම අවශ්‍ය වේ. ස්ත්‍රී දූෂණ සහ ව්‍යභිචාර නඩු අපරාධ යුක්ති

---

54 One of the women counselors of ladies counseling group interviewed mentioned that women are told not to tolerate physical violence because remedies like divorce and separation exist within Islamic norms. However they are usually counseled to tolerate verbal abuse and other "lesser" forms of gender based violence like economic control and restrictions to mobility.

55 Morgan, Rod, 2008. *Summary Justice: Fast but Fair?.* Center for Crime and Justice, Kingos College London, UK http://www.crimeandjustice.org.uk/sites/crimeandjustice.org.uk/files/Summary-justice.pdf'

විනිශ්චය පද්ධතියට පිටස්තරව හසුරුවන්නේ නම්, මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා ප්‍රජාවෙන් සැළකිය යුතු ආරක්ෂක අවදානමක් පවතී.

## 7.5.3. ‘*හද්* ’ දඬුවම් – අනාචාරය සඳහා කසපහර දීම

‘*හද්* ’ (ඒක වචනය හදද්) යනු සමහර අපරාධ සඳහා ඉස්ලාමීය නීතිය යටතේ හඳුනාගෙන ඇති දඬුවමකි[56]. මේවාට විවාහයකින් තොර ලිංගික සබඳතා සහ/හෝ නීතිවිරෝධී ලිංගික සබඳතා/අනාචාරය, මෙන්ම අන් අය අතර නීති විරෝධී ලිංගික සබඳතා ගැන ඔප්පු නොකළ චෝදනා කිරීම ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත *හද්* අපරාධ පිළිගන්නේ හෝ ඒවාට අදාළ රෙගුලාසි හෝ දඬුවම් සටහන් කරන යම් ප්‍රතිපාදන හෝ නොමැති අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ අනාචාරය සාපරාධී අපරාධයක් ලෙස නොසැළකේ.

කෙසේවෙතත්, ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ඡා පවත්වන විට වාර්තා වුයේ, නැගෙනහිර පළාතේ හිටපු කාතිවරයාගේ නියෝගය යටතේ කසපහර දඬුවම් ලබාදීම සිදුවූ බවයි. සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ එම විශේෂ කාතිවරයාට අනුව, අනාචාර නඩු ඔහුට දැනුම් දෙනු ලබන්නේ සැමියා හෝ බිරිඳ දික්කසාදය හෝ නඩත්තු සඳහා කාති උසාවිය ඉදිරියේ පෙනී සිටින විටය. එවිට කාතිවරයා විසින් ඔවුන්ගේ සහකරු විවාහයෙන් පිට අසම්මත සම්බන්ධයක් පවතින බව දැනුම්දීම හෝ ඒ ගැන විමසීම සිදුකරයි. අවිවාහක නම් පිරිමියාට සහ කාන්තාවට කස පහර 100 ක්ද, විවාහක නම් කසපහර 110 ක් ඔහු විසින් නියම කළ හැක. කාතිවරයා විසින් සෑමවිටම පිරිමින් වන මුස්ලිම් දේවස්ථාන සම්මේලනයෙහි සාක්ෂිකරුවන් සතර දෙනෙක් ඉදිරිපිට දඬුවම ක්‍රියාත්මක කරයි.

අනාචාරය සාපරාධී අපරාධයක් නොවන බැවින්, කාතිවරයා විසින් ලබාදෙන කසපහර දඬුවම් වධහිංසා ලෙස සැළකිය හැක[57]. එනම්, රාජ්‍ය සේවකයෙක් වන කාතිවරයා විසින් ක්‍රියාත්මක කරන කෲර, අමානුෂික හෝ අවමන් සහගත දඬුවමක් සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.

ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා වලින් හෙළි වූයේ, අනාචාරය ගැන සැක කරන පුද්ගලයින් හට කසපහර දඬුවම් දීම ප්‍රජාව මට්ටමේ සිදුවන අතර, එය මුස්ලිම් දේවස්ථාන කමිටුව සහ මුස්ලිම් දේවස්ථාන සම්මේලන මගින් බලය දීමෙන් සිදුවිය හැක. පිරිමින් සහ කාන්තාවන් සඳහා දඬුවම් ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්නෙහි නිශ්චිත ස්වභාවය හෝ එවැනි සිදුවීම්වල සංඛ්‍යාව සහ වාර ගණන අපැහැදිලිය[58]. එම ප්‍රදේශවල කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන ප්‍රකාශ කළේ, මෙම භාවිතය සම්මතයක් සහ *ෂරියා* හි කොටසක් ලෙස නීතිමය සහ නීත්‍යානුකූල දඬුවමක් ලෙස ප්‍රජාව දකින බවය. එමනිසා එයට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ අවසර දී ඇති බැවින් එය ප්‍රශ්න කර හෝ අභියෝගයට ලක්කර නොමැත. මෙම අධ්‍යයනය අවසන් කරන කාලයේදී පුත්තලමෙන් සිද්ධියක්[59] මාධ්‍ය තුළ මතුවිය. ස්ත්‍රී දූෂණයකට ලක්ව දිවිගලවා ගත් වින්දිතයෙකු වූ විසිහතර හැවිරිදි කාන්තාවක් හට අනාචාරයේ හැසිරුණේ යැයි සැකකර චෝදනා ලැබ, ඇගේ ප්‍රාදේශීය මුස්ලිම් දේවස්ථානයේ පරිපාලන මණ්ඩලයෙහි සාමාජිකයින් විසින් කසපහර 100 ක් ලබාදුනි. නීතිඥවරයෙකුගේ සහාය ඇතිව ඇය නඩුවක් ගොනුකර, විනිසුරුවරයාගේ මැදිහත් වීමෙන් පිරිමින් සතර දෙනා රක්ෂිත බන්ධනාගාර ගත කරවන ලදී. මෙවැනි ගැටළු වලින් වන්දි ලබාගැනීමට සොයන දිරිමත් කාන්තාවන් නිතරම ප්‍රජාව වෙතින් දැඩි බිය ගැන්වීම්වලට මුහුණදෙති.

සැළකිල්ලට ගතයුතු කරුණක් නම්, ශාරීරික සහ මානසික කම්පනයට අමතරව, පුද්ගලයින් (පිරිමින් සහ කාන්තාවන් දෙපාර්ශවයටම) මත පැටවෙන සමාජ අපවාදය සහ ‘නින්දාව’ ඔවුන්ගේ යහපැවැත්ම මත තදබල ප්‍රතිවිපාක ඇතිකළ හැකි බවයි. එබැවින් මෙය භාවිතයේ පවතින්නේද නැද්ද යන්න ගැන තවදුරටත් විමසා බලා, එය බරපතළ අපරාධයක් ලෙස ප්‍රකාශ කිරීමට වහාම පියවර ගැනීම සුදුසු වේ.

**ඉල්ලීම: දණ්ඩ නීති සංග්‍රහය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව පණත සහ ඊට සමාන අනෙකුත් නීති යටතේ සාපරාධී ලෙස සැළකෙන කාරණාවලදී කාතිවරුන් විසින් විනිශ්චය ලබාදීම නොකළ යුතුය. විවාහය සහ දික්කසාදයට සම්බන්ධ පෞද්ගලික කාරණා නියාමනය කිරීම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙන් කෙරෙන බැවින්, කාතිවරුන් ඉදිරියට ගෙනයන නඩුවක සාපරාධී ක්‍රියාවක් ගැන සාධාරණ සැකයක් ඇතිවිට, එවැනි නඩු එවැනි සාපරාධි ක්‍රියාවන් සම්බන්ධයෙන් කටයුතු කරන අදාළ බලධාරීන් වෙත යොමුකළ යුතුය.**

---

56 Oxford Islamic Studies Online, 2016. *The Oxford Dictionary of Islam*. http://www.oxfordislamicstudies.com/article/opr/t125/e757

57 Article 11 of the 1978 Constitution states that “*No person shall be subjected to torture or to cruel, inhuman or degrading treatment or punishment*”.

58 Organizations such as Muslim Women’s Research and Action Forum (MWRAF) raised the issue in the 1999 publication *‘Between Two Worlds’* wherein it was noted that the punishments are usually ‘symbolic’ and carried out with a coconut husk.

59 Daily Mirror 24th October 2016. *Four remanded for beating sexually abused woman* http://www.dailymirror.lk/article/Four-remanded-for-beating-sexually-abused-woman-118021.html?fbrefresh=refresh

## වෙනත් ජාතික නීති යටතේ නෛතික බැහැරකිරීම්

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තිය ප්‍රකාශ කර ඇත්තේ:

> "කිසිම පුරවැසියෙකුට එරෙහිව ජාතිය, ආගම, භාෂාව, කුලය, ලිංගය, දේශපාලනික මතය, උපන් ස්ථානය හෝ එවැනි කණ්ඩායම් වලින් ඕනෑම එකක පදනම මත වෙනස්කොට නොසැළකිය යුතුය".

කෙසේවෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) වගන්තිය මෙම ප්‍රතිපාදනය අවලංගු කරයි:

> "මෙම (හිමිකම් පණත) පරිච්ඡේදයේ ඉහත සඳහන් ප්‍රතිපාදන සමග මොනයම් හෝ නොගැලපීම් තිබුණද, සියළු පවතින ලිඛිත සහ අලිඛිත (නොලියැවුණු) නීති වලංගු සහ කර්මණ්‍ය (operative) වේ".

16 වෙනි වගන්තිය තිබීමෙන් අදහස් කෙරෙන්නේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ සිදුවන ඔවුන්ගේ ඕනෑම මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සඳහා මුස්ලිම් කාන්තාවන්ට සහ පිරිමින්ට පිහිටක් හෝ වන්දියක් සෙවිය නොහැකි බවයි. පාර්ලිමේන්තුව විසින් සම්මත කරගන්නා පණත් අධිකරණ සමාලෝචනයට ලක්වීම වළක්වන 80 (3) වගන්තිය නිසා මෙය තවදුරටත් සීමා වේ. එබැවින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අදාළව පැනනගින සමස්ත ගැටළු සියල්ලම තිබියදීත්, තමාට එරෙහිව වෙනස්කොට සළකන්නේ යැයි හැඟෙන සහ නීතිය ඉදිරියේ සමානව නොසළකන්නේ යැයි හැඟෙන මුස්ලිම්වරුන් හට, පණත හෝ එය ක්‍රියාත්මක කිරීමෙන් කෙරෙන උල්ලංඝන අභියෝගයට ලක් කිරීමට හෝ, ඒ වෙනුවට විකල්පයක් තෝරාගෙන සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වීමට හෝ හැකියාව නොමැත.

කෙසේවෙතත්, මුස්ලිම්වරු දෙදෙනෙක් සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වූ අවස්ථා ඇත. එක් කාතිවරයෙක් අනාවරණය කළ අන්දමට මෙවැනි සිද්ධීන් සිදුවන අවස්ථා නම්: 1) පවුලේ සම්බන්ධයක් නොමැතිව යුවල විවාහවීමට තීරණය කරන විට (උදාහරණයක් ලෙස පළා යාම පිළිබඳ සිද්ධීන්); 2) මනාලිය හට ඇය වෙනුවෙන් අත්සන් කිරීමට *'වාලි'* භාරකරුවෙක් නොමැති විට (උදාහරණයක් ලෙස, ඉස්ලාම් ආගම වැළඳ ගැනීම සහ පවුලේ අනුමැතිය නොමැතිවීම වැනි සිද්ධීන්); 3) විවාහය සඳහා පහසුකම් සපයන රෙජිස්ට්‍රාර්වරයා මුස්ලිම්වරුන් සඳහා සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ බැහැර කිරීමක් ඇති බව නොදැනුවත් වීම හෝ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ ආගම් ගැන ප්‍රශ්නය කිසිම අවස්ථාවක සාධකයක් ලෙස පැන නොනැගීම, යන මේවා වේ.

නීති විශේෂඥ මහාචාර්ය සාවිත්‍රි ගුණසේකරට අනුව, විවාහය සිදුවන විට දෙදෙනාම මුස්ලිම්වරු වූ, සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වන මුස්ලිම්වරුන් දෙදෙනෙකුගේ විවාහය, ශූන්‍ය සහ බලරහිත ලෙස ගෙන හැර දැක්වේ. එසේනම්, එවැනි පුද්ගලයින්ගේ විවාහය සහ ඔවුන්ගේ දරුවන්ට අදාළවද, විශේෂයෙන් දික්කසාදය, භාරකාරිත්වය සහ නඩත්තු පිළිබඳ ගැටළු පසුව පැමිණේ නම් ඒවාට අදාළ වද, ප්‍රශ්න පැන නැඟේ. මෙම අධ්‍යයනය සිදුකරන අවස්ථාවේ, නොදැනුවත්කමින් හෝ පද්ධතිය තුළින් රිංගා යාම සඳහා වුවත්, සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වන මුස්ලිම්වරුන් සඳහා ඇති නෛතික ප්‍රතිවිපාක ගැන අපැහැදිලිය.

ප්‍රධාන සම්මුඛ සාකච්ඡා හරහා හඳුනාගනු ලද්දේ මුස්ලිම් නීතිඥයින්, ක්‍රියාකාරීන් සහ උපදේශකයින් බහුතරයකගේ හැඟීම වුයේ, මුස්ලිම් විවාහ සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත දිගටම අනිවාර්ය යුතු බවත්, සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විකල්පයක් නොදිය යුතු බවත් ය. මෙයින් ගම්‍ය වන්නේ, අනෙකුත් රාජ්‍ය යාන්ත්‍රණ හරහා කිසිදු හෝ විකල්පයක් නොමැති බවත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන බොහෝ ගැටළු මතුවී තිබිය දීත්, මුස්ලිම්වරුන් හට එයට අනුකූලව කටයුතු කිරීමට බල කෙරෙන බවත්ය.

# PART 2:
# OVERVIEW OF CIVIL SOCIETY INTERVENTIONS ON ADDRESING MMDA RELATED ISSUES AND TOWARDS MMDA REFORMS

## 2 වන කොටස:
## මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ කෙරෙහි සිවිල් සමාජ මැදහත්වීම්වල දළ විශ්ලේෂණය

# සිවිල් සමාජ මැදහත්වීම්වල දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ බොහෝ සිවිල් සමාජ සංවිධාන ඇතත්, මුස්ලිම් කාන්තාවන්ගේ ගැටළු ආමන්ත්‍රණය කිරීම ගැන කටයුතු කරන්නේ සීමිත සංඛ්‍යාවකි. මෙම අධ්‍යයනය වඩා පුළුල්ව මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන ගැටළු ආමන්ත්‍රණය කිරීමෙහි සහ වඩාත් විශේෂිතව මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන කටයුතු කර ඇති සංවිධානවල උප-කණ්ඩයක් ගැන සොයා බලන ලදී. මෙම සංවිධාන විවිධ මට්ටම්වල සහ නාගරික-ග්‍රාමීය බෙදීම හරහා, කොළඹ, පුත්තලම, මඩකළපුව සහ මන්නාරම තුළ, අභියෝගාත්මක, සංවේදී සහ සීමා කෙරෙන තත්ත්වයන් තිබියදීත්, සිදුකර ඇති කටයුතු ඉස්මතු කරති. දිගු කාලීන සංවිධාන විසින් දරන උත්සාහයන් වෙත බොහෝ බිම් මට්ටමේ ක්‍රියාකාරීන් සහ ප්‍රජාමූලික සංවිධානවල කටයුතු මගින් සහයෝගය ලබාදී සහ බලාත්මක කර ඇති බව සඳහන් කිරීම මෙහිදී වැදගත් වේ.

මෙම සංවිධාන විසින් යොදා ගත් සමහර ප්‍රධාන ක්‍රමෝපායයන් පහත ඉස්මතු කර දක්වා ඇත:

## 1. ජාලකරණය සහ එකමුතුකම ගොඩනැඟීම

එහි ආරම්භයේ සිටම මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය (MWRAF) වැනි සංවිධාන මුස්ලිම් නීතිය යටතේ ජීවත්වන කාන්තාවෝ (Women Living Under Muslim Law - WLUML), වැනි සමාන ගැටළු ගැන කටයුතු කරන ජාත්‍යන්තර කණ්ඩායම් සමග සමීපව සම්බන්ධ වීම නිසා, අනෙකුත් රටවල මුස්ලිම් කාන්තාවන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට හැකිවී ඇත. කාර්ය මණ්ඩල සාමාජිකයින් පැවසූ ප්‍රකාර, මෙම සම්බන්ධතාව හරහා, මුස්ලිම්වරුන් ජීවත්වන විවිධ වූ සමාජ ගැන සළකා බලන කළ, “සමජාතීය ඉස්ලාමීය හෝ මුස්ලිම් ලෝකයක් යනු මිථ්‍යාවකි” යන බව තේරුම් ගැනීමට මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදයට හැකිවිය. තවද විවිධ සන්දර්භයන් හරහා පවතින පීතෘ මූලික පාලනය සහ මතවාදය ගැනද, එහි ප්‍රතිඵලයක් ලෙස, ලොවපුරා මුස්ලිම් කාන්තාවන් මුහුණ දෙන අසමානාත්මතාවයෙහි අත්දැකීම් සහ ඒවා ආමන්ත්‍රණය කළ හැක්කේ කෙසේද යන්න ගැන අදහස් හුවමාරු කර ගැනීම අවබෝධ කර ගැනීමටද හැකිවිය.

විවිධ රටවල මුස්ලිම් ක්‍රියාකාරීන් මුස්ලිම් පවුල් නීති වලට ප්‍රතිසංස්කරණ ගැන වාද කර ඇති අතර, ඒවා සම්මත කරගෙන, “ඉස්ලාමීය රාමුව” තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය, විවාහය, දික්කසාදය, කාන්තා නායකත්වය, වැනි මාතෘකා ගැන විකල්ප සංවාද පරාසයක නියැලී ඇත. කෝරානයේ වාක්‍යයන්ට විකල්ප අර්ථකථන ගවේෂණය කිරීම, *ෆික්* හි (ඉස්ලාමීය නීතිමීමංසාව) විකල්ප, සියළුම ගුරුකුල (*මද්හබ්*) තුළින් එන විවිධ මත සමග කටයුතු කිරීම සහ අනෙකුත් මුස්ලිම් සන්දර්භයන් තුළ ඉස්ලාමිය නෛතික භාවිතයන් සංසන්දනය කිරීම, “ඉස්ලාමීය රාමුව” තුළට ඇතුළත් වන නමුත්, ඒවාට සීමා නොවේ.

මේ සම්බන්ධව, දේශීය සන්දර්භය ගැන කථා කිරීමේදී සහ සම්බන්ධවීමේදී මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය (MWRAF)ට සහයෝගය දුන් මුස්ලිම් නීතිය යටතේ ජීවත්වන කාන්තාවෝ (WLUML) සංවිධානය සමග ජාලගත වීමෙන් ලද ප්‍රධාන ඉගෙනීම වූයේ, කෝරානයේ සහ *සුන්නා* හි (නබිතමාගේ සම්ප්‍රදායයන්) එකම ප්‍රභවයන් පැවතුණත්, මුස්ලිම් නීතිය සහ නෛතික නීතිමීමංසාව අර්ථ කථනය කරන සහ ක්‍රියාත්මක කරන විවිධ සහ විකල්ප ක්‍රම ඇති අතර, ඒවා, වෙනස්වන කාලයන්ට සහ රාජ්‍යයන්ගේ සහ ප්‍රජාවන්ගේ ප්‍රමුඛතාවයන් මත රඳා පවතී. මෙය, මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය හට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන ක්‍රියාකාරිත්වයන් පදනම් කරගත් පර්යේෂණ කිරීමට සහ, ජාත්‍යන්තර සහ දේශීය අත්දැකීම්වලින් උකහාගෙන ශ්‍රී ලංකාවේ පවුල් නීතිය ප්‍රතිසංස්කරණය කෙරෙහි ක්‍රමෝපායීව කටයුතු කිරීමට සහාය දුනි.

මේ මගින් 'ඉජ්තිහාද්' නොහොත්, නීති සහ නෛතික පද්ධතිවලට බලපෑම් කරන වර්තමාන සන්දර්භය සහ තර්කාන්විත චිත්ත ක්‍රියාවලි සැළකිල්ලට ගන්නා ඉස්ලාමීය නීතිමීමංසාවේ කරුණු ගැන “බුද්ධිමය ලෙස තර්ක කිරීම” වැනි සංකල්පවල කාර්යභාරය ගැන සංවාදය සඳහා ඇති අවකාශයද, පුළුල් කෙරිණි.[60]

---

60 *“It was contended that the element of human reasoning during the process of ijtihad had been the reason for the existence of gender biased interpretation of the rules relating to matrimonial laws, which had consequently jeopardized the status of women. Thus, it was argued that there were needs for the reinterpretation of the matrimonial laws, which were based on religious sects, and to go beyond the opinions of the jurists. This effort was crucial in order to give back to women their former status as had been accorded to them during the Prophet’s period.” (Source:* Khan Noor Ephroze, *Women and Law*, Rawat Publications, Jaipur, New Delhi, 2003)

ප්‍රාදේශීය බිම් මට්ටමේ ජාලකරණය සහ එකමුතුකම ගොඩනැගීම සම්බන්ධව පුත්තලම මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (MWDT), මන්නාරමේ මන්නාරම් කාන්තා සංවර්ධන සම්මේලනය (MWDF) සහ මුලතිව් හි මුලතිව් කාන්තා සංවර්ධන පුනරුත්ථාපන පදනම (MWDRF) යන මේවා කාන්තා ක්‍රියාකාරීත්ව ජාලයක කොටසක් ලෙස පැවතුණි. මෙය උතුරෙහි සහ නැගෙනහිර සංවිධාන අටක සන්ධානයකි. එය සාමූහික ක්‍රියාකාරීත්වයන් හරහා යුද්ධය, පශ්චාත් යුද සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්ව ගැටළුවලට අදාළ ද්‍රවිඩ සහ මුස්ලිම් කාන්තාවන්ගේ ඕනෑඑපාකම් ගැන ප්‍රකාශ කරන සහ ආමන්ත්‍රණය කරන සංසදයක් ලෙස පවතී.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි සන්දර්භය තුළ මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන උල්ලංඝන, කාන්තා ක්‍රියාකාරීත්ව ජාලය (WAN) විසින් උනන්දු දක්වා ඇති ගැටළු වලින් එකකි. එය මන්නාරම් කාන්තා සංවර්ධන සම්මේලනය වැනි සංවිධානවල මුස්ලිම් නොවන කාර්ය මණ්ඩලයට හා උපදේශකයින්ට, කාතිවරුන් සමග සහ බලපෑමට ලක්වූ කාන්තාවන්ගේ සිද්ධීන් ගැන කටයුතු කිරීමේදී, මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයෙහි ප්‍රවේශයන් සහ අත්දැකීම් වලින් ඉගෙන ගැනීමට හැකියාව ලබාදී ඇත. ක්‍රියාකාරීන් සඳහන් කළේ, උතුරෙහි සහ නැගෙනහිර මුස්ලිම් සහ ද්‍රවිඩ කාන්තාවන් මුහුණදුන් යුද්ධයෙහි හවුල් සන්දර්භය, එකමුතුකම සහ යුක්තිය සඳහා පොදු අභිප්‍රායයන් ගොඩනැඟීමෙහිලා තීරණාත්මක වූ බවයි. මෙහිදී, මුස්ලිම් කාන්තාවන් මුහුණදුන් ගැටළු "මුස්ලිම් ගැටළු" ලෙස නොව, කාන්තා අයිතීන් උල්ලංඝනය කිරීමක් ලෙස දකින ලදී.

## 2. දැනුම් මූලයක් (පදනමක්) නිර්මාණය කිරීම

මුස්ලිම් කාන්තාවන් සමග කටයුතු කරන සංවිධාන ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන්ගේ අත්දැකීම් ගැන පර්යේෂණ පැවැත්වීමේ සහ ලේඛණගත කිරීමේ වැදගත්කම තේරුම් ගැනීමට අමතරව, නීතිවල ඓතිහාසික පරිණාමය, ඉස්ලාමීය scholarship සහ පුද්ගලික සහ ප්‍රජා මට්ටමේ නීති යොදාගන්නා අන්දම ගැනද, සොයා බැලුහ. කාති මඩුල්ලේ වසර 2001 සිට 2010 දක්වා නීති වාර්තාවල සිට, පර්යේෂණ සහ බලගැන්වීම සඳහා වූ ඉස්ලාමීය කාන්තා සංගමයේ සිද්ධි අධ්‍යයන සම්පාදනය දක්වා ඇති, මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරීත්ව සංසදයෙහි මෙම ප්‍රකාශන තුළින්, කාති අධිකරණ පද්ධතිය මගින් කාන්තාවන්ට බලපෑම් කරන අන්දම ගැන වඩා හොඳ අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලබාදී ඇත.

ශ්‍රී ලංකාව තුළ, මෙම අදාළ මාතෘකා ගැන ද්‍රවිඩ භාෂාවෙන් තොරතුරු සහ ප්‍රකාශනවල පවතින හිදැස හඳුනාගත් පසු, ශ්‍රී ලංකා සංවර්ධන මාධ්‍යවේදී සංසදය (Sri Lanka Development Journalist Forum - SDJF) 2015 දී ප්‍රකාශන දෙකක් "ඉස්ලාමීය රාමුව" තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි සමානාත්මතාවය ගැන මාතෘකා ආවරණය වන පරිදි සකස් කළේය. ඇදහිල්ල තුළ සමානාත්මතාවය, විවාහය, දික්කසාදය, බහු භාර්යත්වය, අධ්‍යාපනය සහ ආර්ථික අයිතීන්, *ෂරියා* නීතිය තුළ සාක්ෂිකරුවන් ලෙස කාන්තාවන්, සහ සමීප සහකරුවන්ගේ ප්‍රචණ්ඩත්වය සහ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත මේවාට ඇතුළත් විය.

මෙම ප්‍රකාශන, ප්‍රජාවට බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීකරණය වූ ගැටළු ගැන දැනුවත්භාවය ඇති කිරීමට සහ ඉස්ලාමීය නීතිය ගැන පවතින මිථ්‍යාවන් පහකිරීමට සහාය විය. ආගමික මතවලට අනුව සංවාදයකට ප්‍රජාව යොදාගැනීම කෙරෙහි මෙම ප්‍රකාශන බෙහෙවින් ප්‍රයෝජනවත් මෙවලම් බවට ඔප්පු වී ඇත. පර්යේෂණ සහ බලගැන්වීම සඳහා වූ ඉස්ලාමීය කාන්තා සංගමය වැනි සංවිධාන මුස්ලිම් කාන්තාවන්ගේ අධ්‍යයන චක්‍ර තුළ මෙම ප්‍රකාශන භාවිතා කිරීම ආරම්භ කර, එක් එක් මාතෘකාව සාකච්ඡා ලක්ෂ්‍යයක් ලෙස ගෙන, විවිධ ගැටළුවල පොදු සහ විකල්ප අවබෝධයන්, කෝරාන සහ සුන්නා අර්ථදැක්වීම සහ මුස්ලිම් කාන්තාවන් සඳහා ප්‍රතිවිපාක ගැන දීර්ඝ ලෙස සාකච්ඡාවල නියැලෙති.

## 3. කාන්තාවන් සඳහා ධාරිතා සංවර්ධනය සහ සහාය සේවා

කාන්තා සංවිධාන ඔවුන්ගේ ප්‍රජා මට්ටමේ කටයුතු හරහා නෛතික සාක්ෂරතා වැඩසටහන් ආරම්භ කර ඇත. මේ මගින් ප්‍රජාව තුළ කාන්තාවන් හට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන නෛතික උපදෙස් ලබාදීමට ඔවුන්ගේ හැකියාවන් දියුණුකිරීම සහ සජීවීකරණය සිදුකෙරේ. මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරීත්ව සංසදය ඔවුන්ගේ වැඩ කටයුතුවලට නීතිමය අංගයක් ස්ථාපිත කර, නඩු වලට පහසුකම් සැපයීම සහ කාති මණ්ඩලය සහ අභියාචනා අධිකරණය හරහා (උදා. බලාත්මක කිරීමේ නියෝග සඳහා) අධිකරණ නඩු සහ අභියාචනා ගැනීමට කාන්තාවන්ට සහාය දීම සිදුකරයි.

මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය සහ පර්යේෂණ සහ බලගැන්වීම සඳහා වූ ඉස්ලාමීය කාන්තා සංගමය, පිළිවෙලින්, පුත්තලම සහ මඩකළපුවෙහි ප්‍රජා කාන්තාවන්ගේ දැනුම සහ හැකියාව වැඩිකිරීමට, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන සහ කාති අධිකරණවල ක්‍රමවේදයන් ගැන දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ගැටළුවලට මුහුණදෙන කාන්තාවන්ට උපදේශනය සහ වැදගත් නීතිමය තොරතුරු සැපයීමට මෙම කාන්තාවන්ට හැකිවී ඇත. දිවුරුම් ප්‍රකාශන වැනි ලියකියවිලි සූදානම් කිරීමටද, කාති අධිකරණයට කාන්තාවන් සමග යාම සහ නඩු සහ කාති තීන්දු ගැන පසු විපරම් කිරීම සම්බන්ධවද ඔවුහු සහාය ලබාදෙති. සියල්ලටම වඩා කාන්තා සංවිධාන විසින් එකමුතුකම ලබාදී රට පුරා කාන්තාවන් සිය ගණන් හට සහාය පද්ධතියක් ලෙස කටයුතු කර ඇත. පෞද්ගලික හදිසි අවස්ථා වලදී උදව් උපකාර ලබාදීම, මානසිකව ශක්තිමත් කිරීම සහ විශ්වාසය ගොඩනැගීම මෙන්ම, ඔවුන් කාති අධිකරණ පද්ධතිය හරහා යන අතරතුර ඔවුන් කැටුව යාම මෙයට ඇතුලත් වේ.

## 4. පවතින කාති අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම

කාන්තා සංවිධාන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ පණතෙහි දක්වා ඇති ක්‍රමවේදයන් ගැන පුහුණු ලබාදීම හරහා කාතිවරුන් සමග කටයුතු කර ඇතිවාක් මෙන්ම, දිගටම කටයුතු කරගෙනද යති. මුස්ලිම් කාන්තාවන්ගේ පර්යේෂණ සහ ක්‍රියාකාරීත්ව සංසදය මගින් 2011 දී කාති පුහුණුව සඳහා මොඩියුලයක්ද[61], මීට අදාළව කාතිවරුන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක්ද ප්‍රකාශයට පත් කළේය.

කාලයත් සමග, තවත් බිම් මට්ටමේ කාන්තා සංවිධානවලට පුත්තලම, මඩකළපුව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල ප්‍රජාව තුළ පිළිගැනීම ගොඩනඟා ගැනීමට හැකිව ඇත. පුත්තලමේ කාති අධිකරණයට ප්‍රවේශය ලබා ගැනීමට සුවිශේෂී උත්සාහයක් දැරීමෙන් පසු, කාතිවරු ටික දෙනෙක් කාන්තා උපදේශකවරුන්ට සහ ස්වේච්ඡා සේවකයින් හට අධිකරණය තුළ වාඩිවී, විශේෂයෙන් කාන්තාවන් හට සහාය අවශ්‍ය කරන අවස්ථාවලදී, නඩුවලට උදව් වීමට අවසර ලබාදී ඇත. කාති අධිකරණවලට යන කාන්තාවන් සඳහන් කරන්නේ, ඔවුන් කාන්තා උපදේශකයින් සහ ස්වේච්ඡා සේවකයින් කැටුව යනවිට ඔවුන්ට වෙනස් අන්දමින් සළකන බවය.

පුත්තලම, මඩකළපුව සහ මන්නාරම වැනි පෙදෙස්වල මුස්ලිම් පුද්ගලික නිතිය ගැන පුහුණුව ලබා ඇති ප්‍රාදේශීය කාන්තා අයිතීන් සඳහා වූ සංවිධානවල මුස්ලිම් කාන්තා ස්වේච්ඡා සේවකයින් සහ උපදේශකයින් හට ප්‍රාදේශීය කාතිවරුන් විසින්ම අධිකරණ නඩු විභාගවල වාඩිවීමට සහ සුදුසු අවස්ථාවලදී කාන්තාවන්ගෙන් තොරතුරු එක්රැස් කරන ලෙස ආරාධනා කර ඇත. සමහර අවස්ථාවලදී කාතිවරයා සමහර නඩු ගැන, එනම්, නඩත්තු සඳහා සාධාරණ මුදලක් වැනි දේ ගැන, ස්වේච්ඡා සේවකයින්ගේ සහ උපදේශකයින්ගේ අදහස්ද විමසයි. මෙම සංවිධානවලින් පුහුණු කර ඇති මුස්ලිම් කාන්තාවන් හට, ඔවුන්ටම කාතිවරුන් වීමට දැනුම, හැකියාව සහ අත්දැකීම් ඇති අතර, එම තනතුර ලබාගැනීම නැවැත්වීමට ඔවුන්ට තිබෙන එකම බාධකය වන්නේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව විශේෂණය කොට දැක්වීමය.

> "මුස්ලිම් පෞද්ගලික නීතිය ගැන මගේ දැනුම කෙරෙහි ඇති විශ්වාසය සහ ගෞරවය සහ කාති අධිකරණවල මුස්ලිම් කාන්තාවන් හට සහාය දීමට මා කරන අවංක කටයුතු නිසා, බොහෝ ප්‍රජා සාමාජිකයින් සහ මුස්ලිම් දේවස්ථාන කමිටු සාමාජිකයින් පවා මා හට කාතිවරයෙකු වීමට අනුග්‍රහය දක්වති. කෙසේවෙතත්, ඔවුන් දමා ඇති සීමා කිරීම නිසා, මගේ සැමියා එම තනතුරට අයැදුම් කළ යුතුය යන අදහස් ඉදිරිපත් කෙරුවෙමි. සියළු තීරණ ගැනීම්වලදී සහ විනිශ්චයන් ලබාදීමේදී ඔහුට සහාය දෙන තැනැත්තී ලෙස මා සිටිය යුතු බව යෝජනා කෙරිණි. මෙය ඉතාමත් අසාධාරණ තත්ත්වයකි."
>
> - ජුවයිරියා මොහිදීන්, නිර්මාතෘ, පුත්තලමෙහි මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය

[61] Module for Training of Quazis, 2011. Muslim Women's Research and Action Forum (MWRAF)

## 5 සහය දක්වන උද්දේශකයින් සහ මිතුරන් ලෙස මුස්ලිම් පිරිමි

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි ක්‍රියාදාමයට ප්‍රාථමිකව නායකත්වය දෙන්නේ මුස්ලිම් කාන්තාවන්ය. කෙසේවෙතත්, කාතිවරුන් ඇතුළුව මුස්ලිම් පිරිමින්ද ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි කොටසක් වීම ඉතා වැදගත් බව බොහෝ කලින් පිළිගැනුණි. වසර ගණනාවක් පුරා බලපෑම් එල්ල කළ පිරිම් කේවල් කරන්නන් අතර හිටපු අල් හාජ් එස්.එම්.ඒ. ජබාර්, විනිසුරු සළිම් මාර්සූෆ් සහ විනිසුරු ඒ.එම්. මොහමද් මැකී යන අය ප්‍රාථමිකව ඔවුන්ගේ නීතිය පිළිබඳ විශේෂඥ දැනුම් සම්භාරය හරහා මෙහි නියැලී සිටියහ. ඔවුහු මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි හරයාත්මක සහ පටිපාටිමය ප්‍රතිසංස්කරණ සඳහා සංවාද, පොත්පත් සහ කේවල් කිරීම කෙරෙහි සැලකිය යුතු අන්දමින් දායක වී ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන මාධ්‍යවේදීන්ගේ සංගමය වැනි අනෙකුත් මාධ්‍ය සංවිධාන, ප්‍රධාන ප්‍රවාහගත ද්‍රව්‍ය මාධ්‍යය සහ ගුවන් විදුලි නාට්‍ය, වැඩසටහන්, සහ පුවත්පත් ලිපි හරහා අනෙකුත් උචිත මාතෘකා අතර දික්කසාදය සහ බහුභාර්යත්වය, යන මේවායින් පැන නඟින ගැටළු සාකච්ඡා කළහ. මෙය මුස්ලිම් ප්‍රජාව තුළ, විශේෂයෙන් මීට පෙර මේ ස්වභාවයේ සංවාදවල යෙදුණු නැගෙනහිර පළාතේ, යම් මට්ටමක සංවාදයකට පෙළඹවීමට තරම් ඵලදායී විය. මෙම මුල්පිරීම ශ්‍රී ලංකා සංවර්ධන මාධ්‍යවේදීන්ගේ සංසදය වැනි සංවිධාන හට, මේ සම්බන්ධව සාමාන්‍ය මුස්ලිම් ජනතාව තුළ ඇති විවිධ ප්‍රශ්න සහ දුර්මතයන් වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමටත්, විශේෂයෙන් ආගමික නායකයින්ගේ සහ කණ්ඩායම්වල ප්‍රතිචාරයන් සහ දෘෂ්ටි කෝණයන් මැන ගැනීමටත් සහාය විය.

## 6. සහය දක්වන උද්දේශකයින් සහ මිතුරන් ලෙස මුස්ලිම් නොවන කාන්තාවෝ

*"මුස්ලිම් වරයෙක් නොවීම මගේ වැඩට බාධාවක් නොවේ. අපගේ කණ්ඩායමේ හැමෝම එය දකින්නේ කාන්තාවන්ගේ ගැටළුවක් ලෙසය. කිසිවෙක් මුස්ලිම් කාන්තාවන්ගේ ගැටළුවලට "මුස්ලිම් නොවන දෘෂ්ටිකෝණයකින් " ප්‍රවේශ නොවෙයි. එය දකින්නේ කාන්තා අයිතීන් දෘෂ්ටිකෝණයකිනි. කාතිවරයා වුවද අප සංවිධානයේ කටයුතුවලට ගරුකරයි ".*

- කුරුශාන්තන් මහලක්ෂ්මී, සම්බන්ධීකාරක, මන්නාරම් කාන්තා සංවර්ධන පදනම

කාති අධිකරණ කරුණුවලදී මුස්ලිම් කාන්තාවන් සමග ගනුදෙනු කිරීමට කැමතිවන මුස්ලිම් නොවන පුද්ගලයින් සහ සංවිධාන ඇත්තේ අතලොස්සක් පමණක් බව සඳහන් කෙරුණු අතර, එයද මන්නාරම, මඩකළපුව, වවුනියා වැනි ප්‍රාථමිකව පශ්චාත් යුද පෙදෙස්වලය. ගැටළු ගැන බෙදාගත් කම්පනය සහ එකමුතුකම යන මේවායෙහි ප්‍රතිඵලය වූයේ, පවුල සහ ප්‍රජාවට සම්බන්ධව මුස්ලිම් කාන්තාවන්ගේ ප්‍රශ්න දකින්නේ "මුස්ලිම් ගැටළු" ලෙස නොව "කාන්තාවන්ගේ ගැටළු" ලෙසය. සංස්කෘතික සාපේක්ෂවාදී දෘෂ්ටිකෝණයකින් නොව කාන්තාවන්ගේ යහපැවැත්ම ගැන සැළකිලිමත් වීමෙන් ගැටළුව ගැන කටයුතු කිරීමට, තේරුම් ගැනීමට සහ එයට ප්‍රවේශ වීමට ඔවුන් හට උත්සාහ දැරිය හැකි නම්, මුස්ලිම් නොවන සංවිධාන සහ මිතුරන් හට දැක්විය හැකි ධනාත්මක බලපෑම කෙතරම්දැයි පෙන්වන උදාහරණයකි, මන්නාරම් කාන්තා සංවර්ධන පදනම.

උදාහරණයක් ලෙස, මන්නාරම් කාන්තා සංවර්ධන පදනම විසින් මන්නාරමෙහි වැඩ පටන්ගත් මුල් දිනවල ප්‍රදේශයෙහි මුස්ලිම් කාන්තාවන්ගෙන් පැමිණිලි සහ සහාය සඳහා ඉල්ලීම් ලැබෙන්නට පටන් ගැනුණි. මෙම සංවිධානය, පුත්තලමෙහි මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය වැනි සහෝදර සංවිධාන සමග සම්බන්ධීකරණය කර, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන අවශ්‍ය කර තිබූ දැනුම සහ තොරතුරු ලබාගෙන, මුස්ලිම් කාන්තාවන් හට ඔවුන්ගේ නඩුවලදී සහයෝගය දැක්වීම ආරම්භ කළේය. මුස්ලිම් කාන්තා සංවර්ධන පදනමෙහි කාර්ය මණ්ඩලය, මුස්ලිම් කාන්තාවන් හට උපදේශන සහ හදිසි සහයෝගය දීම ඇතුළුව, ඔවුන් කැටුව අධිකරණයට යාම සහ නඩු තීන්දු ගැන පසුවිපරම් කිරීමෙන්ද සහාය ලබාදෙති. කාන්තාවන් හට අසාධාරණ සැළකිලි හෝ විනිශ්චයන් ලබාදුන් විට පැමිණිලි ගොනුකිරීමට මුස්ලිම් කාන්තා සංවර්ධන පදනම සහාය දුන් අවස්ථාද ඇත.

එමෙන්ම මඩකලපුව පදනම් කරගෙන හොඳින් ස්ථාපිත වී ඇති සංවිධානයක් වන සූරියා කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය[62] මුස්ලිම් කාන්තාවන්ගේ ගැටළු වලට ප්‍රවේශ වන්නේ කාන්තා අයිතීන් පිළිබඳ ගැටළු ලෙසය. තවද ඔවුහු මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නඩුවලදී විශේෂිත යොමුකිරීම් සම්බන්ධව, පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සඳහා වූ මුස්ලිම් කාන්තා සංසදය වැනි සංවිධාන සමග සම්බන්ධිකරණයද සිදුකරති. සූරියා කළමනාකරු පැවසූ පරිදි මුස්ලිම් කාන්තාවන් හට ප්‍රජාව තුළ සිදුවූ උල්ලංඝන ගැන අවධානය යොමුකිරීමට

[62] Suriya Women's Development Center website http://suriyawomen.org/about/

දුෂ්කරතා පැවති අවස්ථාවලදී (සෘණාත්මක අනිසි ප්‍රතිවිපාකවලට බියෙන්), ඔවුහු සුරියා වෙත පැමිණීමෙන් පසු එම සංවිධානය කැමැත්තෙන් එවැනි සිද්ධීන් ගැන ක්‍රියාකාරී වූ අවස්ථා ඇත.

## 7. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණය කෙරෙහි සුවිශේෂී ක්‍රියාකාරීත්වයන්

වසර ගණනාවක් පුරා මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය වැනි සංවිධාන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියන්ට සැළකිය යුතු දායකත්වයක් දී ඇති අතර, එහි සාමාජිකයින් දෙදෙනෙක් 1990 මුස්ලිම් පවුල් නීතිය ප්‍රතිසංස්කරණ කමිටුවෙහි මෙන්ම, විනිසුරු සලීම් මාර්සූෆ්ගේ ප්‍රධානත්වයෙන් පැවති 2009 කමිටුවෙහිද, සහභාගි වුහ. මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදයේ සාමාජිකයින් මෙම කමිටුවලට සාක්ෂි සහ ප්‍රකාශද ලබාදී ඇති අතර, අදාළ කමිටුවලට තොරතුරු සහ සම්පත්ද ලබාදී ඇත. වසර 2005 දී මෙම සංසදය විසින් වසර ගණනාවක් ජාතික මට්ටමේ අකර්මණ්‍යයව තිබූ මුස්ලිම් පෞද්ගලික නීතිය සඳහා වූ ස්වාධීන කමිටුව (ICMPLR) ජනතා මුල්පිරීමක් ලෙස ආරම්භ කරන ලදි. මෙය සිදුවූයේ 'ෂහාබ්ඩීන් කමිටුව' නමින් පැවති ආචාර්ය ෂහාබ්ඩීන් ගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය කමිටුවක් පිහිටුවීමෙන් පසුවය. මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය විසින් වාර්තා කළ පරිදි[63] ICMPLR බොහෝ ක්‍රියාකාරීන් සමග පුළුල් අදහස් විමසීමේ ක්‍රියාවලියක නිරත වීමෙන් පසු, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන පුළුල් වාර්තාවක්ද සූදානම් කළේය. මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදයට අනුව, මෙම වාර්තාව මූලික ලේඛනය ලෙස දායක වූ අතර, 2009 දී කැබිනට් මණ්ඩලය පත්කළ කමිටුවට පූර්වගයා විය.

ප්‍රතිසංස්කරණ සඳහා ගත් මුලින්ම උත්සාහයන් 1954 වසරට යනතුරු සොයාගත හැකි මුත්, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සැලකිය යුතු ගම්‍යතාවයක් ලබාගන්නේ අසූව දශකයේ මැද භාගයේදීය. වසර ගණනාවක් පුරා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි විවිධ අංග, ප්‍රතිසංස්කරණ සඳහා ඉස්මතු කර ඇත. කෙසේවෙතත්, 1984 සිට ප්‍රතිසංස්කරණ සඳහා කේවල් කළ වඩාත්ම ක්‍රියාකාරී සංවිධානය වූ මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරිත්ව සංසදය, විශේෂිත ප්‍රතිපාදන යෝජනා කර ඇත. කෙසේවෙතත්, 2011 සිට, වෙනත් ප්‍රජා මූලික සංවිධානද අමතර ප්‍රතිපාදන සහ වෙනස්කම් ප්‍රකාශ කර ඇත. කාන්තා ක්‍රියාකාරිත්ව ජාලය (WAN) වැනි කණ්ඩායම්, විවාහය සඳහා අවම වයස මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි අධිකරණ බලයෙන් සම්පූර්ණයෙන් [64] ඉවත් කරන ලෙස ද, මුස්ලිම්වරුන් ඇතුළු සියළු පුරවැසියන් සඳහා අවම වයස අවුරුදු 18 විය යුතු බවටද, කේවල් කරති.
වසර 2016 පෙබරවාරි මස පුත්තලමෙහි සහ උතුරු නැගෙනහිර මුස්ලිම් කාන්තාවෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගැන වූ මහජන නියෝජිත කමිටුවේ දිස්ත්‍රික්ක මට්ටමේ ශ්‍රවනය කිරීම් ඉදිරිපිටට ගොස්, මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි වෙනස්කොට නොසැළකීම සහ සමානාත්මතාව වගන්තිය සමග පරස්පරකම් තිබියදීත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට වලංගු සහ කර්මණ්‍ය වීමට හැකියාව ලබාදෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 16 (1) වගන්තිය ඉවත් කරන ලෙස ඉල්ලුම් කළහ.

ඉතා මෑතකදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හේතුවෙන්, මුස්ලිම් කාන්තා ක්‍රියාකාරීන් නව පරම්පරාවක්, එනම්, මුස්ලිම් පෞද්ගලික නීතිය ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරිත්ව කණ්ඩායම (MPLRAG)[65], වැනි කේවල් කරන කණ්ඩායම් මතුවී ඇත. මෙවැනි කණ්ඩායම්, ප්‍රතිසංස්කරණ සඳහා වූ සුපුරුදු ඇමතුමින් ඔබ්බට ගොස්, ශ්‍රී ලංකාවේ සියළු පුරවැසියන්ට ලබාදී ඇති සමානාත්මතාව සහ වෙනස් කොට නොසැලකීම සහතික කිරීම සමග මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත අනුකූල කරවීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා කේවල් කරති.

මෙම අධ්‍යයනය අවසන් කිරීමේ කාලය තුළ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන්ගේ අයිතීන් පිළිබඳ සංවාදය, ප්‍රධාන ප්‍රවාහ සංවාදය තුළ මතුවන බවත්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සඳහා මෙන්ම, මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ අයිතීන් සඳහාද මුස්ලිම් ප්‍රජාව තුළින් සහ ඉන් පිටතින් වර්ධනය වන සහයෝගයක් පවතින බවත්, නිරීක්ෂණය කරන ලදී.

[63] Ed. F.Zakariya, C. Kodikara 2011. *Women Claiming Rights and Spaces: Activism to Reform Muslim Law in Sri Lanka.* Muslim Women's Research and Action Forum (MWRAF). Colombo, Sri Lanka.

[64] Women Action Network, April 2016 Statement: Scrap Sri Lanka's Archaic Underage Muslim Marriage Law: WAN. Colombo Telegraph., News Stories. https://www.colombotelegraph.com/index.php/scrap-sri-lankas-archaic-underage-muslim-marriage-law-wan/?platform=hootsuite

[65] Muslim Personal Law Reforms Action Group (MPLRAG) www.mplreforms.com

# PART 3:
# BARRIERS AND CHALLENGES TO REFORM OF MMDA

**3 වන කොටස:**
**මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ වලට ඇති බාධක සහ අභියෝග**

# ප්‍රතිසංස්කරණ සඳහා අරගලය

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත බිහිවීමේ ක්‍රියාවලිය සහ ඉන්පසුව එහි සමහර පටිපාටිය අංශයන් හට සිදුකළ සංශෝධනද මැනවින් ලේඛන ගත කර ඇත[66]. සැළකිය යුතු සංශෝධනයන්ට 1964 දී අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාතිවරුන් පත්කිරීම[67] ඇතුළත් වේ. නීති ප්‍රතිසංස්කරණ සඳහා බොහෝ කමිටු පත්කර ඇත. මුලින්ම 1956 චාරිත්‍රමය නීති ප්‍රතිසංස්කරණ සඳහා වූ සාමාන්‍ය කමිටුව ඒකාකාරී සිවිල් නීති සංග්‍රහයක් සඳහා විකල්පයක් ලෙස බලන ලද මුත්, මුස්ලිම් ප්‍රජාවෙන් විශාල විරෝධයක් එල්ලවිය. විශේෂයෙන් මුස්ලිම් පවුල් නීති ප්‍රතිසංස්කරණ සඳහා ඉන්පසුව පිහිටුවන ලද කමිටු වලට  පහත සඳහන් ඒවා ඇතුළත් වේ:

1. 1970 දී – ආචාර්ය එච්.එම්.එෆ්. ෆාරුක් ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුව, විවාහය සඳහා අවම වයස ඉහළ නැංවීම ඇතුළුව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට හරයාත්මක සහ පටිපාටිය සංශෝධන ඇතුළත් කෙරුණු, ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ සපයන ලදී [68];
2. 1984 දී – කමිටුවක් පිහිටුවන ලද මුත් කිසි ප්‍රත්‍යක්ෂ ප්‍රගතියක් නොමැතිව පසුව විසුරුවා හරින ලදී;
3. 1990 දී – ආචාර්ය ඒ.එම්.එම්. ෂහාබ්දීන් මහතාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද මෙම කමිටුව, වසර දෙකක් ඇතුළත වාර්තාවක් සූදානම් කර රජයට පිරිනැම්මෙන්, මේ දක්වා තිබූ ඉතාම සාර්ථක කමිටුව විය. මුස්ලිම් නායකයින්ට හෝ එවකට පැවති රජයට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ දේශපාලනික ප්‍රමුඛත්වයත් නොවූ නිසා, මෙම ක්‍රියාවලිය ව්‍යවස්ථාදායක පියවරක් නොමැතිව අවසන් විය;
4. 2009 දී – එවකට සිටි අධිකරණ ඇමති විසින් හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු සහ ජනාධිපති නීතිඥ විනිසුරු සලීම් මාර්සූෆ් ගේ ප්‍රධානත්වයෙන්, මුස්ලිම් පවුල් නීතියෙහි ප්‍රතිසංස්කරණ පිළිබඳ සාමාජිකයින් 18 දෙනෙකුගෙන් යුත් කමිටුවකි [69].

වසර 2009 කමිටුව දිගටම ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙම අධ්‍යයනය ලියන අවස්ථාව වනවිට, ඒ වනතුරු කමිටුව විසින් එහි වාර්තාව රජයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවෙතත්, වසර 2016 පුරා මුස්ලිම් පවුල් නීතිය පිළිබඳ කමිටුවෙහි වාර්තාව අවසන් කරන කාලය ගැන, විවිධ මාධ්‍ය වාර්තා විවිධ දින වකවානු දක්වා ඇත.[70] නමුත් විශ්වාස කටයුතු ආරංචි මාර්ගවලින් දැනගන්නට ඇති පරිදි, බහුවිධ කණ්ඩායම් වලින් ලැබෙන පීඩනය උත්සන්න වීමත් සමග, කමිටුව විසින් එහි වාර්තාව සහ නිර්දේශ 2016 නොවැම්බර් මස[71] ඉදිරිපත් කිරීමට සැදී පැහැදී සිටියි.

මෙම අධ්‍යයනය අවසන් කිරීමේ කාලයේදී, වර්තමාන අධිකරණ ඇමති විජේදාස රාජපක්ෂ විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන සොයාබැලීමට, තවත් අනුකමිටුවක්[72] පත්කරන ලදී. මෙම කමිටුව, කබීර් හෂීම් (ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය), රවුෆ් හකීම් (ජල සම්පාදන සහ ජලාපවාහන අමාත්‍ය), රිෂාද් බදියුදීන් (කර්මාන්ත සහ වාණිජ අමාත්‍ය), ෆයිසර් මුස්තාෆා (පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍ය), එම්.එච්.එම්. හලීම් (මුස්ලිම් කටයුතු සහ තැපැල් සේවා අමාත්‍ය), චන්ද්‍රානි බණ්ඩාර (කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ ඇමතිනි), සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ (ජල සම්පාදන සහ ජලාපවාහන නියෝජ්‍ය ඇමතිනි), යන අයගෙන් සමන්විත වේ. කමිටුවෙහි වරම තවම පැහැදිලි නැත. තවද, එය විනිසුරු සලීම් මාර්සූෆ්ගේ කමිටුවෙන් ලැබීමට තිබෙන වාර්තාව සැළකිල්ලට ගනීවිද, නැතහොත් අළුතින් ආරම්භ කර නව නියෝජනයන් සඳහා කැඳවීම් කරයිද යන්න අපැහැදිලිය.

---

66 Ed. F.Zakariya, C. Kodikara 2011. *Women Claiming Rights and Spaces: Activism to Reform Muslim Law in Sri Lanka.* Muslim Women's Research and Action Forum (MWRAF). Colombo, Sri Lanka.

67 Act No 1. Of 1965

68 S. Goonesekera, 2000. *Muslim Personal Law in Sri* Lanka- Some Aspects of Law on Family Relations. Muslim Women's Research and Action Forum (MWRAF), Colombo, Sri Lanka

69 Article - *Cabinet Has Approved A Proposal Of Reforms To Muslim Matrimonial Law And Upgrading Quazi* http://target.lk/article.php?article=407

70 Muslim law reforms report to be finalized http://nation.lk/online/2016/07/02/muslim-law-reforms-report-finalized.html

71 Imtiaz, Zahrah *Long awaited Muslim Personal Law reforms in November* . Daily News, October 4. 2016.http://www.dailynews.lk/2016-10-03-193000/local/94818 ,

72 Imtiaz, Zahrah,. *Sub-committee on Muslim Marriage Act appointed* Daily News October 27, 2016 http://dailynews.lk/2016/10/27/local/97245 .

# ප්‍රතිසංස්කරණයට (පවතින) බාධක සහ අභියෝග

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව, නෛතික සහ ආගමික යන අංශ දෙකම සැළකිල්ලට ගත යුතු බව තේරුම්ගෙන ඇත. මෙය ඒ තුළම සහ ඒ ගැනම බලනවිට සංකීර්ණ සහ දුෂ්කර ක්‍රියාවලියක් වේ. කෙසේවෙතත්, මෙහි නියැලෙන ක්‍රියාකරන්නන් ඒ ගැන සියුම් විශ්ලේෂණයක් කිරීමේදී ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ අමතර බාධක සහ අභියෝග හඳුනාගෙන ඇත.

මෙම අධ්‍යයනය විසින් හඳුනාගත් ප්‍රධාන හේතූන් වන්නේ:

## 1. රාජ්‍යය: නායකත්වය නොමැතිවීම සහ වගකීම මඟහැරීම

ශ්‍රී ලංකා රජය අදාළ අමාත්‍යාංශ සහ ආයතන සමග, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම කෙරෙහි දරා ඇත්තේ ඉතා සුළු උත්සාහයකි. එමෙන්ම, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණදෙන ගැටළු වලට විශාල වශයෙන් උදාසීන වී ඇත.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අදාළ ගැටළු, විශේෂයෙන් විවාහවීමේ වයස, දික්කසාදය, මෙන්ම, දණ්ඩ නීති සංග්‍රහයේ ව්‍යවස්ථාමය ස්ත්‍රී දූෂණ ප්‍රතිපාදන ගැන, ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන මගින් කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කොට සැළකීම් තුරන් කිරීමේ සම්මුතියෙහි (CEDAW) කමිටුවට ඉදිරිපත් කළ වාර්තාවල නැවත නැවතත් පැන නැගී ඇත. කෙසේවෙතත්, රජය ප්‍රතිසංස්කරණ සඳහා වගකීමෙහි බර ආපසු මුස්ලිම් ප්‍රජාව වෙත පැටවීමට තෝරාගෙන ඇත. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකා රජය විසින් CEDAW කමිටුව වෙත යවන ලද 1999 ඒකාබද්ධ තෙවැනි සහ සිව්වැනි වාර්තාව, මෙම ගැටළුවලට අදාළව, වෙනස්කොට සැළකීමේ පෞද්ගලික නීති පිළිගන්නා ලදී. කෙසේවෙතත්, පහත සඳහන් ප්‍රකාශය හරහා රජය විසින් පියවර ගැනීමට ඇති වගකීමෙන් නිදහස් වෙයි. "*මෙම වෙනස්කොට සැළකීමේ ලක්ෂණ ප්‍රධාන වශයෙන් සංස්කෘතික සහ ආගමික විශ්වාසයන් තුළ ගැඹුරින් මුල් බැසගත් ඒවා වේ. බහුත්වවාදී ආගමික සහ ජනවාර්ගික විශ්වාසයන්ට සංවේදීතාව අවශ්‍ය කරන පරිසරයක, මෙම ගැටළු ආමන්ත්‍රණය කිරීමට හැකිවී නොමැත. බලපෑමට ලක්වූ ප්‍රජාවන් තුලින් වෙනසක් සඳහා කෙරෙන ඉල්ලීමකින් අනිවාර්යයෙන් ප්‍රතිසංස්කරණවලට පහසුකම් සැපයෙනු ඇත*[73]".

පසුගිය දශක කිහිපය පුරාම මුස්ලිම් ප්‍රජාව තුළින් ප්‍රතිසංස්කරණ සඳහා ඉල්ලුම් කළ හඬවල් තිබියදීත්, ප්‍රජාව නියෝජනය කරන බව කියාගන්නා සහ/හෝ "ඉස්ලාමීය දෘෂ්ටිකෝණය" ගැන තර්ක කරන බව කියාගන්නා සාමාන්‍යයෙන් පිරිමි ගතානුගතික සංවාදකයින්ගෙන් ඔබ්බට අන් කිසිවෙක් සමග සංවාදයේ යෙදීමට රජය පසුබට වී ඇත. මුස්ලිම් කාන්තාවන්ට බලපාන ගැටළුවලට විසඳුම් සෙවීමට මෙන්ම ප්‍රතිසංස්කරණ ගැන සම්මුතියක් ගොඩනඟා ගැනීමට රාජ්‍ය ක්‍රියාකරන්නන් විසින් මුස්ලිම් ප්‍රජාව මත වගකීම පටවා ඇත. ඉස්ලාමීය නීති මීමංසාව සහ මහජන මතය යන දෙකටම සම්බන්ධව මුස්ලිම් ප්‍රජාව තුළ පවතින විසම්මුතික අදහස් රජය මගින් නොසළකා හැර ඇත.

මින් අදහස් වන්නේ, රාජ්‍ය නියෝජිතයින් කාන්තා අයිතීන්, ළමා අයිතීන් හෝ මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන ජාතික ක්‍රියාකාරී සැලසුම් වලින්, මුස්ලිම් කාන්තාවන්ගේ සුවිශේෂී ගැටළු පහසුවෙන් බැහැර කර ඇති බවයි; නීතිය ක්‍රියාත්මක කරන සහ පළාත් පාලන රාජ්‍ය ආයතන, ප්‍රජා කණ්ඩායම් මගින් කාන්තාවන් එරෙහි උල්ලංඝනයන් සිදුකරන විට ඒවා නොදුටුවාක් මෙන් සිටින බවයි; දණ්ඩ නීති සංග්‍රහය වැනි පොදු නීති තුල වයස අවුරුදු 16 ට අඩු මුස්ලිම් ගැහැණු ළමයින්ට සිදුවන ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ සඳහා ව්‍යතිරේකයක් පවතින බව සහ ශ්‍රී ලංකාව ඔවුන්ගේ මුස්ලිම් පුරවැසියන් හට බාල වයස්කාර විවාහ සඳහා නෛතිකව ඉඩදෙන බවයි. මේවා අතර තවත් බොහෝ උදාහරණ ඇත.

මේ අවස්ථාවේදී, අධිකරණ අමාත්‍යාංශය, මුස්ලිම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාව, කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රී බල මණ්ඩලය, ජාතික ළමාරක්ෂක අධිකාරිය සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන සහ

---

73 CEDAW/C/LKA/3-4. Committee on Elimination of Discrimination Against Women (CEDAW) 1999, Consideration of reports submitted by State parties under article 18 of the Convention on All Forms of Discrimination Against Women http://www.un.org/womenwatch/daw/cedaw/cedaw26/lka3-4.pdf)

මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මුස්ලිම් කාන්තාවන් හට බලපාන නෛතික සහ යුක්තියට සම්බන්ධ ගැටළු ගැන ප්‍රමාණවත්ව දැනුවත් සිටියිද යන්නද, අපැහැදිලිය.

පියවර ගැනීම පිණිස කෙරෙන ජාත්‍යන්තර ඉල්ලීම් පවා රජය නොසළකා හැර ඇත. උදාහරණයක් වශයෙන්, මුස්ලිම් පවුල් නීතිය ප්‍රතිසංස්කරණයට සම්බන්ධව පියවර ගන්නා ලෙස මෑතකදී ශ්‍රී ලංකා රජයට ඉල්ලීම් කරන ලද්දේ 2010 නොවැම්බර් මස ජිනීවා හිදී ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර කමිටුවෙහි 54 වෙනි සැසිය අතරවාරයේ ය. ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර කමිටුවෙහි 16 සහ 17 වන වගන්ති යටතේ රාජ්‍ය පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සළකා බැලීමෙන් පසු එම කමිටුව ප්‍රබල සමාප්ත කිරීමේ නිරීක්ෂණ[74] සිදු කළේය.

කමිටුව විසින් ඉදිරිපත් කළ විශේෂයෙන් අදාළ කාරණය වන්නේ, කාන්තාවන්ට සමානාත්මතාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට වහා ඉටුකළ යුතු වගකීමක් තිබෙන බව සහ **''ඔවුන්ගේ නීති සංශෝධනය කිරීම ඊට සම්බන්ධ ප්‍රජාවන් ගේ කැමැත්ත මත රඳා පැවතිය නොහැකි බවයි''.** 2012 අගෝස්තු මස පැවැත්වූ මානව හිමිකම් කවුන්සිලයේ ක්‍රියාකාරී කණ්ඩායමෙහි ශ්‍රී ලංකාව පිළිබඳ විශ්ව කාලීන සමාලෝචනයේ 14 වැනි සැසියේ [75] දී, මෙම සමාප්ත කිරීමේ නිරීක්ෂණ යොමුකරන ලදී. එය පහත සඳහන් ලෙස දැක්වේ*:*

> '1998 සිට ගිවිසුම් ආයතන මගින් නැවත නැවතත් කරනලද නිර්දේශ තිබියදීත්, රාජ්‍ය පාර්ශ්වය කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහිව වෙනස් කොට සළකන, 1935 ඉඩම් සංවර්ධන පණත සහ වයස අවුරුදු 12 ක් තරම් කුඩා ගැහැණු ළමයින්ගේ බාල වයස් විවාහ වලට අවසර දෙන මුස්ලිම් පෞද්ගලික නීතියෙහි ප්‍රතිපාදන වැනි ව්‍යවස්ථාපිත සහ පුද්ගලික නීති තවමත් අහෝසිකර නැති බව සහ පිරිමින් සහ කාන්තාවන්ගේ පවුල සහ සමාජමය භූමිකා ගැන ඒකාකෘතීන්, ආකල්ප සහ පීතෘමූලික සම්ප්‍රදායයන් වල නොකඩවා පැවැත්ම ආමන්ත්‍රණය කිරීමට සීමිත පියවරවල් පමණක් ගෙන ඇති බව ගැන කමිටුව සැළකිලිමත් වේ. ඔවුන්ගේ පෞද්ගලික තත්ත්ව නීති සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය පාර්ශ්වය ප්‍රජාවන් මතම විශ්වාසය තැබීම ගැන සහ කාන්තා පණත් කෙටුම්පත සියළුම ප්‍රජාවන්ගේ කාන්තාවන් සහ ගැහැණු ළමයින් බාලවයස් සහ බලහත්කාරයෙන් කෙරෙන විවාහ වලින් ආරක්ෂා නොකිරීම ගැනද කමිටුව බරපතළ ලෙස සැළිකිලිමත් වෙයි'. (3 වන වගන්තිය)
>
> 'සියළු ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතීන් භුක්ති විඳීමට පිරිමින්ට සහ කාන්තාවන්ට ඇති සමාන අයිතිය ඔවුන්ගේ නීති සංශෝධනය කිරීම ඊට සම්බන්ධ ප්‍රජාවන්ගේ කැමැත්ත මත රඳා පැවතිය නොහැකිවීම රාජ්‍ය පාර්ශ්වයන් විසින් වහාම ඉටුකළ යුතු වගකීමක් බව කමිටුව රාජ්‍ය පාර්ශ්වය වෙත මතක් කර සිටියි. එබැවින් කාන්තාවන්ට එරෙහිව වෙනස් කොට සළකන සියළු ව්‍යවස්ථාපිත නීති අහෝසිකිරීමට වහාම පියවර ගන්නා ලෙසද, බාල වයස් විවාහ නීතිවිරෝධී කිරීමේ අදහසින් මුස්ලිම් පෞද්ගලික නීතිය සංශෝධනය කර එය ජාතික නීතිවලට අනුකූල වන ලෙස තබන ලෙසත්, කමිටුව රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලා සිටියි. කාන්තාවන් හට ඔවුන්ගේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතීන් භුක්ති විඳීම වළක්වන ඒකාකෘතීන්ට එරෙහිව ඉලක්කගත අධ්‍යාපනික වැඩසටහන් සහ ජන සන්නිවේදන ව්‍යාපාර හරහාද ඇතුලත්ව, කාන්තාවන් සහ පිරිමින් අතර සමාජයේ සියළු මට්ටම්වල සමානාත්මතාවය දැඩිව ප්‍රවර්ධනය කරන ලෙසටද කමිටුව රාජ්‍ය පාර්ශ්වයට අනුබල දෙයි. කමිටුව පිරිමින් සහ කාන්තාවන්ගේ සමාන අයිතීන් ගැන **එහි** පොදු ප්‍රකාශය අංක 16 (2005) වෙත රාජ්‍ය පාර්ශ්වයේ අවධානය යොමු කරයි.'

---

[74] E/C.12/LKA/CO/2-4. Concluding observations of the Committee on Economic, Social and Cultural Rights on Sri Lanka. Committee on Economic, Social and Cultural Rights, Forty-fifth session. Geneva, 1-19 November 2010

[75] A/HRC/WG.6/14/LKA/2. Compilation prepared by the Office of the High Commissioner for Human Rights in accordance with paragraph 5 of the annex to Human Rights Council resolution 16/21 - Sri Lanka,13th August 2012 14th Working Group of the Universal Periodic Review.

## 2. මුස්ලිම් නායකයෝ කාන්තා ගැටළු ගැන දේශපාලනික අධිෂ්ඨානය සහ අප්‍රමාණවත් අවධානය පෙන්නුම් කරති

පසුගිය දශක කිහිපය තුළ, මුස්ලිම් දේශපාලන නායකයින් ප්‍රධාන රාජ්‍ය පදවි දරන ලද අතර, ඔවුන්ට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට ප්‍රතිසංස්කරණ සඳහා, පහසුකම් සැලසීමටද, කඩිනම් කිරීමටද, සම්පූර්ණ කර ගැනීමටද, හැකියාව තිබුණි. පොදුවේ සඳහන් කරන උදාහරණයක් නම්, ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ වර්තමාන නායක අමාත්‍ය රවුෆ් හකීම්ය. ඔහු වසර 2012 සහ 2014 අතර අධිකරණ අමාත්‍ය ධූරයේ සිටි කාලයේ මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයෙක් සහ දේශපාලන නායකයෙක් ලෙස ඔහු විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සඳහා නායකත්වය සපයනු ඇතැයි ප්‍රතිසංස්කරණ හිතවාදී කේවල් කරන්නන් හට බලාපොරොත්තුව සහ පූර්වාපේක්ෂාව තිබුණි. ආගමික උලමාවරුන්ගේ එකඟත්වය ඇතිව ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන බව ඔහු බහුවිධ අවස්ථාවලදී ප්‍රකාශ කළ බව ක්‍රියාකාරීහු සඳහන් කරති. කෙසේවෙතත්, අදාළ පාර්ශ්වයන් සමග සංවාදය යෙදී, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය කඩිනම් කර එය විසඳුමක් කරා ගෙනයාමට ඔහුගේ පාර්ශ්වයෙන් ප්‍රසිද්ධියේ ගත් කිසිදු උත්සාහයක් නොමැත.

තමාගේ ඡන්දදායකයින්ගෙන් ප්‍රධාන කොටසකට බලපාන ගැටළු ගැන හොඳින් දන්නා අනෙකුත් මුස්ලිම් දේශපාලඥයින් ද, කිසිදු උනන්දුවක් හෝ මෙම ගැටළු ආමන්ත්‍රණය කිරීමට ඔවුන්ගේ සහාය දැක්වීමට අභිලාෂය හෝ, ප්‍රසිද්ධියේ විදහා දක්වා නැත. මෙය ආගමික නායකයින්ගේ සහ මැතිවරණ බල ප්‍රදේශවල සහයෝගය නැතිවේයැයි දැනෙන බිය නිසාද, නැතහොත් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණය ගැන කරන ඕනෑම සාකච්ඡාවක් ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් දේශපාලන අනන්‍යතාවයෙහි අගය හීනකරයි යන විශ්වාසය නිසාද, නැතහොත් පුද්ගලික වැටහීම් නැතහොත් පවතින තත්ත්වය එලෙසම පවත්වාගෙන යාමට ඇති උනන්දුව නිසාද, යන්න අපැහැදිලිය.

මුස්ලි දේශපාලඥයෝ සාමාන්‍යයෙන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ උලමාවරුන් (ආගමික විද්වතුන්) පිළිනොගන්නා විෂයයක් ලෙස මඟහරිති. මෙම බියට හේතුව, සංවාදය සඳහා දරන ලද අවංක උත්සාහයන්ගේ අත්දැකීම් මත පදනම් වුවක්ද, නැතහොත් වෙනස්කම්වලට විසඳුම් සෙවීම සඳහා දේශපාලන සහ ආගමික නායකත්වය අතර විෂය ගැන පැවති සාකච්ඡා පදනම් කර ගෙනද, නැතහොත් එය හුදෙක් අක්‍රියතාව සහ අඩුවෙන්ම ප්‍රතිවිරෝධතා පෑමේ මාර්ගය තෝරාගැනීම පිණිස පහසුවෙන් ඉදිරිපත් කරන නිදහසට කරුණක්ද යන්න විශාල ප්‍රශ්නයක්ව පවතී.

එමෙන්ම, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අදාළව පැන නැඟී ඇති ගැටළු ගැන ඔවුන්ගේම මැතිවරණ බල ප්‍රදේශ සමඟ ප්‍රමාණවත් ලෙස නිරත වී ඇතිදැයි යෝජනා කිරීමට හෝ ප්‍රතිසංස්කරණ ගැන අදහස් උරගා බැලීමට හෝ දෙශපාලඥයින් ප්‍රමාණවත් ලෙස නිරත වී ඇතිදැයි සොයාබැලීමට මේ වනවිට කිසිදු සාක්ෂියක් නොමැත. ප්‍රතිඥාවලින් ඔබ්බට, මුස්ලිම් දේශපාලන නායකයින් විසින් ඔවුන්ගේ කාන්තා ඡන්දදායකයින් සමග මේ ගැන ක්‍රමානුකූලව අදහස් විමසීමට වැඩි වැදගත්කමක් ලබාදී නැත. ඒ වෙනුවට ඔවුහු ඔවුන්ගේ සම්පූර්ණ විශ්වාසය තබන්නේ ගතානුගතික පිරිමින් සහ සම්පූර්ණයෙන් පිරිමින්ගෙන් සමන්විත වන ආගමික ආයතනවල තක්සේරුව සහ විශ්ලේෂණය මතය. ඔවුහු මෙම ගැටළුව ගැන කාන්තාවන්ට අවශ්‍ය කරන දේශපාලන වගවීම විදහා නොදක්වන අතර, වාර්ගික සීමාවන් ආරක්ෂා කිරීම සඳහා බොහෝසේ දොඩමලු වී ඇත. උදාහරණයක් වශයෙන්, මුස්ලිම් නොවන දේශපාලඥයින් මුස්ලිම් කාන්තාවන්ට සම්බන්ධ ගැටළු ගැන පාර්ලිමේන්තුව තුළ හෝ පොදු සංසද තුළදී ප්‍රශ්න නැගුවහොත්, මුස්ලිම් දේශපාලඥයෝ සහ මුස්ලිම් මාධ්‍යය මගින් මේවා ධනාත්මක ලෙස හසුරුවන්නේ නැතිව, ඔවුන්ට පහරදී නිශ්ශබ්ද කරති. වාර්ගික නියමයන් හරහා කාන්තා එකමුතුකම පහත් කොට සළකති.

මුස්ලිම් කේවල් කරන්නන්, ක්‍රියාකාරීන් සහ බලපෑමට ලක්වූ ප්‍රජාවගෙන් ලැබෙන සෘජු කැඳවීම් තිබියදීත්, මෙම නායකයන්ගෙන් ප්‍රතිසංස්කරණය ගැන තිරසාර ගනුදෙනුවක් රජය සමග තිබී නැත. සිවිල් සමාජයේ සීමාසහිත සහ හිටි හැටියේ රාජ්‍ය ක්‍රියාකරන්නන් සමග කෙරෙන ගනුදෙනුව රාජ්‍ය පාර්ශ්වයන් විසින් කිසිම උත්සාහයක් දරනු ඇතැයි යන්න ගැන විශ්වාසයක් හෝ පැහැදීමක් නොමැතිකමෙහි ප්‍රතිඵලයක් සහ වචනවලින් පොරොන්දු වන නමුත් කිසිම ප්‍රත්‍යක්ෂ පියවරක් නොගනු ඇතැයි සිතා දේශපාලඥයින් වෙතට ප්‍රවේශ වීම ගැන ප්‍රවේසම් වීමය.

.

## 3. මුස්ලිම් ප්‍රජාව සහ රාජ්‍යය අතර සංවාදකයින් අවශ්‍යයෙන්ම කාන්තාවන්ගේ දෘෂ්ටිකෝණය සහ අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම හෝ සමානාත්මතාවය පදනම් කරගත් ප්‍රතිසංස්කරණ සඳහා අපේක්ෂා කිරීම නොකරති

මුස්ලිම් ප්‍රජාවේ ‘නියෝජිතයින්’ සහ ‘හඬ’ වශයෙන් සාමාන්‍යයෙන් සළකනු ලබන සංවාදකයින්, පිරිමි දේශපාලඥයින්, ඔවුන්ගේ සමාජ තත්ත්වය, කීර්තිය සහ වෘත්තීය ජයග්‍රහණයන් හේතුවෙන් බලගතු නීතිමය සහ අන් වෘත්තිකයින්, සහ ජාතික මට්ටමේ ආගමික නායකයින් සහ මුස්ලිම් ප්‍රජාව තුළ ආයතන වලින් සමන්විත වේ.

ප්‍රධාන සංවාදකයින් අතර බොහෝදෙනා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි සහ කාති අධිකරණ පද්ධතියෙහි යම් සීමාකාරී ප්‍රතිසංස්කරණ කිරීමට නම්‍යශීලී වන අතර, එය මුස්ලිම් ප්‍රජාව තුළින්ම පළ කර ඇති බොහෝ ගැටළු හේතුවෙන් සිදුකිරීමට අවශ්‍ය කර්තව්‍යයක් ලෙස දකිති. කෙසේවෙතත්, ප්‍රජාව තුළ මුස්ලිම් කාන්තාවන්ගේ ස්ථාවරය සහ සමාජ තත්ත්වය ගැන පීතෘ මූලික සංකල්පනාවලින් ප්‍රාථමිකව පැන නැඟෙන බහුවිධ හේතූන් නිසා, ප්‍රධාන සංවාදකයින් කියාපාන අදහස් ගැටළු සහගත සහ අසම්පූර්ණ වේ. මේ සම්බන්ධයෙන් ඉස්ලාමීය නීතිය අර්ථ නිරූපනය සහ ප්‍රතිසංස්කරණ ගැන වඩාත් ගතානුගතික අදහස් දරන සංවාදකයින් වෙනසට ප්‍රතිරෝධය දක්වමින්, සංවාදයේ ස්වභාවය වෙනස් කරමින් ප්‍රතිසංස්කරණ ප්‍රමාද කිරීමට හෝ කඩින්කඩ කිරීමට දේශපාලනඥයින්ට බලපෑම් කරති. නැතහොත් පිරිමින් සහ කාන්තාවන් සඳහා, නීතිය ඉදිරියේ පුළුල්ව පිළිගත් සමානාත්මතාවයේ සහ වෙනස්කොට නොසැළකීමේ ප්‍රමිතිය සපුරන්නේ නැති ඉතා සීමිත ප්‍රතිසංස්කරණ සමූහයක් සඳහා පෙළඹවීම් කරති.

> ඔබ ඓතිහාසික සළකුණු, සීමාවන් සහ වාරණ දෙස බලන කළ, එය එක්කෝ මුස්ලිම් ආගමික ප්‍රභූන් හෝ දේශපාලන ප්‍රභූන් වී ඇත.
>
> - ෆයිසූන් සැකරියා

### 3.1. සංවාදකයින් ලෙස මුස්ලිම් පිරිමි දේශපාලඥයින් සහ බලගතු පුද්ගලයින්

මුස්ලිම් දේශපාලඥයින් කාන්තාවන්ගේ ගැටළු ගැන විදහා දක්වන දේශපාලන අධිෂ්ඨානය නොමැතිකම සහ අප්‍රමාණවත් අවධානයට අමතරව, මුස්ලිම් ප්‍රජාවේ නියෝජිතයින් ලෙස සැළකෙන බලගතු වෘත්තිකයින්ද ‘ආරක්ෂිත’ ලෙස සැළකෙන මතයන් කියා පා ඇත. සමහර විට ඔවුන් යම් ආකාරයක ප්‍රතිසංස්කරණ වලට සහයෝගය දක්වනවා විය හැකි අතර, ඔවුන්ගේ ඉල්ලීම් ප්‍රකාශකිරීම් පදනම් වී ඇත්තේ ප්‍රජාව මුහුණදෙන ගැටළු මත නොව, මුස්ලිම් නොවන නායකයින් ඇතුළුව, මුස්ලිම් නොවන ප්‍රජාව මෙම ගැටළුව දකින්නේ කෙසේදැයි යන්න මතය. තවද, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට වැඩි විධානයක් යොමුකිරීමෙන් අන්තවාදී කණ්ඩායම් වල මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි සියුම් පරීක්ෂාවකට එය ආරාධනාවක් වේවිද සහ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව තවදුරටත් වර්ගවාදය ඇතිකිරීමට එය ‘පෝෂ්‍යය’ ක් වේවිද යන්න ගැන ඔවුහු සැළකිලිමත් වෙති. මෑතකදී මුස්ලිම් ප්‍රජාවට බලපෑ වර්ගවාදී සිද්ධීන් සහ මුස්ලිම් විරෝධී හැඟීම් ඇතිවීමේ සාධකය මගින් ඔවුන්ගේ දෘෂ්ටිකෝණයට තවත් රුකුල් දී ඇති අතර, ප්‍රතිසංස්කරණ පිළිබඳ පණත් කෙටුම්පත, විවාදය සඳහා පාර්ලිමේන්තුව වෙත පැමිණියහොත්, මෙය තවදුරටත් උත්සන්න විය හැකි බවට මෙවන් සංවාදකයින් අතර බියක් පවතී.

සමහරුන්ගේ අදහස වන්නේ ප්‍රතිසංස්කරණ කළ යුත්තේ ’ටික ටික පදනම’ මත බවය. මේ පාර්ලිමේන්තුව හරහා අනතුරකට ලක් නොවී යා යුතු දේ ගැන ඔවුන්ගේ අවබෝධය පදනම් කරගෙනය. එනම්, පරිපාලනමය වෙනස්කම් සහ කාති අධිකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම් වැනි ඒවාය. මේ අතර, හරයාත්මක ප්‍රතිපාදන ඇතුළු තීරණාත්මක ප්‍රතිසංස්කරණ වඩාත් ‘හිතකර’ කාලයක් සඳහා ඉතිරි කළ යුතු බවය. පසුගිය තිස් වසර තුළ, ටික ටික හෝ වෙනත් අන්දමකින් ප්‍රතිසංස්කරණ කිසිවක් සිදු නොවී තිබියදීත්, තත්ත්වය මෙසේ වීමෙන්, මේ ඔස්සේ තර්ක කිරීමෙහි බොරුව එළිදරව් වේ.

මෙම සංවාදකයින්ගේ ප්‍රථම කාණ්ඩය ගැන නිරීක්ෂණය කර ඇති දේ නම් ඔවුහු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි වරද පැටවීම සඳහා සමස්ථ ලංකා ජම්යියාතුල් උලමා වැනි ආගමික ආයතන බිල්ලක් ලෙස නිතර භාවිත කරති. මෙම කණ්ඩායම විසින් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ප්‍රමාද වීමට හේතුව ලෙස උදාහරණයක් වශයෙන්, කාන්තා කාතිවරුන් සඳහා ප්‍රතිපාදන නිර්දේශ කිරීම් වැනි දේ උපුටා දක්වා ඇත. එයට හේතුව ලෙස දැක්වෙන්නේ, ප්‍රතිසංස්කරණ කමිටු සාමාජිකයින්ගේ ගතානුගතික මතිමතාන්තර නිසා මෙම ගැටළුව ගැන එකඟත්වයට පැමිණීමට නොහැකි වීමයි.

### 3.2. සංවාදකයින් ලෙස මුස්ලිම් ආගමික නායකත්වය

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන්ගෙන් හෝ මතවාද කණ්ඩායම් වලින් ජනනය වන බොහෝ ආගමික ආයතන ඇත. මෙවැනි එක් ආයතනයක් වන සමස්ථ ලංකා ජමියියාතුල් උලමා (ACJU) "ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් හට ආගමික සහ ප්‍රජා නායකත්වය සපයන ඉස්ලාමීය දේවධර්මවාදීන්ගේ අග්‍ර ගණ්‍ය ආයතනය"[76] ලෙස සැළකේ. මෙම සංවිධානය වසර 1977 සිට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සාකච්ඡාවලට සම්බන්ධ වී ඇත. එහි සභාපති සහ ප්‍රධාන ලේකම් 2009 මුස්ලිම් පවුල් නීතිය ප්‍රතිසංස්කරණ කමිටුවෙහි සාමාජිකයෝ වෙති. සමස්ථ ලංකා ජමියියාතුල් උලමා සංවිධානය හට නෛතික බලයක් හෝ කාතිවරුන් හෝ කාති මණ්ඩලය සමග විධිමත් සම්බන්ධතාවයක් නැති අතර, එය ආගමික උපදෙස් සැපයීම සහ ඉඳහිට කාතිවරුන්ට පුහුණු පවත්වයි. එය වසර 2009 දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) සහයෝගය ඇතිව කාතිවරුන් සඳහා පුහුණු දෙකක් පැවැත්වීය.

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට ප්‍රතිසංස්කරණ අවශ්‍යද නැද්ද යන්න ගැන ප්‍රධාන මුස්ලිම් මතවාදී කණ්ඩායම් අතර මතයෙහි වෙනසක් දැනට පවතින අතර, ACJU වැනි ප්‍රධාන ආගමික කණ්ඩායම් සමහර ප්‍රතිසංස්කරණවලට සහයෝගය දක්වා, අන් ඒවා 'ඉස්ලාමීය නොවන' පදනම මත ප්‍රතික්ෂේප කරති. උදාහරණයක් ලෙස, ඔවුහු කාති අධිකරණවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීමට සහයෝගය දක්වන අතර, මුස්ලිම් කාන්තාවන් හට කාතිවරුන්, විවාහ රෙජිස්ට්‍රාර්වරු හෝ විනිශ්චය කරන්නන් ලෙස කටයුතු කිරීම වැනි ඒවාට ඉඩදෙන ප්‍රතිපාදන ප්‍රතිසංස්කරණ සඳහා සැළකිල්ලට නොගත යුත්තේ, මුස්ලිම් කාන්තාවන් හට එවැනි තනතුරු දැරිය නොහැකි නිසාය. මෙම දෘෂ්ටිකෝණය ඇති පුද්ගලයෝ මුස්ලිම් ප්‍රජාව තුළ සැළකිය යුතු සමාජයීය, ආගමික බලපෑමක් ඇති අය මෙන්ම, මුස්ලිම් සහ මුස්ලිම් නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වැනි රාජ්‍ය ක්‍රියාකරන්නන් මත සැළකිය යුතු බලපෑමක් ඇති අය වෙති.

ආගමික කාරණා පිළිබඳ ප්‍රාථමික සංවාදකයෙක් ලෙස, කාති අධිකරණ පද්ධතිය නිසා කාන්තාවන්ට බලපෑම් කරන ඒවා වැනි මුස්ලිම් ප්‍රජාව තුළ බහුල භාවිතයන් සහ එහි බලපෑම ගැන ACJU සංවිධානය නොදන්නවා විය නොහැක. මේ කාරණා දිගටම සිදුවෙමින් සහ නිරන්තරයෙන් එළිදකිමින් පවතිද්දී, ඒවා පිළිබඳව ACJU සංවිධානය විසින් ලබාදෙන උපදෙස් සහ ගන්නා පියවරවල ස්වභාවය පිළිබඳව ප්‍රධාන ප්‍රශ්නයක් පවතී. ACJU සංවිධානය, එය සතු දේශපාලනික සහ ප්‍රජා බලපෑමත් සමඟ දශක ගණනාවක් තිස්සේ මුස්ලිම් ප්‍රජාව තුළ සිදුවෙමින් පවතින උල්ලංඝන ආමන්ත්‍රණය කිරීමට මීට වඩා උත්සාහයක් ගත හැකිව තිබුණි. මෙම ගැටළුව ආමන්ත්‍රණය කිරීමේදී, ප්‍රාදේශීය ආගමික නායකයින් සහ ඡන්ද බල ප්‍රදේශ සමග සංවාදය සහ දැනුවත් කිරීම් හරහාද, මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග කේවල් කිරීමෙන් සහ රාජ්‍ය සහයෝගය ලබාගැනීමෙන් ඔවුන්ට බොහෝ දේ අත්පත් කරගත හැකිව තිබිණි.

## 4. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත පිළිබඳව මුස්ලිම් ප්‍රජාව ඇතුළත ප්‍රතිවිරුද්ධ මතිමතාන්තර සහ ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍යතාව සහ හැකියාව

ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු ජනවර්ගය සහ නීති මීමංසාවේ ගුරුකුල සහ මතවාදයන් මත පදනම් වූ විවිධත්වයෙන් යුත් ප්‍රජාවක් පමණක් නොව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ වැනි කාරණා ගැන වුවද මතයන්ට අදාළව ඔවුහු වෙනස් වෙති. ප්‍රතිසංස්කරණවලට ප්‍රධාන අභියෝගවලින් එකක් වී ඇත්තේ, ඒවා සමග ගනුදෙනු කිරීම සහ සම්මුතියකට පැමිණීම සංකීර්ණ කාර්යයක් බවට පත් කරන එකිනෙකට වෙනස් (අපසාරී) මතිමතාන්තර නිසාය.

### 4.1. දැනුවත්භාවය සහ ප්‍රමාණවත් තොරතුරු නොමැතිකම නිසා දෘෂ්ටිකෝණය තුළ පවත්නා වෙනස්කම්

ප්‍රථමයෙන්ම, මුස්ලිම් ප්‍රජාව තුළ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැනම සහ එය ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට අදාළ වන්නේ කෙසේද යන්න ගැන දැනුවත්භාවය සහ අවබෝධය බරපතළ ලෙස නොමැති වේ. සංවිධාන සහ පුද්ගලයින් ඔවුන්ගේ පාර්ශ්වයෙන් දැනුවත්භාවය නඟා සිටුවීමේ උත්සාහයන් දැරුවත්, සියුම් වෙනස්කම් පසෙක තබා, මූලික විස්තර පවා, පුළුල් ප්‍රජාවට කාවැදී නැත. මුස්ලිම් විවාහ සහ දික්කසාද

76 The ACJU has 145 branches island-wide and handles all matters concerning Islamic Jurisprudence including assisting the Muslim community in an advisory capacity[76]. Source: http://www.acju.lk/about-us

පණත ප්‍රජාව තුළ පොදුවේ සාකච්ඡා කරන විෂයයක් නොවන අතර, විවාහයට පෙර යුවල් සමග සාකච්ඡාවට ලක්කරන විෂයයක් හෝ ආගමික අධ්‍යාපනයෙහි කොටසක් ලෙස උගන්වන්නක්ද නොවේ. මෑතක් වනතුරු, සීමිත ජනතා චක්‍රයකින් ඔබ්බට, ප්‍රතිසංස්කරණ සඳහා ඉල්ලීම, බලපෑමට ලක්වූ මුස්ලිම් කාන්තාවන් විශාල කණ්ඩායම් වලින් මතුවන්නක් බව දැනුවත් කර නැත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර ප්‍රතිසංස්කරණ ගැන සාකච්ඡාවක් හෝ ඉස්ලාමීය රාමුව සහ/හෝ නෛතික පද්ධතිය ඇතුළත විකල්ප උපායක් (පිහිටක්) සෙවීම ගැන සාකච්ඡාවක් තිබී නොමැත.

මෙම දැනුවත්භාවය නොමැතිකම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන කිසියම් මිථ්‍යාවන් සහ දුර්මතයන් පැතිර පැවැත්මට ඉඩදී ඇත. එය මෙසේ තබාගැනීමද සමහර ගතානුගතික අංශවල අභිලාෂය වී ඇත. උදාහරණයක් ලෙස, එවැනි අවිඥානය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළට කාන්දු වී ඇති දේශීය සංස්කෘතික භාවිතයන් පිළිනොගැනීමෙන් සහ මෙම ගැටළුව ගැන ඉස්ලාමීය නීති මීමංසාවෙහි විපුල විවිධත්වය සහ භාවිතය මත මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත *ෂරියා* සමග ඒකාබද්ධ කිරීමට උපකාරී වී ඇත. මෙම ඒකාබද්ධ වීම "*ෂරියා* හෝ ඉස්ලාමීය නීතියට අත නොගැසිය හැක" වැනි හිමිකම් වලට මඟපාදන අතර, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණය ඉදිරිපත් කරන ඕනෑම විටක, එය සංවාදය නවත්වන ඇබයක් ලෙස භාවිතා කෙරේ.

තවද, මෙය මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් ගැන, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ ඇති වෙනස්කොට සළකන ප්‍රතිපාදනවල ප්‍රායෝගික බලපෑම ගැන ඇති අනවබෝධයට සම්බන්ධ, වඩා විශාල ගැටළුවක් පෙන්නුම් කරයි. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත *ෂරියා* නීතිය මත පමණක් පදනම් වී ඇති බව සහ එමනිසා එය වෙනස් කළ නොහැකි බව විශ්වාස කරන අය නීතියට සම්බන්ධව කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි වෙනස්කොට සැළකීම් සහ උල්ලංඝන වලටද අපාරගම්‍ය වෙති. මෙය, මුස්ලිම් කාන්තාවන්ට නිසිතැන දී ඉස්ලාම් මගින් ඔවුන්ව 'ආරක්ෂා කරන' බව සහ එමනිසා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත වැනි *ෂරියා* මත පදනම් වී ඇති නීති, සහජයෙන්ම කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට වෙනස්කොට නොසළකන බැවින් ඒවා වෙනස් නොකළ යුතුය යන බවට, ඇදහිල්ලෙන් මතුවන ඔවුන්ගේ විශ්වාසය නිසා විය හැක. තවද එය 'දිව්‍යමය නීතිය' ලෙස ඉදිරිපත් කරන විට, ඔවුන් හට ඇති කර්තෘත්වය ප්‍රත්‍යක්ෂ කර ගැනීමක් නොමැති නිසා විය හැක. එමනිසා දැනුවත්භාවය නොමැතිකම බෙලහීන කිරීමට හේතුවක් වී ඇත.

අනිත් අතට, ප්‍රතිසංස්කරණවලට පක්ෂව ක්‍රියා කරන්නන් නැවත නැවතත් පැහැදිලි කරදී ඇත්තේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණය කිරීම යනු ඉස්ලාමීය නීතිය හෝ *ෂරියා* වෙනස් කිරීම ගැන නොවන බවත්, එය ශ්‍රී ලංකාව තුළ නීති සංග්‍රහය සම්පාදනය කිරීම, අර්ථ දැක්වීම සහ භාවිතය සිදුවන අන්දමින් පැන නැගෙන ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කිරීම ගැන බවත් ය. ප්‍රතිසංස්කරණ සඳහා කේවල් කරන්නන් විසින්, අනෙකුත් බහුතර මුස්ලිම් රටවල, නීති මීමංසාවේ ප්‍රගතිශීලී අර්ථ දැක්වීම් පදනම් කරගෙන සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ලබාගැනීමේ අභිලාෂයෙන් කර ඇති ප්‍රතිසංස්කරණ ගැන පර්යේෂණ, සාක්ෂි සහ සංසන්දනාත්මක උදාහරණවල ඉදිරිපත් කිරීම් කර ඇතිවාක් මෙන්ම, නොකඩවා කරගෙනද යති.

කෙසේවෙතත්, මෙවැනි උත්සාහයන් මගින් ඒත්තු ගැන්වීමට හැකිවී ඇත්තේ ජනතාවගෙන් සුළු ප්‍රතිශතයකටය. පවතින තත්ත්වය පවත්වාගෙන යාම සිය ස්ථාවරය වුවන් හට, ඔවුන්ගේ ආගමික ව්‍යුහයන් සහ අධිකාරිය හරහා වඩාත් පුළුල් පැතිරීමක් පවතී. ඔවුන්ගේ බලගතු විරෝධය නිසා අනෙකුත් මධ්‍යස්ථ ක්‍රියා කරන්නෝ පවා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අවශ්‍ය බව දැන සිටියත්, එහි නියැලීම සීමාකරති. ආගමික නායකයින් සහ ප්‍රජාවේ ප්‍රභූන් මිථ්‍යාවන් අභියෝගයට ලක් නොකර තිබීමට ඉඩහරින අතර, ප්‍රතිසංස්කරණවලට පක්ෂ හඬවල් නිශ්ශබ්ද කර අවලංගු කිරීමට පදනමක් ලෙස එය භාවිතා කර ඇත.

## 4.2. ඉස්ලාමීය නීති මීමංසාව තුල ප්‍රතිවිරුද්ධ මතිමතාන්තර

පුළුල් මුස්ලිම් ප්‍රජාව තුළ නිරීක්ෂණය කෙරෙන තවත් බාධකයක් නම්, ප්‍රජාව තුළ පවතින විවිධත්වය සහ මෙම වෙනස්කම්වලට ඉඩ සලසන සහ ප්‍රතිසංස්කරණය සඳහා නිර්මාණාත්මක හැකියාවන් (ශක්‍යතාවන්) සපයන ඉස්ලාමීය නීති මීමංසාවෙහි සාරවත්භාවය අගය කිරීමක් නොමැතිකමය. ඒ වෙනුවට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ ප්‍රජාව එක එල්ලේම සිරකර තබා ඇත (කංචුක ලා තබා ඇත). රජය සහ අනෙකුත් මුස්ලිම් නොවන සහ මුස්ලිම් සිවිල් සමාජ ක්‍රියාකරන්නන් නිසි පිළිගැනීමක් දීමට අසමත් වී ඇති දේ නම්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි බොහෝ අංශයන් ගැන, ඉස්ලාමීය නීති මීමාංසාවෙහි විවිධ ගුරුකුල අතර ප්‍රතිවිරුද්ධ මතිමතාන්තර පවතින බවයි. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ලෙස තෝරාගත ඇත්තේ සහ 'දැඩිවම ෂරියා නීතිය' ලෙස සංවාදකයින් නිතර ප්‍රකාශ කර ඇත්තේ, ඇත්ත වශයෙන්ම ප්‍රධාන ගුරුකුල

යටතේ පවතින විවිධ විද්වත් මත අතරින් එක් පාඨාන්තරයක් පමණකි. නිතරම පාහේ, එය අර්ථ දැක්වීම්වලින් ඉතාමත්ම දැඩි අර්ථ දැක්වීම වේ.

ඉස්ලාම් තුළ සුන්නි සහ ෂී'ආ යනුවෙන් ප්‍රධාන නිකායන් දෙකක් ඇත. සුන්නි නිකායෙහි, ක්‍රි.ව. 10 වෙනි ශත වර්ෂයේ පමණ ප්‍රධාන ඉමාම්වරුන් සතර දෙනෙකු විසින් පිහිටුවන ලද ගුරුකුල පදනම් කරගත් ප්‍රධාන *මද්හබ්* සතරක් ඇත. මේවා නම්, ඉමාම් අබූ හනිෆා (හනාෆි ගුරුකුලය), ඉමාම් මලික් (මලිකි ගුරුකුලය), ඉමාම් ෂාෆි'ඉ (ෂාෆි'ඉ ගුරුකුලය), ඉමාම් ඉබන් හන්බාල් (හන්බාලි ගුරුකුලය) වේ. ශ්‍රී ලාංකීය සුන්නි මුස්ලිම් බහුතරය ෂාෆි'ඉ මද්හබ් (උදා. මුවර් සහ මැලේ) යටතේ වර්ගීකරණය කර ඇති නමුත්, හනාෆි සුළුතරයද (උදා. මෙමන් ප්‍රජාව) එයට ඇතුළත් වේ. ෂී'ආ නිකාය පිළිවෙලින් උප-නිකායන් තුනකට එනම් ඉත්නා'අෂාරි, ඉස්මයිලි (උදා. ඩාවුඩි බෝරා) සහ සෙයිදි [77] ලෙස බෙදා ඇත. මේ අනුව, එක් එක් නිකායෙහි සහ පිළිවෙලින් එක් එක් මද්හබ්හි ඔවුන් ඇතුළත මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි පවතින සමාන ගැටළු, එනම්, විවාහවීමේ අවම වයස, මනාලියන්ගේ කැමැත්ත, *වාලි* (භාරකාරිත්වය) ප්‍රතිපාදන, දික්කසාද වර්ග සහ කොන්දේසි, විනිසුරුවරුන් ලෙස කාන්තාවන්, නඩත්තු සහ ළමා භාරකාරිත්වය පිළිබඳ කාරණා, ආදිය වැනි ගැටළු ගැන වෙනස් අර්ථ දැක්වීම් පවතී.

**මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි එක් ගැටළුවක් ගැන ප්‍රතිවිරුද්ධ මතිමතාන්තරවල ස්වභාවය සහ ප්‍රමාණය විදහා දැක්වීමට කාන්තා කාතිවරුන්ට අදාළව සුන්නි මද්හබ් අතර පවතින මතවල වෙනස්කම් පහත දැක්වේ[78]:**

| **ෂාෆි'ඉ, මලිකි, හන්බාලි මද්හබ්** | **හනාෆි *මද්හබ්*** | **මොහමඩ් ඉබන් ජරීර් අල් - තබාරි සහ අබූ මුහමද් ඉබන් හස්ම් (ප්‍රමුඛ ඉස්ලාමීය නීතිවේදීන්)** |
|---|---|---|
| පිරිමින් "කාන්තාවන් ගේ ආරක්ෂකයෝය" යන කෝරානයේ සුරාහ් අන්- නිසා 4:34 වාක්‍යයෙහි අර්ථ දැක්වීමක් නිසා කාන්තාවන් විනිසුරුවරුන් වීමෙන් නුසුදුසු කර ඇත. කෙසේවෙතත්, සුළුතර මලිකිවරුන් අතර කාන්තාවන් විනිසුරුවරුන් ලෙස පත්කළ හැකි බවට මතයක් පවතී. ෂාෆි'ඉ වරුද සේවය අවශ්‍ය වුවහොත් කාන්තාවන් විනිසුරුවරුන් වීමේ සංකල්පයට ඉඩ දෙති. හන්බාලි ගුරුකුලයේ පමණක් ඒකමතික මතය වන්නේ කාන්තාවන් විනිසුරුවරුන් නොවිය යුතු බවය. | හනාෆි ගුරුකුලයේ සුළුතර මතයක් වනුයේ, විනිසුරුවරයෙකු හට සාක්ෂිකරුවෙකු වීමට සුදුසුකම් නොමැතිනම්, විනිසුරුගේ ආධිපත්‍යය වලංගු නොවන බවයි.<br><br>හනාෆි මද්හබ්, හුදුද් අපරාධ සහ කිසාස් (මිනීමරුම්) නඩු හැර අන් සියළුම නඩුවලදී කාන්තාවන් හට විනිසුරුවරුන් වීමට අවසර දෙති. | ප්‍රමුඛ නීතිවේදීන්ගේ පුද්ගලික මතයන් වනුයේ, කාන්තාවන් තනතුරෙහි අවශ්‍යතා සපුරාලයි නම්, ව්‍යතිරේකයක් නොමැතිව ඔවුන්ට සියළු නඩුවල විනිසුරුවරුන් විය හැකි බවයි. මෙහි පදනම ලෙස පෙනෙන්නේ සුරාන් අල්-තවුබා 9.71 යන කෝරානයේ වාක්‍යයෙහි අර්ථ දැක්වීමකින්ය. එයින් අදහස් වන්නේ පිරිමින් සහ කාන්තාවන් එකිනෙකාගේ 'අව්ලියා' (ආරක්ෂා කරන මිතුරන් සහ රැකවලුන්) බව විශ්වාස කිරීමය. |

**ප්‍රතිසංස්කරණ සඳහා පදනම ලෙස මෙම විවිධත්වය මත විශ්වාසය තබනවා වෙනුවට, ප්‍රධාන සංවාදකයින් මතවලින් ඉතාමත්ම ගතානුගතික ඒවා ගැන අවධාරණය කරති.**

ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍යතාව ප්‍රකාශ කරන අය අතර වුවද, එය වෙනස් ස්ථාවරවලින් වුවත්, ඉහත සඳහන් වෙනස්කම් තවත් සංකීර්ණ කරන පැහැදිලි අපසාරණයන් පවතී. ආගම සහ නීතියට සම්බන්ධ කරුණුවලදී මෙවැනි ප්‍රභේදනයන් බලාපොරොත්තු විය යුතු අතර, ඉතාමත් හොඳ සමතුලිතතාව වෙත පැමිණීමට ඔවුන් අතර සංවාද වලට අනුබල දිය යුතුය.

---

77 Marsoof, Saleem 2012, *Muslim Matrimonial Law – Some Gray Areas* ttps://www.academia.edu/9905307/Muslim_Matrimonial_Law_-_Some_Gray_Areas

78 Source: Dr Nik Noriani Nik Badlishah & Yasmin Masidi, 2009. "*Women as Judges*". Sisters in Islam, Malaysia http://www.sistersinislam.org.my/files/downloads/women_as_judges_final.pdf

නමුත් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, මෙවැනි අපසාරණයන් (a) ගනුදෙනු කිරීම සඳහා සංකීර්ණ වැඩි ලෙස සළකා, ගතානුගතික පිරිමි සංවාදකයින් සමග ගනුදෙනු කිරීමෙහි පැරණි තත්ත්වයට යාම පිණිස සමාවට කරුණක් ලෙස භාවිතා කරයි. (b) සිය අරගලය තුළ විවිධ පදනම් වලින් ප්‍රතිසංස්කරණ කිරීමට සොයන අය අතර අර්ථවත් සම්බන්ධීකරණය වළක්වයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ක්‍රියාකරන්නන් විසින් මෙම ප්‍රතිවිරුද්ධ මතිමතාන්තර සැළකිල්ලට ගැනීම සිදුවිය නොහැකි අතර, "ඉස්ලාමීය රාමුවට" පිටස්තර ඕනෑම මතයක් නොසළකා හැරිය යුතු යැයි නිතරම ප්‍රකාශ කරන සංවාදකයින් සමග සම්බන්ධ වීම ඔවුන්ට පහසුය. මෙයින් තේරුම් යන්නේ, රාජ්‍ය පාර්ශ්වයන් සහ මුස්ලිම් නොවන සිවිල් සමාජය, ඉහත දැක්වූ විවිධ, නිතරම එකිනෙකට පරස්පර විරෝධී, ඉස්ලාමීය නීතිය පදනම් කරගත් නීතිමීමංසාවට අමතරව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු ගැන පවතින මතයන් සිය දහස් ගණන් ගැන නොසළකා, පිරිමි සංවාදකයින්ගේ මතය සමග අනුකූල වීමට නැඹුරු වන බවයි.

**මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි එක් ගැටළුවක් ගැන ප්‍රතිවිරුද්ධ මතිමතාන්තරවල ස්වභාවය විදහා දැක්වීමට, <u>විවාහ වීම සඳහා අවම වයසට</u> අදාළව මෙම අධ්‍යයනය එක්රැස් කළ සමහර පොදු දෘෂ්ටිකෝණයන් පහත දැක්වේ:**

| ගතානුගතික මුස්ලිම් මතය | ප්‍රතිසංස්කරණවාදියාගේ මතය | අයිතීන් පාදක කරගත් මතය |
|---|---|---|
| ▪ සුන්නා (නබිතුමාගේ සම්ප්‍රදායයන්) සහ *ෆික්* (ඉස්ලාමීය නීති මීමංසාව) යන මේවාට අනුව විවාහ වීමට අවම වයසක් නොමැත;<br>▪ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් හට බාල වයස් විවාහ ගැටළුවක් නොවේ;<br>▪ බාල වයස් විවාහ සිදුවනුයේ, ඉතා කලාතුරකින් පමණි. | ▪ බාල වයස් විවාහ ශ්‍රී ලංකාවේ ගැහැණු ළමයින් හට ගැටළුවක් වන අතර සිද්ධීන් බොහෝ ඇත;<br>▪ ෂහාබ්දීන් කමිටුවෙහි නිර්දේශවලට අනුව විවාහ විමේ අවම වයස 16 දක්වා වැඩිකළ යුතුය; | ▪ බාල වයස් විවාහ ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රජාවන් සඳහා ගැටළුවකි.<br>▪ විවාහ වීමේ වයස මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි අධිකරණ බලයෙන් සම්පූර්ණයෙන් ඉවත්කළ යුතුය. ඊට හේතුව එය ළමා අයිතීන් පිළිබඳ ප්‍රශ්නයක් නිසා ඒවා ආරක්ෂා කිරීමට ප්‍රාථමික වගකීම ඇත්තේ රජයටය.<br>▪ සියළු පුරවැසියන් සඳහා විවාහ වීමේ අවම වසර 18 ලෙස රජය විසින් ස්ථාපිත කළ යුතුය. |
| **මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන අදහස්** | | |
| ▪ මුස්ලිම්වරුන් විවාහය සහ දික්කසාදය පාලනය කරන අනාගමික නිතිවලින් නිදහස්වී තමන්ගේම නීති වලින් පාලනය විය යුතුය;<br>▪ විවාහ විමේ වයස ස්ථිරව සඳහන් නොකර තිබිය යුතුය. මන්දයත්, වැඩි වයසක් (ඉහළ) විශේෂයෙන් දැක්වීම 'ඉස්ලාමීය නොවන' බැවිනි. | ▪ විවාහවිමේ අවම වයස ඇතුළුව විවාහය සහ දික්කසාදය පාලනය කරන අනාගමික නීතිවලින් මුස්ලිම් වරුන් නිදහස් විය යුතු අතර , මුස්ලිම් වරුන් මුස්ලිම් පවුල් නීතිය මගින් පමණක් පාලනය විය යුතුය;<br>▪ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් විවාහවිමේ වයස ගැහැණු ළමයින් සඳහා 16 දක්වා ද පිරිමි ළමයින් සඳහා 18 දක්වාද ඉහළ නැංවිය යුතුය. නැතහොත් ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් දෙකම සඳහා ඊට වඩා ඉහළ නැංවිය යුතුය. | ▪ විවාහ විමේ අවම වයස මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි අධිකරණ බලයෙන් ඉවත් කර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් දෙකම සහ සියළුම පුරවැසියන් සඳහා එය 18 හෝ ඊට වැඩිකළ යුතුය.<br>▪ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි අධිකරණ බලයෙන් විවාහ විමේ අවම වයස ඉවත්කිරීමෙන්, එම පණතෙහි ප්‍රතිසංස්කරණ පිළිබඳ අනාගත කමිටු විසින් වයස අඩු කිරීමට හෝ වැඩි කිරීමට අත්තනෝමතිකව තීරණය නොකරයි යන්න සහතික කෙරේ. |
| **මේ අන්දමට සිතන්නේ කවුද ?** | | |
| උලමාවරුන්, සමහර මුස්ලිම් | මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු | සමහර මුස්ලිම් ක්‍රියාකාරීන් මානව |

| | | |
|---|---|---|
| දේශපාලන නායකයින්, ඉහත සාකච්ඡා කළ පරිදි සමහර සංවාදකයින් ඇතුළු සමහර ආගමික විද්වතුන්. | ළමයින් සමඟ කටයුතු කරන සමහර කාන්තා සංවිධාන. | හිමිකම් ක්‍රියාකාරීන්. මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සමඟ කටයුතු කරන සමහර කාන්තා සංවිධාන. |

ඉහත සඳහන් කළ ප්‍රතිවිරුද්ධ මතිමතාන්තරද, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන ප්‍රකාශ කරන සහ ඒවා ඉටුකිරීමට භාරගන්නා ප්‍රතිසංස්කරණවාදින් (ඉස්ලාමීය දෘෂ්ටි කෝණය මත පදනම්ව ප්‍රතිසංස්කරණ සොයන්නන් සහ අයිතීන් පාදක කරගත් දෘෂ්ටිකෝණය අනුව ප්‍රතිසංස්කරණ සොයන්නන්) අතර විසම (කිසි සමානකමක් නැති) ප්‍රවේශයන් කෙරෙහි දායක වී ඇත.

**මුස්ලිම් නීතිය ප්‍රතිසංස්කරණය ගැන අන් රටවල් යොදාගෙන ඇති ක්‍රමෝපායයන් ගැන සටහන**

මුස්ලිම් පවුල් නීතියෙහි ප්‍රතිසංස්කරණ, ප්‍රධාන ප්‍රවේශයන් කිහිපයක් යොදාගත් මැද පෙරදිග පවුල් අයිතීන් ගැන ඔටොමන් නීතියත් සමග, එක් දහස් නවසිය අනූගණන්වල මුල දක්වා දිවෙයි. ඉන්පසු මුස්ලිම් බහුතරයක් සිටින බොහෝ රටවල් මෙම ප්‍රවේශයන් තනි තනිව හෝ විවිධ ප්‍රමාණයන්ගෙන් භාවිතා කර ඇත. මේවාට ඇතුළත් වන්නේ :

1. *තකායියුර්** – මෙය ඉස්ලාමීය නීතියෙහි විවිධ ගුරුකුල (උදාහරණයක් ලෙස : මද්හබ් සතර අතර) අතර සිය මනාපය භාවිතා කර, “කාන්තාවන්ගේ සහ දරුවන්ගේ දෘෂ්ටිකෝණයෙන් ඉතාමත් යෝග්‍ය න්‍යාය” තෝරා ගනියි. උදාහරණයක් ලෙස, මැලේසියාවෙහි කාන්තාවන්ටද කාතිවරුන් විය හැකි බව සාධාරණීකරණය කිරීමට හනාෆි මද්හබ් හි පිහිට පැතීම;
2. *තල්ෆික්** හෝ ‘patching’ – මෙහිදී න්‍යායයන් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් සැළකිල්ලට ගෙන (හෝ න්‍යායවල කොටස්) දෙමුහුම් න්‍යායයක් සෑදීම. මෙය ඉස්ලාමීය නෛතික විකල්පවලින් ව්‍යුත්පන්නව තිබුණත්, ඉස්ලාමීය නීතියෙහි කිසිම ගුරුකුලයක් විසින් පිළිගැනීමට හෝ නොපිළිගැනීමට ඉඩ ඇත;
3. කෝරානය සහ හදිත්* හි පෙළ පොත් ප්‍රභවයන් යළි අර්ථ දැක්වීම;
4. විෂය/තේමාව (උදා. ලෙස විවාහ වීමේ වයස) අධිකරණයෙහි බලයෙන් ඉවත් කර ඒ තුළින් ඉහත සඳහන් විකල්ප එකක්වත් නොයෙදීම සහ ඒ වෙනුවට එම විශේෂ මුස්ලිම් පවුල් නීතිය හෝ අධිකරණ පද්ධතිය, නෛතික යෙදීමකින් ඔබ්බට ගෙනයාමට තීරණය කිරීම.

*(*Source: Noor, Zanariah, 2007. Gender Justice and Islamic Family Law Reforms in Malaysia. Kajian Malaysia, Jld. XXV, No. 2, December 2007)*

## 5. ශ්‍රී ලංකාවේ සිටින මුස්ලිම් ප්‍රජාවෙහි විවිධත්වය අගය නොකිරීම සහ ප්‍රතිසංස්කරණ ගැන විවිධ මුස්ලිම් සුළුතර ප්‍රජාවන්ගේ සීමිත ගනුදෙනුව (නිරත වීම සීමාකාරී වීම)

පසුගිය දශක කිහිපය තුළ බොහෝ ප්‍රතිසංස්කරණවාදීන්ගේ ප්‍රවේශය වී ඇත්තේ ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් එක් කණ්ඩායමක් ලෙස කියාපෑමයි. ශ්‍රී ලංකාවේ ‘මුස්ලිම් ප්‍රජාව’ සමජාතීය බවද ආගම, නීතිය සහ භාවිතයන් ගැන මුස්ලිම් ප්‍රභූන් සහ සංවාදකයින් නියෝජනය කරන මතයම ඔවුන්ටද ඇති බවටද පවතින අවබෝධය මගින්, ප්‍රජාව තුළ විවිධ හඬවල් කොන්කිරීමට ලක් කර ඇත. ඒ අනුව, සංස්කෘතික සහ නෛතික භාවිතයන් (විවිධ නිකායන්ගේ නීතිම්මංසාව ඇතුළුව) අතින් මුස්ලිම් ප්‍රජාව තුළ පවතින විවිධත්වය කෙරෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි යොමුවීමක් තිබී නැත. මැලේ, බෝරා සහ මෙනන් ප්‍රජාවන් වැනි මුස්ලිම් සුළුතරයන් සහ මධ්‍යම සහ දකුණු පළාත්වල මුස්ලිම් වරුන්වද, පොදුවේ ප්‍රතිසංස්කරණ ගැන සංවාද වලින් සහ ඒවා කෙරෙහි ඇති මුල්පිරීම් වලින් බැහැර කර ඇත.

කණගාටුදායකව මෙයින් අදහස් කරන්නේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ සුවිශේෂී නිකායක කාන්තාවන් මුහුණ දෙන වෙනස්කොට සැළකීම්වල උදාහරණ ඉස්මතු කර දක්වා නොමැති බවයි. උදාහරණ ලෙස, සුන්නි හනාෆි නිකාය මෙන්ම සමහර ෂි'ආ නිකායයන් යටතේ කාන්තාවන් හට ඇය විසින්ම දික්කසාදයක් ලබාගැනීමට කිසිම ප්‍රතිපාදනයක් නොමැත. තවද මැලේ ප්‍රජාව මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන හෝ ප්‍රතිසංස්කරණ ගැන යම් සංවාද, තිරණ ගැනීම, කේවල් කිරීම හෝ මුල්පිරීම් වල පෙනෙන පරිදි සහභාගි වී නොමැත. *‘කයිකුලි’* භාවිතය බොහෝ මැලේවරුන් විසින් සම්පූර්ණයෙන්ම ඉස්ලාමීය නොවන ලෙස තද අප්‍රසාදය පළ කල ඇති අතර, එය මැලේ විවාහ සිරිත්වල කොටසක්ද නොවේ. කෙසේවෙතත් ප්‍රතිසංස්කරණවාදීන් විසින් මෙම දෘෂ්ටිකෝණයන් කිසිදිනක ප්‍රකාශ කර හෝ ඒ ගැන කේවල්කර නොමැත.

එසේම භූගෝලීය වෙනස්කම් නිසා මුස්ලිම් කාන්තාවන්ගේ අත්දැකීම් අගය කිරීමක්ද නොමැත. දකුණු සහ මධ්‍යම පළාත්වල මුස්ලිම් කාන්තාවන් රටෙහි අයිතීන් පාදක කරගත් මුල්පිරීම් වලින් බොහෝ සේ බැහැර කර ඇත. මෙම පෙදෙස්වල මුස්ලිම් කාන්තා අයිතීන් ගැන කටයුතු කරන ක්‍රියාකාරී කාන්තා සංවිධාන නොමැතිකමින් මෙය ඉස්මතු වේ. උදාහරණයක් ලෙස, මහනුවර දිස්ත්‍රික්කය වැඩිම මුස්ලිම් ජනගහනය අතින් තුන්වන ස්ථානය (අම්පාර සහ කොළඹට පසු) ගනී. කෙසේවෙතත්, රටෙහි වයඹ, උතුර සහ නැගෙනහිර පෙදෙස්වල මෙන් නොව, රටෙහි මෙම පළාත්වල සිටින මුස්ලිම් කාන්තාවන්ගේ දුක් ගැනවිලි බොහෝවිට නොසළකා හැර සහ/හෝ ප්‍රතිසංස්කරණ ක්‍රියාවාදය තුළ පැන නොනගී.

*“ශ්‍රී ලංකාව තුළ සුළුතර මුස්ලිම් ප්‍රජාව ආගමිකව සමජාතීය කණ්ඩායමක් ලෙස (බහුතර ප්‍රජාවන් විසින්) බෙහෝවිට සළකයි. ඇත්තෙන්ම ඒවා ඉස්ලාම්, අගයන් සහ භාවිතයන් ගැන වෙනස් අර්ථ දැක්වීම් වැළඳගන්නා විවිධ නාමිකයන්ට කැඩී වෙන්වී ඇත. මුස්ලිම් ප්‍රජාව තුළ පවතින මෙම බහුවිධතාව සහ එහි අභ්‍යන්තර දේශපාලනය ගැන ඇති අවිඥානය බොහෝ තනි පුද්ගලයින් තුළ ප්‍රජාවට එරෙහිව තිබෙන පූර්ව මතයන් බොහොමයකට දායක වන සාධකයක් විය හැක”.*

- Source: “Fracturing Community Intra-

පුත්තලම සහ අනෙකුත් උතුරු සහ නැගෙනහිර දිස්ත්‍රික්ක වැනි පෙදෙස්වල මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සහ කාති අධිකරණ සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන උල්ලංඝන සහ වෙනස්කොට සැළකීම් ගැන තීරණාත්මක තොරතුරු සහ සාක්ෂි එක්රැස් කර ගැනීමට කාන්තා ක්‍රියාකාරීන් හට හැකි වී ඇත. කෙසේවෙතත්, දකුණු සහ මධ්‍යම දිස්ත්‍රික්ක වලින් ගැටළු වලට සම්බන්ධ සුළු හෝ කිසිම තොරතුරක් නොමැත. හම්බන්තොට සහ හැටන් වැනි සමහර පෙදෙස්වල වසර එකහමාරකට වැඩි කාලයක් තුළ කාතිවරයෙක් නොසිටියේය. එබැවින් විවාහය සහ දික්කසාදය වැනි කාරණා වලදී කාන්තාවන්ගේ අවාසනාවන්ත තත්ත්වයද යුක්තිය සහ වන්දි ලබාගැනීම් සම්බන්ධව මුහුණදෙන දුෂ්කරතාද නොදනි. සමහර දිස්ත්‍රික්කවලින් ඔබ්බට මුස්ලිම් කාන්තාවන් සමග ගනුදෙනු කිරීමට අසමත්වීමද, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන දුර්මතයන් සහ මිථ්‍යාවන් කෙරෙහි දායක විය හැක.

ඉහත සඳහන් බාධක සහ අභියෝග, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සඳහා පුළුල් සහයෝගයක් ලබාගැනීමට සම්බන්ධ වඩා විශාල ප්‍රශ්නයකට යොමුකරයි. වර්තමාන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙන් පීඩාකාරීව බලපෑමට ලක්ව ඇති ප්‍රජාවෙහි විශාල කොටසක් සිටින අතර, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන දැනුම ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ ප්‍රජා සාමාජිකයින් මුහුණදෙන ගැටළු ගැන දැනුවත් වී සිටින, සහ වඩාත්ම වැදගත්ව, පණතෙහි ප්‍රතිසංස්කරණවලට සහයෝගය දෙන තීරණාත්මක සමූහයක් සිටීද නැද්ද යන්න ගැටළුවක්ව පවතී.

## 6. ක්‍රමෝපායයන්ගේ අඩුපාඩු නිසා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු පුළුල් මුස්ලිම් සහ මුස්ලිම් නොවන සිවිල් සමාජ න්‍යාය පත්‍රයෙහි නොමැත

පසුගිය වසර ගණනාවක් තුළ, ප්‍රතිසංස්කරණ සඳහා කේවල් කරමින් සිටි කණ්ඩායම් විසින් යොදාගත් ක්‍රමෝපායයන් මෙන්ම, මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී කණ්ඩායම් අයිතීන් පිළිබඳ ක්‍රියාකාරීන් සහ ප්‍රධාන ප්‍රවාහයේ සිවිල් සමාජ සංවිධාන යොදාගන්නා ක්‍රමෝපායයන්ද විශ්ලේෂණය කිරීමෙන් පෙනී යන්නේ, ඒවා ප්‍රතිසංස්කරණ ගැන සීමිත ප්‍රගතියකට දායක වී ඇති බවයි. ඉහත සඳහන් කළ ප්‍රථම අවස්ථාවේදී, ක්‍රමෝපායයන් තරමක් පටු අදහස් සහිත සහ ප්‍රවේසම්කාරී බවක් පෙනෙන අතර, පසුව සඳහන් කළ අවස්ථාවේ, ඒවා බැහැර කරන සහ දෙගිඩියාවෙන් යුක්ත ඒවා වේ.

### 6.1. මුස්ලිම් ප්‍රතිසංස්කරණවාදී කණ්ඩායම් යොදාගන්නා ක්‍රමෝපායයන් හි අඩුපාඩු

#### *6.1.1. 'ඉස්ලාමීය රාමුව'ඇතුළත කටයුතු කිරීමේදී අඩුපාඩු*

මුස්ලිම් ප්‍රජාව තුළ ඇති ගැටළුවලට විසඳුම් සෙවීම සහ සොයාගැනීම, බොහෝ මුස්ලිම් ක්‍රියාකාරීන්ගේ සහ අනෙකුත් ප්‍රතිසංස්කරණවාදී කේවල් කරන්නන්ද යොදා ගන්නා ප්‍රවේශයකි. මැලේසියාව සහ ඉන්දුනීසියාව වැනි මුස්ලිම් බහුතර සන්දර්භය තුළ, උදාහරණ ලෙස බහුභාර්යත්වය පාලනය කිරීම සහ කාන්තා කාතිවරුන් සඳහා අනුමැතිය දීමේදී, මෙම ප්‍රවේශය යම්තාක් දුරට සාර්ථක වී ඇති අතර, ටියුනීසියාව සහ තුර්කිය වැනි අනෙකුත් රටවලට ප්‍රතිසංස්කරණ සඳහා වඩාත් ලෞකික තර්ක සහ අයිතීන් පාදක කරගත් ප්‍රවේශයක් මත විශ්වාසය තැබීමට සිදුවිය.

'ඉස්ලාමීය රාමුව', මද්හබ්, ඉස්ලාමීය නීතිමීමංසාව, විකල්ප අර්ථනිරූපණය කිරීම්, මතවාදී බලපෑම්, ආදිය මත රඳා පවතිමින් ඒවා මගින් අර්ථ දැක්වීම සිදුවේ. උදාහරණයක් ලෙස, ඉස්ලාමීය නීතියෙහි හෝ ආගමික පෙළ පොත්වල විකල්ප අර්ථදැක්වීම් විද්වතුන් සහ ආගමික නායකයින් අතරම වුවද බෙහෙවින් වෙනස් වේ. එය රඳා පවතින්නේ ඔවුන් පුහුණු වී ඇත්තේ කොහේද සහ/හෝ ඔවුන්ගේ ක්‍රියාවලියන් සහ භාවිතයන්ට බලපෑම් කරන්නේ කුමන ඉස්ලාමීය දේව ධර්මයටද යන්න මතය. මෙයින් නිතරම අදහස් කෙරෙන්නේ, සමාජයේ වැඩි බලය සහ බලපෑම සහ ආගමික විද්වත් බව ඇති පුද්ගලයින්ගේ මත සහ අර්ථ කථනයන්, අන් අයට වඩා වැඩි බරක් සහිත වන බවයි.

ක්‍රියාකාරීන් සඳහන් කරන්නේ අයිතීන් පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී ඉස්ලාමීය රාමුව තුළ කටයුතු කිරීමේදී '**කාගේ අර්ථකථනය නිවැරදිද? සහ තීරණය කිරීමේ බලය ඇත්තේ කා හටද ?**' යන්න ගැන ආගමික *උලමා* වරුන් සහ මුස්ලිම් ප්‍රජාව අතර සහ අතරෙහි කෙරෙන කිසිදාක අවසන් නොවන සුදුකෙළියක් තුළ ඔවුන් කොටුවූ ඇති බවයි. මෙය ඉස්ලාමීය ධර්මය හෝ නීතිමීමංසාව ගැන දැනුම් තේරුම් නොමැති ප්‍රජාවෙන් පිට අයට විශේෂිත ගැටළු මතු කරයි. ඔවුන්ගේ ප්‍රතිචාර සහ මතයන් දැනගැනීමට අසන පෙනෙන ලෙසට

සංස්කෘතික සංවේදී සහ අපක්ෂපාත ප්‍රශ්නය 'ඉස්ලාම් මේ ගැන පවසන්නේ කුමක්ද ?' යන්න, බොහෝ විට අවසන් වන්නේ ප්‍රජාව තුළ බලය සහ බලපෑම තිබෙන අයගේ මතයන් බලාත්මක කිරීමෙන් බව තේරුම් ගැනීමට ඔවුහු අසමත් වෙති.

### *6.1.2. මුස්ලිම් පෞද්ගලික නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ සීමාවන් මුර කරන මුස්ලිම් කාන්තා කණ්ඩායම්වල නායකයින්*

ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තා කණ්ඩායම්ද මෑතක් වනතුරු, ප්‍රකාශ කළේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ මුස්ලිම්වරුන් පමණක් ගනුදෙනු කළ යුතු ගැටළුවක් ලෙසය. මෙහි එක් අවාසියක් වනුයේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැටළුව 'සමහර මුස්ලිම් කාන්තා සංවිධාන වලට අයත් භූමි ප්‍රදේශය' ලෙස අනෙකුත් සිවිල් සමාජ සංවිධාන විසින් තේරුම් ගැනීම සහ ඔවුන් එහි නිරතවීමට මැලිකමක් දැක්විමට මෙය දායක වි තිබීමයි. කාලයක් තිස්සේ තවද මෙයින් අදහස් කර තිබෙණුයේ, මුස්ලිම් නොවන කාන්තා කණ්ඩායම්, මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණදෙන ප්‍රශ්නයෙහි ස්වභාවය සහ බරපතළ කම ගැන අවබෝධයක් නොමැතිව ගැටළුවෙන් දුරස්ථ වී ඇති බවයි.

මුස්ලිම් ප්‍රජා මට්ටමේ සංවිධානවල ප්‍රතිචාරකයින් පැවසුවේ ඔවුන්ට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන දැනුම තිබුණු අතර, වසර ගණනාවක් එය බොහෝ සේ කොළඹ පාදක කරගත් "ඉහළ මට්ටමේ" ක්‍රියාවලියක් ලෙස දුටු අතර, ඔවුන්ට එයට ප්‍රවේශවීමට කිසි ඉඩක් හෝ තීරණ ගැනීමේ කාර්යභාරයක් නොතිබූ බවයි. කාන්තා අයිතීන් පිළිබඳ එක් ක්‍රියාකාරියෙකු පැවසුවේ, "මුස්ලිම් පෞද්ගලික නීතියෙහි ප්‍රතිසංස්කරණම වුවද ධූරාවලියක් සහිත" වන බවත්, මෙය ප්‍රජා කණ්ඩායම් සහ කොළඹ පාදක කරගත් සංවිධාන අතර යම් මට්ටමක වෙන් කිරීමක් ඇතිකර ඇති බවත් සහ ඒ හේතුවෙන් පසුගිය වසර ගණනාවක් පුරා ප්‍රතිසංස්කරණ පිළිබඳව සැළකිය යුතු සාමූහික සජීවීකරණය සහ සහයෝගීත්වය නොමැති වීමට දායක වී ඇති බවත්ය.[79]

## 6.2. 'මධ්‍යස්ථවාදීන්' සහ මුස්ලිම් (සුළුතර) කණ්ඩායම්වල අයිතීන් සඳහා සිවිල් සමාජ කේවල් කරන්නන් අන්තර්-ප්‍රජා ගැටළු ගැන කටයුතු කිරීමෙන් වැළකී ඇත

මුස්ලිම් නොවන රාජ්‍යයක සන්දර්භයක් තුළ මුස්ලිම් සුළුතර ප්‍රජාව *වෙනුවෙන්* සමාජයීය, සංස්කෘතික සහ දේශපාලනික අයිතීන් ප්‍රවර්ධනය කිරීමෙහිලා සක්‍රීයව නිරත වී සිටින මුස්ලිම් 'මධ්‍යස්ථවාදීන්' සහ කණ්ඩායම් අයිතීන් සඳහා කේවල් කරන්නන් කිහිපදෙනෙක් සමග මෙම අධ්‍යයනය විසින් සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ඔවුන්ගේ ක්‍රියාවාදයට සහ කේවල් කිරීමට තීරණාත්මක සහ බොහෝවිට මතභේදයට තුඩුදුන් ගැටළු ඇතුළත් විය. අනෙකුත් ගැටළු අතර, උතුරු-මුස්ලිම් අවතැන්වීම්වල අයිතීන්; උග්‍ර මුස්ලිම්-විරෝධී හැඟීම් සහ ප්‍රචාරක කටයුතු ආමන්ත්‍රණය කිරීම; සමාජ ආර්ථික සහ දේපොළ අයිතීන් සඳහා කේවල් කිරීම; ආගමික සහ සංස්කෘතික අයිතීන් සඳහා හඬ නැගීම; දේශපාලනික සහභාගිත්වය සහ නියෝජනය වැනි දේ මේවාට ඇතුළත් වේ.

සඳහන් කළ යුතු නිරීක්ෂණයක් වන්නේ, රාජ්‍යය තුළ මුස්ලිම් ප්‍රජාවෙහි අයිතීන් සහ මුස්ලිම් ප්‍රජාව තුළම මුස්ලිම් කාන්තා අයිතීන් සකස් කිරීමේදී සමහර අවස්ථාවලදී නොදැනුවත්වද, අන් අවස්ථාවලදී හිතාමතාමද, කෙරෙන වෙන් කිරීමක්ය. ඒ මන්දයත්, බහුතරවාදී රාජ්‍යයක් තුළ මුස්ලිම්වරුන්ගේ අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමට භාවිතා කරන එකම තර්කය සහ තර්කණය, සමාන අධිපතිවාදී පීඩනයන්ට මුහුණදෙන මුස්ලිම් කාන්තාවන්ට දිගු නොකිරීමයි.

බොහෝ ක්‍රියාකාරීන් සහ ප්‍රජාවේ ප්‍රමුඛ 'මධ්‍යස්ථ මතධාරීන්' අතර නොගැලපීම හොඳින්ම පැහැදිලි වන අතර, ඒ සඳහා හේතු ගවේෂණය කළ යුතුයි. දේශීය හෝ පෞද්ගලික ක්ෂේත්‍රයේ මුස්ලිම් ප්‍රජාවට බලපාන ගැටළු වලින් පලායාමට හෝ ඒවා සම්පූර්ණයෙන් නොසලකා හැරීමට, සක්‍රීය මුස්ලිම් සිවිල් සමාජය තුළ විශාල කොටසකින් සමන්විත වන කණ්ඩායම් අයිතීන් සඳහා කේවල් කරන්නන් හට ඇති නැඹුරුව, මුස්ලිම් ප්‍රජාව ඇතුළත මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන හඬ නැගීමට ක්‍රියාකාරීන් කිහිපදෙනෙකු පමණක් (ප්‍රාථමිකව කාන්තා සංවිධාන) ඉදිරිපත් වීමට දායක වී ඇත. **ලිබරල්වාදීන්/මධ්‍යස්ථ මතධාරීන් ගේ නිශ්ශබ්දතාවයෙන් සිදුවන්නේ ගතානුගතික මතිමතාන්තර ප්‍රජාව තුළ සංවාදයෙහි අධිපතිකම් කරන බවයි.**

79 This issue unfortunately is not very different from how advocacy has taken place in other areas in Sri Lanka on issues beyond the Muslim community.

## 6.3. 'ප්‍රධාන ප්‍රවාහයෙහි' අයිතීන් පාදක කරගත් සංවිධාන 'මුස්ලිම් ගැටළු' මානව හිමිකම් ගැටළු ලෙස දැකීමට මැළිවී ඇත.

> *(Intersectionality is) "කාන්තාවන් විවිධ වින්‍යාසවලින් සහ විවිධ තීව්‍රතාවලින් පීඩනය අත්දකින බවට ඇති මතයයි. පිඩනය ඇතිකරන සංස්කෘතික භාවිතයන් (සිරිත්) එකිනෙකට සම්බන්ධවනවා පමණක් නොව, ඒවා එකිනෙකට බැඳී ඇති අතර සමාජයේ අන්තර් ආංශික පද්ධති මගින් බලපෑම් කෙරේ. මෙහි උදාහරණවලට වර්ගය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පන්තිය, හැකියාව සහ ජනවාර්ගිකත්වය ඇතුළත් වේ.".*
>
> \- කිම්බර්ල් ක්‍රෙන්ෂෝ (විද්වතා)

Intersectionality හෝ ජනවාර්ගිකත්වය හෝ ආගම (උදාහරණයක් ලෙස) පාදක කරගෙන සමහර කාන්තාවන් මුහුණදෙන සමාජ ගැටළු සහ පීඩනවල රටාවන් ඔවුන් කාන්තාවක් ලෙස අත්දකින හෝ සියළු කාන්තාවන් අත්දකින පීඩනයෙන් වෙන් කළ නොහැකි බවට පවතින ක්‍රියාකාරී මූලධර්මය, ශ්‍රී ලංකාව තුළ කාන්තා කේවල් කරන්නන් සහ ක්‍රියාකාරීන් විසින් ප්‍රකාශ කර සහ ප්‍රවර්ධනය කර ඇත. කෙසේවෙතත්, ප්‍රධාන ප්‍රවාහයේ ශ්‍රී ලාංකීය කාන්තා අයිතීන් සහ මානව හිමිකම් සංවිධාන, කිසිදු ක්‍රමවත් ආකාරයකට යුක්තිය සඳහා මුස්ලිම් කාන්තාවන්ගේ අරගලයට සම්බන්ධ වී නොමැත. පුද්ගලික මුස්ලිම් නොවන පාර්ශ්වකරුවන් ටිකදෙනෙකු හැර, මෙම ගැටළු සමග ගනුදෙනු කිරීමට සැළකිය යුතු මැළිකමක් දක්වන බව නිරීක්ෂණය කර ඇත. මූලිකව මෙයට හේතුවී ඇත්තේ, ජනවාර්ගික, ආගමික හා සංස්කෘතික මායිම් වටා ඇති ප්‍රත්‍යක්ෂ සංවේදීතාවන්ය.

***"එය මුස්ලිම්වරුන්ගේ ගැටළුවක් නිසා, අපට ඒ ගැන කළ හැකි දෙයක් නැත"***

'සංස්කෘතිකව සංවේදී වීමට' දරන උත්සාහයක් තුළ, ආගමික, ජනවාර්ගික හෝ සංස්කෘතික කණ්ඩායමක් තුළ සිටින කාන්තාවන් මුහුණදෙන අසමානාත්මතාවයන් සහ වෙනස්කොට සැළකීම් නොදැකීමට ඉඩ ඇත. 'බහු සංස්කෘතික' රටවල් තුළ ක්‍රියාකාරීන්ගේ සහ කේවල් කරන්නන්ගේ වැඩ කටයුතු, මානව හිමිකම් සහ ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයන්ගෙන් දැනුවත් වන විට මෙය විශේෂයෙන් අදාළ වේ.

මහාචාර්ය සූසන් මොලර් ඔකින් 'ස්ත්‍රීවාදය සහ බහු සංස්කෘතිකවාදයː යම් ආතතීන්' යන ඇගේ ලියවිල්ලෙහි මෙසේ ප්‍රකාශ කළාය. "ඇත්තෙන්ම, කණ්ඩායම් අතර සමානාත්මතාවය සහ ඉවසීම උපදවීමට දරන උත්සාහයන්, කණ්ඩායම් ඇතුළත සක්‍රියව බල ධුරාවලියන් බලාත්මක කිරීමට නොදැනුවත්වම දායක විය හැකි අතර, මේ මගින් දැනටමත් බලරහිත කර ඇති සාමාජිකයින් 'බහු සංස්කෘතික අනාරක්ෂිත තත්ත්වයක විරුධාභාෂයක් (paradox) තුළ' තව දුරටත් අසාධාරණත්වයට ලක්වීමේ අවදානමට මුහුණදෙති[80]".

මෙම විරුද්ධාභාෂය කාන්තා අයිතීන් සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් අතර 'ක්‍රියාවාදයෙහි දූපත්' පවතින ශ්‍රී ලාංකීය සන්දර්භය තුළද පවතී. මුස්ලිම් කාන්තාවන්ගේ ගැටළු දකින්නේ මුස්ලිම් සංවිධාන යටතේ පවතින ඒවා ලෙස බැවින්, මුස්ලිම් නොවන ක්‍රියාකාරීන් මුස්ලිම් ගැටළුවල නිරත වීමට එක්කෝ අදිමදි කරති. නැතහොත් එම අනන්‍යතා කණ්ඩායම් තුළ සිටින ක්‍රියාකාරීන් විසින් ඔවුන්ව බැහැර කර ඇත. තවද සිවිල් සමාජය සහ රජය යන දෙකම මුස්ලිම් නීතිය සමග කෙරෙන ඕනෑම දෙයක් 'සංකීර්ණ වැඩ' ලෙස දකිනවා විය හැක. එයට හේතුව වන්නේ, ඉස්ලාමීය නීතිය සහ නීතිමීමංසාව ගැන සංවාදවල නිරත විය යුතු වීම මෙන්ම, දැනටමත් ඉස්ලාම් භීතිකාවට මුහුණදෙන ප්‍රජාවක් සම්බන්ධයෙන් දුෂ්කර ප්‍රශ්න මතු කිරීම අවශ්‍ය වීමය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන ගැටළු මෙන්ම ඒවායෙහි නිතරවීමේ අපහසුතාව ගැන මුස්ලිම් ප්‍රජාවටම කටයුතු කිරීමට ඉඩහැරීම හොඳම දෙය බව දකී.

මෙම අධ්‍යයනයෙහි අරමුණ සඳහා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන ඔවුන් හෝ ඔවුන්ගේ සංවිධාන සුවිශේෂී වශයෙන් කේවල් කර නොමැත්තේ මන්දැයි ප්‍රධාන පෙළේ කාන්තා අයිතීන් ක්‍රියාකාරීන්ගෙන් විමසන ලදී. ප්‍රතිචාරය බොහෝ සේ ඉහත දැක්වූ ආතතීන් සමග එනම්, සංස්කෘතික වශයෙන් සංවේදී වීමට උත්සාහ කිරීම, මුස්ලිම් කාන්තාවන් එයට මුල්පුරන තුරු බලා සිටීම සහ ඔවුන්ගෙන් පාර්ශ්වකරුවන් ලෙස 'ආරාධනා' ලැබෙන තුරු නැවත බලා සිටීම යන මේවා සමග එකඟ විය. මෙහි ප්‍රතිවිපාක, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දිග් ගැස්සීමට මෙන්ම, මෙම

---

[80] Okin, Susan Moller, 1998. *Feminism and Multiculturalism: Some Tensions*. Ethics, Vol. 108, No. 4 (Jul., 1998), pp. 661-684. The University of Chicago Press. http://eclass.uoa.gr/modules/document/file.php/PRIMEDU143/Okin,%20Multiculturalism%20%26%20feminism.pdf

ගැටළු ප්‍රධාන ප්‍රවාහයේ සංවාදයෙන් සහ ක්‍රියාකාරිත්වයෙන් දුරස්ථ කර තැබීමට දායක වී ඇති බව සිතිය හැක.

**වඩාත් අහිතකරව, එය හුදෙකලාවූ මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් දෙවන පන්තියේ පුරවැසියන් ලෙස 'විශේෂ ප්‍රවර්ගයකට' වර්ගීකරණය කර, පවුල් පරිසරය තුළ බාල වයස් විවාහ අවසන් කිරීම, මානව හිමිකම්, සහ පුරවැසි අයිතීන් වැනි දේට අදාළව මතුකරන තර්ක පෙනෙන ලෙසට අදාළ වන්නේ නැත. ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රජාවන් අතර යම්තාක් දුරට ලබාගෙන ඇතියි සිතිය හැකි, ජනවාර්ගික සහ ආගමික රේඛා හරහා කපාගෙන යන කාන්තා එකමුතුකම, අයිතීන් පිළිබඳ කාරණාවලදී මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් ඇතුළු නොකරන බව පෙනීම කනගාටුවට කරුණකි.**

## 7. ශ්‍රී ලංකාවේ සංවේදී ජනවාර්ගික-ආගමික ගතිකයන් බහුවිධ අභියෝග මතුකරයි

> *"(මුස්ලිම්) කාන්තාවන් ලෙස අපව දෝෂාරෝපනය කර, අපව නිර්වචනය කිරීමට ඕනෑකරන සහ අප පවසන ඕනෑම දෙයක් මැඩ පැවැත්වීමට ඕනෑකරන, ආගමික නායකයෝ සහ තමා විසින්ම පත්කර ගන්නා ලද ප්‍රජා නායකයෝ අපට සිටිති. අනික් අතට, අපව වින්දිතයින්ගේ ඉරියව්වෙන් පමණක් රැඳී සිටීමට අවශ්‍ය කරන ජාතිවාදීහු අපට සිටිති."*
>
> – Deeyah Khan (Global activist)

ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවෝ පශ්චාත් යුදමය, දේශපාලනික සහ නෛතික ක්‍රියාවලියන්ගේ වඩාත් පුළුල් සන්දර්භය තුළ සහ පොදුවේ පීතෘමූලික සමාජයක් තුළ, බහුවිධ සමාජීය, සංස්කෘතික, නෛතික සහ ආරක්ෂා ගැටළු වලට මුහුණදෙති. මෑතකදී ඉස්ලාම් ධර්මය ගැන ගෝලීයව සහ දේශීයව පවතින සෘණාත්මක හැඟීම්වල ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් ප්‍රජාව වෙත එල්ල වන අන්තගාමී මුස්ලිම් විරෝධී හැඟීම් ඔවුන්ට බලපා ඇත. ද්වේෂ සහගත කතා සහ/හෝ ද්වේෂ සහගත අපරාධ එල්ල කරන අය අතර බොදු බල සේනා සහ සිංහල රාවය වැනි ආගමික කණ්ඩායම් අතර සිටින අන්තවාදී කොටස්වල සිට, දේශපාලඥයින් සහ සාමාන්‍ය පුරවැසියන් දක්වා විහිදේ.

2014, 'කාන්තාවන්ට සහ ගැහැණු දරුවාට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ විපක්ෂ නායකතුමාගේ කොමිෂන් සභාවෙහි වාර්තාව' මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ කාති අධිකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන දැවෙන වෙනස්කොට සැළකීම් සහ උල්ලංඝනයන් ප්‍රමාණාත්මකව ලේඛණගත කිරීමට අපොහොසත් වූ අතර, ජාතිවාදී ආකල්ප නිසා මුහුණදෙන ප්‍රචණ්ඩත්වයෙහි ස්වභාවය එය ඉස්මතු කළේය. බොදුබල සේනා වැනි අන්තවාදී බෞද්ධ කණ්ඩායම් වල ප්‍රචණ්ඩත්වය, සමස්තයක් ලෙස මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගෙන ඇති අතර, සුවිශේෂී වශයෙන් කාන්තාවන්ද ඉලක්ක කරගෙන, ඔවුන්ගේ නිකාබ් (මුහුණු ආවරණය) තහනම් කරන ලෙස ඉල්ලීම සහ ඉස්ලාමීය ඇඳුම් අඳින අය හට වධහිංසා පැමිණවීමට නායකත්වයද සැපයූහ.

මුස්ලිම් - විරෝධී හැඟීම් පවතින්නේ සහ බලපාන්නේ රටෙහි සීමිත ප්‍රදේශයකට හෝ ආයතනවලට පමණක් නොව, ඒවා නාගරික පෙදෙස් සහ ආයතනවලට පැතිරී, සියළු ස්ථරයන්, වෘත්තීන් සහ ස්ථානවල කාන්තාවන්ටද බලපෑම් එල්ල කළ හැක. මෙම වාර්තාව ලිවීමේදී පැන නැගුණු එක් මෑතක වූ සිද්ධියක් වුයේ, කොළඹ විශ්ව විද්‍යාලයට එරෙහිව තමාව මුස්ලිම් වීමේ පදනම මත කථිකාචාර්යවරයෙකු ලෙස පත්කිරීම හිතාමතාම රඳවා තබා ගැනීම වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මානව අයිතිවාසිකම් නඩුව[81] දිනූ පාතිමා ෂානාෂ් අලාඋදීන් ගැනය. මෙවැනි සිද්ධීන් බොහෝවිට විදහාපාන්නේ, ඉස්ලාම්-භීතිකාව සහ මුස්ලිම් විරෝධී ප්‍රචාරණ සහ හැඟීම් තවදුරටත් ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් කාන්තාවන්ගේ අධ්‍යාපනය, රැකියා නියුක්තිය, එහාමෙහා යෑමේ නිදහස සහ තීරණ ගැනීම සීමා කරන බවයි. සහාය සේවා වලට ප්‍රවේශවීම සහ ගැටළුවලට පිළියම් සඳහා ප්‍රජාවෙන් ඔබ්බට යාමට ඔවුන්ට ඇති අවස්ථාද කපා හරියි. මන්දයත්, ඔවුන් දෙස සෘණාත්මක හැඟීම්වලින් බැලීම, ඔවුන්ට වෙනස් ආකාරයට සැළකීම හෝ ඔවුන්ගේ ඇඳහිල්ල නිසා ඔවුන්ව නොසළකා හැර නින්දා අපහාස කිරීම යන මේවා හේතුවෙනි.

මුස්ලිම් විරෝධී හැඟීම් නිසා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට සම්බන්ධව කාන්තාවන්ට බලපාන ගැටළු සාකච්ඡා කිරීම කෙරෙහි ප්‍රජාව තුළින්ම විරෝධකම් පැන නැගීමට දායක වී ඇත. මෙම ගැටළු ගැන ප්‍රජාවට පිටස්තරව ඇතිවන යම් සංවාද නිසා, එය බොදු බල සේනා වැනි මුස්ලිම් විරෝධී කණ්ඩායම්වල "*ෂරියා* නීතිය

[81] SC/FR 236/2011. https://www.colombotelegraph.com/wp-content/uploads/2016/02/sc_fr_236_2011.pdf

කාන්තා අයිතීන් උල්ලංඝනය කරයි" යන තර්කය මත මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත අහෝසි කිරීමටත්, කාති අධිකරණ පද්ධතිය අවලංගු කිරීමටත් ඉල්ලීමේ හැකියාව පවතීයැයි බියක් ඇත. මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුවෙහි සාමාජිකයෙකුට අනුව, 2012 මුස්ලිම් විරෝධී සිද්ධීන් නිසා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට යම් බලපෑමක් එල්ල විය. මේ අනුව දහස් සංඛ්‍යාත ක්‍රම වලින් ඉස්ලාම් භීතිකාව මුස්ලිම් කාන්තාවන් හට වැඩියෙන්ම බලපායි. අනෙක් අතට, සංක්ෂේපණීය අධිකරණ දඬුවම් හෝ කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ ක්‍රියාකාරීත්වයන් සඳහා ප්‍රජා පොලිසිය යෙදවීම වැනි දේ ගැන මුස්ලිම් සහ මුස්ලිම් නොවන අය කතා කරන විට, එය "අන්තවාදීකරණය /අන්තාවදය නැඟී සිටීමේ නැඹුරුව" සහ 'මූලධර්මවාදීන්', 'වහාබි' හෝ 'ඉස්ලාම්වාදීන්' ගේ බලපෑම නිසා "මෑතකදී ඇතිවූ සංසිද්ධියක් " ලෙස හේතු දක්වයි. මේ වචන ගතානුගතික මුස්ලිම් ගැන කෙරෙන සංවාද එහා මෙහා කරන වචන වේ. ඒවා මතුපිටට යටින් ඇති සංකීර්ණතාවන් හෝ විවිධ මුහුණුවරින් යුත් ආගමික සහ දේශපාලනික මතවාදයන් පැහැදිළි කිරීමට හෝ හඳුනාගැනීමට අසමත් වන අතර, පොදු අවබෝධය වන්නේ, මතවාදයන් සහජයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පිහිටන බවයි.

සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයේ සහ පවුල් ජීවිතයේ ගතානුගතික බලපෑම්වල ව්‍යාප්තිය සහ රටෙහි කාන්තාවන් සහ ගැහැණු ළමයින් මත ඇතිවන බලපෑම සමීපව නිරීක්ෂණය කර හෝ මෑතකදී පර්යේෂණයට ලක්කර නොමැත. ශ්‍රී ලංකාවේ මුස්ලිම් කණ්ඩායම් තුළ ආගම ගැන අවබෝධයන්, ආගමිකත්වයෙහි මට්ටම්, සමාජ පාලනයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම්මතයන්, උච්චාවචනය වන බව සහ කාලය අනුව බොහෝ සාධක එනම්, ගැටුම් සහ අවතැන්වීම, දේශපාලනික භූ දර්ශනය සහ නායකත්වය වැනි දේ මත රඳා පවතින බව සිතිය හැක. තවද ඒවා සවුදි අරාබිය වැනි වෙනත් රටවලින් ලැබෙන මුදල් සහ දේව ධර්මය පිළිබඳ බලපෑම සහ සහයෝගය මත, මෙන්ම, සුවිශේෂී ප්‍රජාවන් තුළ ආගමික නායකත්වය සහ එම අදාළ කාලය තුළ අන්තර් ප්‍රජා සම්බන්ධතා මතද රඳා පවතී.

මුස්ලිම් ප්‍රජාව තුළ අත්දැකීම් ජනවාර්ගික කණ්ඩායම හෝ භූගෝලීය ස්ථාන මත විවිධ වන බැවින් සුවිශේෂී නැඹුරුතාවක් පෙන්නුම් කිරීම දුෂ්කර වේ. මුස්ලිම් කාන්තාවන් සඳහා ඉස්ලාමීය ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ නියමයන්, නීතිරීති සහ ඉගැන්වීම්වල පටු හෝ පුළුල් අර්ථ නිරූපණයන් සෘජුවම ඔවුන්ගේ ජීවිතවලට වැඩියෙන්ම බලපාන නිසා, සෑමවිටම උත්සන්න වූ ප්‍රතිවිපාක ඇත.

# PART 4:
# KEY RECOMMENDATIONS

4 වන කොටස:
ප්‍රධාන නිර්දේශ

# ප්‍රධාන නිර්දේශ

පැහැදිලිවම මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සම්බන්ධයෙන් පවතින තත්ත්වය තහවුරු කළ නොහැකිය. නීතිය තුළ සහ එය ක්‍රියාත්මක කිරීම තුළ බරපතළ අඩුපාඩු පවතී. මෙය ප්‍රජාව තුළ කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අයිතීන් සහ යහපැවැත්ම මත අයහපත් බලපෑම් ඇතිකර තිබේ. 16(1) වගන්තිය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, බලපෑමට ලක්වූවන් හට නීතියෙහි වෙනස්කොට සළකන අංගවලට එරෙහිව වන්දි (පිළියම්) සෙවීම වළක්වා ඇති අතර, මුස්ලිම් කාන්තාවන් සමානාත්මතාවයෙන් අඩු පුරවැසියන් බවට පත්කර ඇත. ප්‍රතිසංස්කරණ සඳහා මුස්ලිම් කාන්තාවන්ගේ ප්‍රබල වාසි අවාසිවලට එරෙහි අරගලය, කැපවුණු ක්‍රියාකාරීන් ටික දෙනෙකුගේ නායකත්වයෙන් ප්‍රශංසනීය සහ දිගුකලක් දුක්විඳ, එහෙත් සීමාවන් නිසා බෙදී ඇති එකක් වේ.

මෙම පසුබිම තුළ, මෙම අරගලය තුළ සමීපව දැනුවත් වී සිටි අයගෙන් ලත් අදහස් මෙන්ම, අනෙකුත් රටවල සංසන්දනාත්මක අත්දැකීම් ගැන සාහිත්‍ය විමර්ශනයෙන් ලත් අදහස් ඒකාබද්ධ කිරීම් පහත සාකච්ඡා කර ඇත. කර්තෘවරුන්ගේ ස්වාධීන විශ්ලේෂණයකින්ද මෙය සමන්විත වේ. මේවා අරගලය ඉදිරියට ගෙනයාම සඳහා ක්‍රමෝපායීය උපදෙස් ලෙස ඉදිරිපත් කර ඇත. වර්තමාන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා යම් සීමිත ප්‍රගතියක් ලබා ඇත්නම්, අප ප්‍රාර්ථනා කරන්නේ, සාධාරණ යුක්ති සහගත සහ සමානාත්මතාවයෙන් යුත් සමාජයක් නිසා, මෙම උපදෙස් වලංගුව පවතිනු ඇත යන්නයි.

## A. ප්‍රධාන යුතුකම් දරන්නා ලෙස රජය වගකීම දැරිය යුතුය

ශ්‍රී ලංකාව තුළ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ සහ රජය විසින් ස්ථාපිත කර, පරිපාලනය කර, සහ අරමුදල් සපයන කාති අධිකරණ පද්ධතිය යටතේ මුස්ලිම්රවැන් මුහුණදෙන ගැටළු ආමන්ත්‍රණය කිරීමට රජය හට ප්‍රාථමික යුතුකම පවතී. රාජ්‍ය නීති, පුරවැසියන්ගේ අයිතීන් සුරකින බව සහ අනෙක් අතට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ආගම පදනම් කරගෙන වෙනස්කොට සැළකීම් සහ අසාධාරණත්වය ඇති නොකරන බව සහතික කිරීමට ශ්‍රී ලංකා රජයට ප්‍රමුඛ වගකීම පවතී. මේ සම්බන්ධව, පුරවැසියන්ගේ පෞද්ගලික සහ මූලික අයිතීන් ඔවුන් අනුබද්ධ වී සිටින කණ්ඩායමේ සංස්කෘතික සහ ආගමික අයිතීන්වල නාමයෙන් අත්හැරිය හැකිද නොහැකිද යන්න තීරණය කිරීමේ වගකීම යම් ආගමික හෝ ජනවාර්ගික කණ්ඩායමකට ශ්‍රී ලංකා රජය විසින් ලබාදිය නොහැක. විශේෂයෙන් අනාගමික නීති පවතින ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍යයක, එක් එක් සහ සෑම පුරවැසියෙකු සඳහා පැහැර හැරීමෙන් තොරව අදාළ විය යුතුය.

විවාහ වීමේ අවම වයස වැනි සමහර ගැටළු ගැන, සියළු පුරවැසියන් හට යෝග්‍ය වන වයසක් ස්ථාපිත කර, අයිතීන් ආරක්ෂා කර, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා රජය හට වගකීම ලබාදී ඇත. ළමා අයිතිවාසිකම්වලට ඉදිරියෙන් ප්‍රත්‍යක්ෂ සංස්කෘතික සහ ආගමික අයිතීන් දැමීම සහ මුස්ලිම් බාල වයස් දරුවන් කුඩා වයසේදී විවාහ කරදීමට නීතියෙන් අවසර දීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඔවුන්ගේ ආරක්ෂාව නිත්‍යානුකූලව අහිමි කිරීම මෙම රාජ්‍ය වගකීම බරපතළ ලෙස උල්ලංඝනය කිරීමකි.

අබ්ද් අල්ලා අහ්මද් නා'ඊම් රටවල් 38 ක ඉස්ලාමීය පවුල් නීතිය ක්‍රියාත්මක කිරීම අධ්‍යයනය කර ලියූ ඔහුගේ 'වෙනස්වන ලොවක ඉස්ලාමීය පවුල් නීතිය' යන පොතෙහි පවසන්නේ ඉස්ලාමීය පවුල් නීතිය විවිධ ප්‍රමාණවලින් පරිණාමනයට ලක්වෙමින් පවතින්නේ එය යොදාගන්නා රටවල් විශාල බහුතරයක, "*නීතිය ෂරියාහි* ~~සම්ප්‍රදායික මූලාශ්‍රවලින් ව්‍යුත්පන්න~~ *සම්ප්‍රදායික මූලාශ්‍රවලින් ව්‍යුත්පන්න වනවාට වඩා, රජය විසින් ව්‍යවස්ථාපිත ස්වරූපයෙන් නීතිය පැනවීමයි. තවද, විනිශ්චයක් ව්‍යවස්ථාවක් මත නැතහොත් විනිසුරුවරයෙකුගේ තෝරාගැනීම මත පදනම් වූවත්, එය නෛතිකව බැඳෙන්නේ සහ බලාත්මක කෙරෙන්නේ රජයේ අධිකාරියෙන් පමණි*[82].

මේ නිසා රජය විසින් යුක්තිය පරිපාලනය කිරීම ආගමික කැපවීමෙන් ස්වේච්ඡාවෙන් කෙරෙන අනුකූලකතාවට වඩා වෙනස් වන බව ඔහු තවදුරටත් පවසයි. අහ්මද් නාඊම් තර්ක කරන්නේ, "*මෙම ක්ෂේත්‍රය (ෂරියා නීතිය) සියළුම අනෙකුත් නීති මෙන්, එහි අධිකාරිය ලබාගන්නේ රාජ්‍යයෙහි දේශපාලනික අධිෂ්ඨානයෙන්ය බව වඩාත් හොඳය".* මේ අනුව *ෂරියා* මත පදනම්ව ඇති පුද්ගලික නීතියෙහි විෂයය රජය විසින්ම තහවුරු කරයි නම්

82 'Abd Allā h Aḥmad Na'īm, 2002. *Islamic Family Law in A Changing World: A Global Resource Book.* Law and Religious Program, Emory University. Zed Books Ltd. London, New York

හෝ කරන විට, නීතියෙහි ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කිරීම සහ අවශ්‍ය පරිදි ප්‍රතිසංස්කරණ, සංශෝධන සහ අවලංගු කිරීම් සිදුකිරීම, එහි වගකීම බවට පත්වේ.

## B. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සමානාත්මතාව සහතික කිරීම සහ අධිකරණ සමාලෝචන සඳහා ඉඩදීම

දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ශ්‍රී ලංකා රජයට 16 වැනි වගන්තිය වැනි ව්‍යවස්ථාවෙහි උත්තරීතර බව උල්ලංඝනය කරන සහ එහි සමහර පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමට ඉඩසලසන නිදහස්කිරීම් (exemptions) ආමන්ත්‍රණය කිරීමට කාලීන අවස්ථාවක් ලබාදී ඇත. 2016 වසර මුල් කාලයෙහි මහජන නියෝජිතයින්ගේ කමිටුව සංවිධානය කරන ලද දිස්ත්‍රික් මට්ටමේ අදහස් විමසීම් ආරම්භ වීමෙන් පසු, පිරිමි සහ කාන්තා ක්‍රියාකාරීන්, කේවල් කරන්නන්, සහ විශේෂයෙන් උතුරෙහි සහ නැගෙනහිර බලපෑමට ලක්වූවන්, කොමසාරිස්වරුන් ඉදිරියේ සාක්ෂි දී ප්‍රකාශනයක් ලබාදී මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සමාලෝචනය කිරීම මෙන්ම සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වීමේ විකල්පය ලබාදෙන ලෙස ඉල්ලන ලදී. 16 (1) වගන්තිය අහෝසි කිරීම සඳහා සහ රටෙහි විවිධ පෙදෙස්වල මුස්ලිම් කාන්තාවන්ගෙන්, කාන්තා සහ ළමා අයිතීන් තහවුරු කරන ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇතුළු කරන ලෙසද, පුළුල් ඇමතුම් ලැබී ඇත. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවද, හිමිකම් පිළිබඳ කෙටුම්පත් පණතේ ආලෝකයෙන් ඇතුළුව, සියළුම නීති අධිකරණ සමාලෝචනයකට ලක් කිරීම ඇතුළත් කරන ලෙස නිර්දේශ කර ඇත. එබැවින් මේ සම්බන්ධයෙන් මහජනයා විසින් ප්‍රකාශිත ඉල්ලීම් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ගැබ් වන බව සහතික කිරීම රජයෙහි වගකීම් වේ.

සියල්ලන් සඳහා මූලික අයිතිවාසිකම්වල ප්‍රමිතිගත සමූහයක් සහතික කිරීම පිණිස, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආගම හෝ නිකාය ගැන නොසළකා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් එහි සියළු පුරවැසියන් හට පූර්ණ සමානාත්මතාවය සහ මූලික අයිතිවාසිකම් වල ආරක්ෂාව සැපයීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව, “සංස්කෘතික වශයෙන් සංවේදී” වීමේ මුවාවෙන්, මුස්ලිම් කාන්තාවන්ගේ මානව හිමිකම් උල්ලංඝනයන් ප්‍රජාවේ පිරිමි සාමාජිකයින් කිහිපදෙනෙකු විසින් ඉස්ලාමීය නීතිය යටතේ වරණාත්මකව (තෝරාගෙන) අර්ථ නිරූපණය සහ ප්‍රකාශ කරන පරිදි අවසර දිය යුතු යැයි සිතා, ඒවා ආමන්ත්‍රණය කිරීමට අපොහොසත් වීම, දුර්වල නිදහසට කරුණකි. මෙයින් හුදෙක් අදහස් කරන්නේ, පවතින පීතෘමූලික තත්ත්වය දිගටම පවත්වාගෙන යාමට අවශ්‍ය වන මුස්ලිම් පිරිමින්ගෙන් එන ප්‍රත්‍යක්ෂ විරෝධය හෝ ආපස්සට වැදීම වළක්වා ගැනීම පිණිස ගැටළු ගැන නොසළකා හැරීමටය.

## C. රට පුරා මුස්ලිම් පිරිමින් සහ කාන්තාවන් අතර මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන දැනුවත්භාවය වැඩි දියුණු කළ යුතුය

ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවට බලපාන ප්‍රශ්නවල හරය වී ඇත්තේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ කාති අධිකරණ පද්ධතිය මෙන්ම, සිවිල් අයිතිවාසිකම් සහ ස්වාධීනතාවන් ගැන දැනුම නොමැතිකමය. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ රාජ්‍ය නීති අයුරින්, මුස්ලිම්වරුන් පාලනය වන ද්විත්ව නීතිමය පද්ධතියක් තිබියදීත්, ප්‍රජාවේ බොහෝ සාමාජිකයින්, විශේෂයෙන් කාන්තාවෝ මේ එක් එක් පද්ධතිවල අධිකරණ බලය ගැන නොදැනුවත්ව සිටිති. උදා. ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගැන. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තිබීම, එහි ප්‍රතිපාදන, යෝග්‍ය බව, සහ ක්‍රියාපටිපාටි ගැන දැනුම ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව අතර ඉතා අඩු මට්ටමක පවතින බවද පැහැදිලි වන අතර, මෙය ගැටළුවක් වී ඇත. මන්දයත්, එය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන මිථ්‍යාවන් සහ ප්‍රතිසංස්කරණ කෙරෙහි ප්‍රතිරෝධය පැතිර පැවැත්මට අනිවාර්යයෙන් දායක වන බැවිනි. මෙම අවස්ථාවේදී, නීති(ය), ගැටළු සහ ඉස්ලාමීය නීතියට පවතින විකල්ප දෘෂ්ටිකෝණයන් ගැන දැනුවත්භාවය, ඉතා වැදගත් වේ. පළමුව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතින් වන්නේ කුමක්ද යන්න කාන්තාවන් සහ පිරිමින් එක සමානව දැන ගැනීම අවශ්‍ය වන නිසාය. දෙවනුව, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට ප්‍රතිසංස්කරණ පිළිබඳව විවාද පැවැත්වෙන විට, එහි අවශ්‍යතාවය සහ එම ප්‍රතිසංස්කරණ වලින් මුළු මහත් ප්‍රජාවටම ගෙනෙන ප්‍රතිලාභ ගැන ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු අවබෝධ කර ගැනීම ඉතාමත් හොඳය.

## D. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ මුස්ලිම් අනන්‍යතාව ගැන කෙරෙන ශූන්‍ය චෛක්‍ය ක්‍රීඩාවක් ලෙස නොසැළකිය යුතුය

මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු සහගත ප්‍රතිපාදන සහ ප්‍රායෝගික ප්‍රතිවිපාක තිබියදීත්, ඉහත සඳහන් කළ පරිදි, එය දකින්නේ මුස්ලිම් ප්‍රජාව සඳහා පවතින අනන්‍යතා සළකුණක් ලෙසය. මෙම මතය බොහෝ පුද්ගලයින්ගේ සිතට කෙතරම් කාවැද්දී තිබේද යත්, (අධිශික්ෂණය), මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ප්‍රතිසංස්කරණය කළත්, මුස්ලිම්වරුන්ට සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ පණත යටතේ විවාහවීමේ විකල්පය පවා නොතිබිය යුතු යැයි ඔවුන්ගේ හැඟීමයි. එමෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) වගන්තිය සංශෝධනය කිරීම කෙරෙහි ඇති පසුබැසීම් පදනම් වී ඇත්තේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත බරපතල සමාලෝචනයකට ලක්වී එය අහෝසි කිරීමේ විභවයක් ඇති බව සහ ඒ හේතුවෙන් මුස්ලිම්වරුන්ට ඔවුන්ගේ අනන්‍යතාව නැතිවේ යැයි යන බිය මතය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, යම් මුස්ලිම් දේශපාලන ආගමික නායකයින්, බලගතු පුද්ගලයින් සහ ප්‍රජා සාමාජිකයින් තුළ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත කෙරෙහි තදබල ආරක්ෂිත ආකල්පයක් ඇත.

කෙසේවෙතත්, මෙම තර්කය, හේතූන් කිහිපයක් නිසා තර්කානුකූල නොවේ. ශ්‍රී ලාංකීය මුස්ලිම් ප්‍රජාව ප්‍රායෝගිකව සහ අවබෝධයන්ට අනුව විවිධ සහ විෂමජාතීය වන අතර, අනන්‍යතාවට සම්බන්ධ වන්නේ වෙනස් ආකාරවලිනි. මුස්ලිම් ප්‍රජාව තුළ අඩුම වශයෙන් වෙනස් සුළුජාතීන් සතරක්වත් ඇත. ඒවා ජනවාර්ගික සම්භවය, සංස්කෘතිය, වස්ත්‍ර පිළිබඳ සංග්‍රහය සහ ආගමික පිළිවෙත් අතින් වෙනස් වෙති. තවද ඉස්ලාමීය ගුරුකුල සහ නිකායන්ට අනුව වෙනස්වන බහුවිධ මතවාද මත පදනම් වූ කණ්ඩායම් ද ඇත.

ඉස්ලාමීය නීතිය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත මුස්ලිම් ප්‍රජාවම අනුගමනය කිරීමට සොයන ප්‍රතිපාදන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ ඇතැයි යනුවෙන් තවදුරටත් තර්ක කළ නොහැක. මන්දයත්, පළමුව ශ්‍රී ලාංකීය මුස්ලිම් ප්‍රජාව ඉස්ලාම් ගැන ප්‍රායෝගිකව සහ අවබෝධයන්ට අනුව විෂමජාතීය වන බවට ඇති සාධකය මෙම මිථ්‍යාව මගින් නිෂ්ප්‍රභ කරයි. නීතිම්මංසා වල, විවිධ ගුරුකුල වෙනස් *මද්හබ්* සහ නිකායන් සඳහා විවිධත්වයට ඉඩ දී ඇත. මේ අනුව, උදාහරණයක් ලෙස, අනෙකුත් ප්‍රතිපාදන අතර, කාන්තාවන් හට අනුමැතිය දීමට සහ කාතිවරුන් වීමට අවසර දෙන ඉස්ලාමීය නීතිම්මංසා සම්භාරය මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ ගැබ්වී නොමැත. තෙවනුව, ඉස්ලාමීය නීතිය සහ නීතියෙහි අනාගමික අංග පිළිනොගන්නා *කයිකුලි* වැනි ප්‍රතිපාදන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත තුළ ඇත.

අනෙකුත් අවස්ථාවල, මෙම සුළු ජාතීය ජනවාර්ගික-ආගමික අනන්‍යතාවය ආරක්ෂා කිරීම, කාන්තාවන් සඳහා විවාහය, දික්කසාදය සහ ප්‍රජා ජීවිතයට අදළා දැඩි නීති රෙගුලාසි සහ පාලනයන්ගෙන් විද්‍යාමාන වේ. මේවාට අනෙකුත් ආකාරයන් අතර, සාපරාධී අපරාධ සඳහා අන්තඃ-ප්‍රජා මැදිහත්වීම්, මුස්ලිම් කාන්තාවන්ගේ මත මුරකිරීම්[83] (policing) වැනි දේ ඇතුළත් වේ. මෙම ප්‍රජා මුරකිරීම සහ පාලනය, මුස්ලිම් කාන්තාවන්ගේ 'සදාචාරය, ගෞරවය සහ කීර්තිය' 'රැක ගැනීමේ' 'ආරක්ෂා කිරීමේ' මූලික සංකල්පය මත පදනම් වී ඇති අතර, එය කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ විවාහය සහ 'විවාහයට ඇති සුදුසු බව' ට අන්තරස්ථව සම්බන්ධ වී ඇත. එමනිසා ඒවා අසාධාරණ පවුල් නීතිවලටද අන්තරස්ථව සම්බන්ධය.

වැඩිහිටි කාන්තාවන් පවුලේ පිරිමි සාමාජිකයින්ගේ භාරකාරීත්වය යටතේ බාලවයස්කරුවන් ලෙස සළකන යම් නීති, මෙම නීති අදාළ වන ප්‍රජාව සහ සමාජයන් හට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයන්, තීරණයන් සහ ජීවිතයෙහි තේරීම් මුරකිරීමට සහ පාලනය කිරීමට සහජයෙන්ම අවසර ලබාදේ. මේ මගින් කාන්තාවන්ගේ පුද්ගලික පුරවැසිභාවය, සමාජීය, දේශපාලනික, ආර්ථික සහ සංස්කෘතික අයිතීන් මත සීමාකිරීම් පැන වේ.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් කාන්තාවන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ බරපතළ ගැටළුවලට මුහුණ දෙන්නේ, ඔවුන්ගේ ආගමික සම්බන්ධතාවය නිසා නොව, නීතිය යටතේ සමාන ආරක්ෂාවක් ලබාගැනීමෙන් කාන්තාවන් නුසුදුසු කිරීම සඳහා සහ කාන්තාවන් යටත් කර තබා ගැනීම බලාත්මක කිරීම සඳහා ආගමික සහ නෛතික පදනමක් භාවිතා කර ඇති පීතෘ මූලිකත්වයෙහි සහ බලයෙහි ප්‍රතිඵලයක් ලෙසය. එබැවින්, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට කෙරෙන සංශෝධන මගින් මුස්ලිම් අනන්‍යතාව නිශේධනය කරයි යන තර්කය, මුස්ලිම් පිරිමින් කාන්තාවන්ට ඉහළින් වරප්‍රසාද සහිත කරවන මෙම පීතෘමූලික සංකල්පය තවදුරටත් තහවුරු කරන සහ පවතින තත්ත්වයට තර්ජනය කරන එකකි.

---

[83] An example of community policing is that of two 17-year old girls in Kattankudy in July 2011, who were assaulted after they went into a cyber café to use the internet when returning home from tuition. This incident led to a temporary and 'unofficial' ban on women wearing the face veil, as a way, activists say to identify who is going where. Interestingly other activists have noted that since then there has been a resurgence of the face veil in the district of Batticaloa, because women feel more anonymous and have more mobility to travel without being 'policed' and recognized by other members of the Muslim community.

එක් තරුණ මුස්ලිම් ක්‍රියාකරන්නියක් තහවුරු කළ පරිදි, "මගේ මුස්ලිම් අනන්‍යතාව ආගමේ නාමයෙන් ක්‍රියාත්මක කරන අසාධාරණ නීතිවලින් වඩාත් ශක්තිමත් නොකෙරේ. එහෙත් එය ශ්‍රී ලාංකික පුරවැසියෙක් ලෙස සමානාත්මතාවයට සහ වෙනස්කොට නොසැළකීම කෙරෙහි පූර්ණ අයිතීන් තිබීමට ඇති හැකියාවෙන් ශක්තිමත් වේ. එමෙන්ම, මෙම අයිතීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ රජයෙන්, අනිකුත් ඒවා මෙන්ම, තහවුරු කිරීමටය."

## E. සංස්කෘතික සංවේදීතාවෙන් සංස්කෘතිය සහ ආගමේ නාමයෙන් කෙරෙන අසාධාරණකම් අනුමත කිරීම අදහස් නොකළ යුතුය

පසුගිය මෑත කාලය තුළ, තරුණ මුස්ලිම් සහ මුස්ලිම් නොවන ක්‍රියාකාරීන්, විශේෂයෙන් සුළුතර කණ්ඩායම්වල අයිතීන් සඳහා කේවල්කරන්නන්, මුස්ලිම් විරෝධී කතා විලාශයන්, සංහිඳියාව සඳහා කෙරෙන උත්සාහයන්, යහ පාලනය සහ ප්‍රජාතාන්ත්‍රික අගයන් වැනි දේ ගැන විවෘතව කතා කිරීමේදී බෙහෙවින් කටයුතු කර ඇත. නමුත් ඔවුහු මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත, ප්‍රතිසංස්කරණ, සහ ප්‍රජාව තුළින්ම මුස්ලිම් ප්‍රජාවට බලපාන අනෙකුත් මීට සම්බන්ධ ගැටළු ගැන බොහෝ සේ නිහඬව සිට ඇත. මෙය, පොදුවේ මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ ඊට සම්බන්ධ ගැටළු ගැන තොරතුරු සහ දැනුම නොමැතිකම නිසාද, නැතහොත්, ඒ ගැන ගනුදෙනු නොකිරීම හිතාමතා ගන්නා ලද තීරණයක් නිසාද, යන්න අපැහැදිලිය.

මුස්ලිම් කාන්තාවන් හට බලපාන ගැටළු 'මුස්ලිම් ගැටළු' ලෙස නොව, ළමා අයිතීන් සහ කාන්තා අයිතීන් පිළිබඳ ගැටළු ලෙස දැකීම, වැදගත් වේ. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ, මුස්ලිම් කාන්තාවන්ගේ නෛතික අයිතිවාසිකම් සුරැකීම සහ මුස්ලිම් ප්‍රජාව තුළ පවතින ගැටළු ආමන්ත්‍රණය කිරීමට උපකාරී වන විසඳුම් සකස් කර ගැනීමට සහයෝගය දැක්වීම පිණිස වැඩිපුර හඬවල් කට්ටියට එක්වන්නේ නම්, ප්‍රගතිය සහ සංවාදය සඳහා සැළකිය යුතු විභවයක් පවතී. මුස්ලිම් සුළුතර කණ්ඩායම්වල අයිතීන් වෙනුවෙන් කේවල් කරන්නන් අවබෝධ කරගත යුතු දෙයක් වන්නේ, ශ්‍රී ලාංකීය මුස්ලිම් කාන්තාවන් හට පුරවැසියන් ලෙස පූර්ණ අයිතීන් ලබාගැනීමට නම් සහ ප්‍රජාවේ යහපැවැත්මෙහි ආරක්ෂාව සඳහා, මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු ආමන්ත්‍රණය කිරීම අත්‍යාවශ්‍ය බවය. ඒ එසේ වුවත්, ආගමික සහ සංස්කෘතික අනන්‍යතාවයෙහි පෞද්ගලික අවබෝධය ඉතා වැදගත් ලෙස තහවුරු වන්නේ ගෘහස්ත සහ පවුල් ජීවිතය තුළය.

සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ අදාළ රාජ්‍ය ආයතන මගින් මුස්ලිම් ප්‍රජාව තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසාමානාත්මතාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක කරගත් ප්‍රචණ්ඩත්වයේ ආකාරයන් ආමන්ත්‍රණය කිරීම සඳහා වඩාත් සියුම් සංවාද වලට කාලය එළැඹී ඇත. සමානාත්මතාවය, නෛතික සහ පුරවැසිභාවයේ අයිතීන් ගැන රජය සමග පවත්වන පුළුල් සංවාද තුළ මුස්ලිම් කාන්තාවන් ඇතුළත් කළ යුතුය. මුස්ලිම් නොවන ක්‍රියාකාරීන් සහ පාර්ශ්වකරුවන් හට, විභවීය ක්‍රමෝපායයන් සහ එහිදී අවශ්‍ය වන සහයෝගීතාවන් ගැන මුස්ලිම් ක්‍රියාකාරීන් සමග ඵලදායී සංවාදයක යෙදීමට හැකිවිය යුතුය. දේශපාලනික නිවැරදිභාවය සහ වඩාත් පරීක්ෂාකාරී සංස්කෘතික සංවේදීතාව අවශ්‍ය වන වේලාවක් සහ ස්ථානයක් ඇත. නමුත් එය නිසැකවම මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදුවන විට වලංගු නොවේ.

# ANNEXE:
# STRATEGIC ACTION POINTS

**ඇමුණුම:**
**ක්‍රමෝපායයිය**
**ක්‍රියාකාරීත්ව ලක්ෂ්‍යයන්**

## ඇමුණුම: ක්‍රමෝපායයිය ක්‍රියාකාරී ලක්ෂ්‍යයන්

**පහත සඳහන් වන්නේ, සම්මුඛ සාකච්ඡා, ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡා සහ කර්තෘවරුන්ගේ විශ්ලේෂණයෙන් මතුවූ, ඒකාබද්ධ කළ නමුත් පරිසමාප්ත නොවන, නිර්දේශ ලැයිස්තුවකි.**

### 1. රජයේ වගකීම අනිවාර්ය කිරීම

1.1. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට පහසුකම් සැපයීම සහ කඩිනම් කිරීම සහතික කිරීම;

- මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ කමිටුව මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ සකස් කිරීමේදී දැන් සිටින්නේ එහි සත්වැනි වසර තුළය. කමිටුව විසින් ක්‍රියාවලිය සම්පූර්ණ කර ප්‍රමුඛතාවයක් ලෙස එහි වාර්තාව ඉදිරිපත් කරන බවට අධිකරණ අමාත්‍යාංශය සහතික කළ යුතුය;
- අධිකරණ අමාත්‍යාංශය විසින් වාර්තාව ප්‍රසිද්ධ කර, එහි අන්තර්ගතය සහ ගැටළු ගැන දැනුවත් කිරීම් සහතික කළ යුතුය. එය සංවෘත ක්‍රියාවලියක් වූ නිසා, එය සමානාත්මතාවයේ සහ වෙනස්කොට නොසැළකීමේ පරීක්ෂාවට අනුකූල වේ දැයි බැලීම සඳහා එහි විවේචනාත්මක ඇගයීමක් අවශ්‍ය කෙරේ;
- මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි සංශෝධන පණත් කෙටුම්පත නිර්දේශ මත පදනම්ව ප්‍රතිසංස්කරණ සඳහා අරගල කරමින් සිටි කාන්තාවන්ගේ ඉල්ලීම්වලට එකඟවන බව සහ ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර බැඳීම්වලට අනුව බලාපොරොත්තු වන පරිදි ක්‍රියාකරන බවත්, තහවුරු කිරීමේ වගකීම සියළුම අදාළ පාර්ශ්වකරුවන් සතුවේ. මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු දරුවන් ශ්‍රී ලාංකීය පුරවැසියන් ලෙස නීතිය ඉදිරියේ වෙනස්කොට සැළකීම්වලට සහ අසමාන සැළකිලිවලට භාජනය නොවන බවට පණත් කෙටුම්පත සහතික කළ යුතුය.
- මුස්ලිම් ප්‍රජාව සමග කටයුතු කර ඇති නායකයින්, සංවිධාන සහ පාර්ශ්වකරුවන් පණත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා සාමූහිකව සන්ධානයක් ගොඩනැගීම අවශ්‍ය වේ.

### 1.2. දැනට කෙරෙන උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීම

#### 1.2.1. මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි නඩු සහ කාති පරිපාටි සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයකට වරය දීම

- කාති අධිකරණවලට සම්බන්ධ පැමිණිලි ආමන්ත්‍රණය කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සක්‍රීය කාර්යභාරයක් ඉටුකළ යුතු අතර, විශේෂයෙන් මූල්‍යමය කාරණා පිළිබඳව අධීක්ෂණ යාන්ත්‍රණයක්ද කාතිවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක්ද ස්ථාපිත කළ යුතුය;
- අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් එය වෙත ලැබෙන පැමිණිලි සංඛ්‍යාව ලේඛන ගත කර වාර්තා කල යුතු අතර, එම නඩු පිළිබඳව ගෙන ඇති පියවර අධිකරණ අමාත්‍යාංශයට වාර්තා කළ යුතුය;
- කාතිවරුන්ගේ අල්ලස් සහ සාපරාධී අපරාධ ගැන අනෙකුත් නඩු, ඔවුන්ව සේවයෙන් පහකිරීමෙන් පමණක් නොනවත්වා වඩා දැඩි පියවර ගත යුතුය. තවද, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අල්ලස් කොමිසම වැනි අදාළ විමර්ශන සිදුකරන ආයතනවලට එම නඩු යොමුකරන බවට සහතික කිරීම අවශ්‍ය වේ;
- අභියාචනා සම්බන්ධයෙන් පවතින ප්‍රවණතා සහ රටාවන් සනිටුහන් කර ගැනීමට කාතිවරුන්ගේ මණ්ඩලයට වගකීම පැවරේ (උදාහරණයක් වශයෙන්, යම් පෙදෙසකින් අභියාචනා වැඩි සංඛ්‍යාවක් ලැබෙන්නේ නම් අදාළ කාතිවරයා ගැන ප්‍රබල ගැටළු පැවතිය හැකි බව අදහස් කෙරේ). එමෙන්ම කාතිවරුන්ගේ මණ්ඩලය ඊට සම්බන්ධ පියවර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව සහ අධිකරණ අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කළ යුතුය;
- කාති මණ්ඩලයට සහ අධිකරණ සේවා කොමිෂන් සභාවට ලැබෙන්නේ මොන ආකාරයේ නඩුද යන්න ගැන සහ මෙම නඩු පසුවිපරම් කර ආමන්ත්‍රණය කරනුයේ කෙසේද යන්න ගැන අදාළ සහ නූතන (මෑත) තොරතුරු, සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් ලබාගත යුතුය. තවද කාති මණ්ඩලයෙන් ඔබ්බට අභියාචනාධිකරණය වෙත යන නඩුවල ආකාරය (වර්ගය) සහ වාර ගණන සටහන් කිරීමද එළිදරව්කාරී වනු ඇත.

### 1.2.3. නඩු ආමන්ත්‍රණය කිරීමට පොලීසිය නිසි ක්‍රියාවලිය ගැනීම සහතික කිරීම

- මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත යටතේ කාති අධිකරණ බලය වැනි පණතෙහි අදාළ අංශයන් ගැන පොලිස් නිලධාරීන් සහ පොලිස් ස්ථානවල කාන්තා කාර්යාංශ සහ රෝහල් දැනුවත් කිරීම අවශ්‍ය වේ;
- සියළු පුරවැසියන්ට බලපාන රාජ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි වලට අනුකූලව පොලීසිය විසින් මුස්ලිම් කාන්තාවන් හට තොරතුරු සහ සහාය සේවා සැපයිය යුතුය. විශේෂයෙන් ගෘහස්ත ප්‍රචණ්ඩත්ව හෝ අන් ආකාරවල අපයෝජනයන්ගෙන් දිවිගලවා ගත් වින්දිතයින් හට ඒවා ලබාදිය යුතුය;
- අදාළ පෙදෙස්වල පොලිස් කාර්යාංශවල කාන්තා නිලධාරීන්ගෙන් සහ ප්‍රජාවට සරිලන අන්දමේ භාෂා හැකියාව ඇති නිලධාරීන්ගෙන් කාර්ය මණ්ඩලය සමන්විත වන බව සනාථ කළ යුතුය;
- උපදේශන සේවාවන් සපයන මුස්ලිම් සංවිධාන සහ කණ්ඩායම් මෙන්ම, මුස්ලිම් දේවස්ථාන කමිටු සහ සම්මේලන, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පණතෙහි සීමාව ඇතුළත වැටෙන ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව නඩු වලදී හෝ අනෙකුත් සාපරාධී නඩු, පොලීසිය වෙත නොදන්වා මධ්‍යස්ථ වීමට හෝ උපදේශන ලබාදීමට උත්සාහ නොකළ යුතුය. ඒ වෙනුවට ඔවුන් නිසි පියවර පිණිස ඒවා පොලීසියට යොමුකිරීම අවශ්‍ය වේ.

### 1.2.4. ආගමික ආයතනවල කාර්යභාරය සහ වරය ගැන පැහැදිලි කිරීම

- මුස්ලිම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මුස්ලිම් දේවස්ථාන කමිටුවල සහ සම්මේලනවල කාර්යභාරය සමීපව තක්සේරු කර, පැනනගින ගැටළු සහ පැමිණිලි විමර්ශනය කර අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගැනීම සඳහා පැමිණිලි යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය;
- තවද, මුස්ලිම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය රට පුරා මුස්ලිම් දේවස්ථාන කමිටු සහ සම්මේලන වෙත, අදාළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සහ අනෙකුත් සාපරාධී අපරාධ නඩු පොලීසියට නොදන්වා බේරුම් කිරීම් හෝ මැහදත් වීම් පසුපස නොගොස් ඒවා පොලීසිය වෙත යොමුකළ යුතු බවට තොරතුරු සහිත නියෝගයක් නිකුත් කළ යුතුය;
- මුස්ලිම් දේවස්ථාන කමිටුවල සහ සම්මේලනවල නියමිත කාර්යභාරය ගැන ප්‍රජා දැනුවත් කිරීම් කළ යුතුය. මෙම කමිටු හෝ සම්මේලනවලට ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සහ සාපරාධී අපරාධ නඩු වලදී පොලීසියට නොදන්වා මැදිහත්වීම් හෝ ඇඟිලි ගැසීම් (බාධා කිරීම්) කළ නොහැකි බව පාලන ආයතන විසින් ප්‍රජාවට පැහැදිලි කර දිය යුතුය;
- සමස්ථ ලංකා ජම්යියාතුල් උලමා සහ අනෙකුත් අදාළ ආගමික ආයතන ප්‍රජාව තුළින් පැමිණෙන බරපතළ ගැටළු ආමන්ත්‍රණය කිරීම ප්‍රමුඛතා ගත කර, මුස්ලිම් කාන්තාවන්ගේ අයිතීන් උල්ලංඝනය නොවන බව සහතික කිරීමට විසඳුමක් සඳහා පහසුකම් සැපයිය යුතුය.

### 1.2.5. නියමිත අමාත්‍යාංශ සහ ආයතන මගින් අදාළ ගැටළු ගැන පියවර ගැනීම සහතික කිරීම

- අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, සහ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වැනි අදාළ ආයතන විවාහ වීමේ අවම වයස පිළිබඳ ගැටළුව ළමා අයිතීන් පිළිබඳ ගැටළුවක් ලෙස සළකා කටයුතු කළ යුතුය. මුස්ලිම් දරුවන් සහ තරුණයින් ගැන නියෝජනයන් සහ පැමිණිලි ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට ඉදිරිපත් කරන්නේ නම්, රජයේ නීතිවලට සහ ප්‍රතිපත්තිවලට අනුකූලව යෝග්‍ය පියවර ගත යුතුය;
- කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වැනි අදාළ අමාත්‍යාංශ මුස්ලිම් කාන්තාවන් මුහුණදෙන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට සම්බන්ධ ගැටළු පිළිගැනීම අවශ්‍ය වන අතර, ඔවුන්ගේ ජාතික ක්‍රියාකාරී සැලසුම් සහ අමාත්‍යාංශ මුල් පිරීම්වල මේවා ආමන්ත්‍රණය කිරීම පිණිස ක්‍රමෝපායයන් අන්තර්ගත කළ යුතුය.

## 2. රාජ්‍ය යාන්ත්‍රණ හරහා යුක්තිය සෙවීම

### 2.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සමානාත්මතාවය සහතික කරන බව තහවුරු කිරීම

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා මෙහෙයුම් කමිටුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරු කිසිම නීතියකට නිදහස් කිරීමක් නැතිව කොන්දේසි රහිතව 16 (1) වගන්තිය අහෝසි කරන බවට සහතික විය යුතු අතර, සියළු නීති අධිකරණ සමාලෝචනයක් සඳහා යොමුකර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර බව සාක්ෂාත් කළ යුතුය;

- සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඔවුන්ගේ කේවල් කිරීම උත්සන්න කර පවත්වාගෙන යාමෙන් මුස්ලිම් කාන්තාවන් ඇතුළුව, ඕනෑම පුරවැසියෙකුගේ මූලික අයිතිවාසිකම් සමානව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, ආගම සහ ජාතිය පදනම් කොට ගෙන වෙනස් කොට සැළකීම් නොමැතිව සළකන බවට සහතික කළ යුතුය.

### 2.2. සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත සහ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම

- අධිකරණ අමාත්‍යාංශය සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්, 2009 සාමාන්‍ය පවුල් නීති ප්‍රතිසංස්කරණ කමිටුව මගින් මුස්ලිම්වරුන්ට සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වීමට විකල්පය ලබාදිය යුතු බවට නිර්දේශ කරමින් මීට පෙර ඉදිරිපත් කළ වාර්තාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිණිස පසු විපරම් කළ යුතුය;
- සියළු පුරවැසියන් සඳහා විවාහ වීමේ අවම වසය 18 ලෙස ස්ථාපිත කිරීම සහතික කිරීමට අමතරව, ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ පිළිබඳ දණ්ඩ නීති සංග්‍රහයෙහි 363 වැනි වගන්තිය සංශෝධනය කර, වයස අවුරුදු 16 ට අඩු සියළු ගැහැණු ළමයින් ඇතුළත් කරන බවට, අධිකරණ අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, නීති කොමිසම සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහතික කළ යුතුය.

## 3. මුස්ලිම් කාන්තාවන් හට බලපාන ගැටළු ප්‍රධාන ප්‍රවාහගත කිරීම

කාන්තා සහ ළමා අයිතීන් පිළිබඳ සංවිධාන සහ තරුණ කණ්ඩායම් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු ගැන දැනුවත්වීම සාක්ෂාත් කිරීමට උත්සාහයන් දැරිය යුතු අතර, සාමූහික ක්‍රියාකාරීත්වයන්ට අනුබල දිය යුතුය.

### 3.1. මහජන (ප්‍රසිද්ධ) සංසද හා මාධ්‍ය හරහා

- සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් මුස්ලිම් කාන්තාවන්ට සහ ප්‍රජාවට බලපාන ගැටළු නිරන්තරයෙන්ම ප්‍රසිද්ධ සංවාදයට ගෙන ආ යුතුය. මෙය පුවත්පත්, ලිපි, මතයන් සහ කේවල් කිරීමේ අංග, විවෘත ලිපි, ප්‍රකාශනයන් සහ පුවත්පත් දැන්වීම්, දේශියව භාෂා තුනෙන්ම සහ ජාත්‍යන්තරව සිදුකළ යුතුය;
- මාධ්‍යවේදීන් සහ මාධ්‍ය පුද්ගලයින් හට මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන කතාන්තර ලබාගෙන, විමර්ශනය කර, තොරතුරු එක්රැස් කර, ප්‍රජා මට්ටමේදී මුහුණදෙන විවිධ ගැටළු ඉස්මතු කිරීමට අනුබල දීම සහ උන්නදු කරවීම කළ යුතුය;
- පොස්ටර්, පත්‍රිකා සහ කාති කාර්යාල සහ මුස්ලිම් දේවස්ථාන වලින් පිටත නිවේදන, වැනි දේ තුළින් මහජන අධ්‍යාපන මුල්පිරීම් හරහා, මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කොටගෙන, කාති අධිකරණවල අධිකරණ බලය ගැන තොරතුරු සහිතව නිකුත් කළ යුතුය;
- පොලීසියේ අධිකරණ බලය ගැන තොරතුරු, මුස්ලිම් කාන්තාවන් අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැනි ගැටළු ගැන, රජයේ නෛතික ක්‍රියාවලිය හරහා නඩු ගොනුකිරීම සඳහා ක්‍රියාපටිපාටි.

### 3.2. අන්තර්-ප්‍රජා සංවාද සහ මුල්පිරීම් හරහා

- මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත සහ ප්‍රතිසංස්කරණ ගැන සංවාද සහ සාකච්ඡා මැලේ, මේමන් සහ බෝරා (අනික් අය අතර) වැනි සුළුතර මුස්ලිම් ප්‍රජාවන් වෙත මෙන්ම, රට වටා මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතට අදාළ මුල්පිරීම් වලින් සාමාන්‍යයෙන් ඉවත් කර ඇති දිස්ත්‍රික්ක සහ පෙදෙස් (දකුණු සහ මධ්‍යම දිස්ත්‍රික්ක වැනි) වලටද ව්‍යාප්ත කළ යුතුය ;
- මැලේ සංගම් වැනි ප්‍රජා-මූලික සංගම් සහ අනෙකුත් සංවිධාන මුස්ලිම් විවාහ සහ දික්කසාද පණත ගැන සහ කාති අධිකරණ පද්ධතිය ගැන ඔවුන්ගේ ඡන්ද බල ප්‍රදේශ තුළ වැඩමුළු, සාකච්ඡා පැවැත්වීම සහ අධ්‍යාපන මුල්පිරීම් සිදුකිරීම අවශ්‍ය වේ;
- සුළුතර මුස්ලිම් ප්‍රජාවන්ගේ සාමාජිකයින්ට ඔවුන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ ගැන සංවාද, අදහස් විමසීම් සහ ජාතික මට්ටමේ සාකච්ඡාවල පාර්ශ්වයක් වන බව සහතික කිරීම අවශ්‍ය වන අතර, ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් මුහුණදෙන අභියෝගයන් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දැරිය යුතුය.

## 4. සාක්ෂි පදනම ශක්තිමත් කිරීම

### 4.1. තොරතුරු එක්රැස් කිරීම සහ තහවුරු කිරීම

- මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි විවිධ අංශ ගැන ප්‍රජා සාමාජිකයින්ට, පිරිමින්ට සහ කාන්තාවන්ට හැඟෙන්නේ කුමක්දැයි නිර්ණය කිරීමට උපකාරී වීම පිණිස, අවබෝධයන් ගැන සමීක්ෂණ එක්රැස් කළ යුතුය. මෙහිදී ශ්‍රී ලංකාව තුළ විවිධ මුස්ලිම් සුළුතරයින් යොදාගත යුතු අතර භූගෝලීය පැතිරීමක් හරහා එය සිදුකළ යුතුය;
- මෙම සමීක්ෂණවලට කාන්තා කාතිවරුන් සිටීම, විවාහ වීමේ වයස, බහුභාර්යත්වය, සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පණත යටතේ විවාහ වීමට තෝරා ගැනීම ගැන ප්‍රජාවේ අවබෝධය ඇතුළත් කළ හැක;
  - මේවා විවිධ පෙදෙස්වලින් හෝ මාර්ගගත (online) ඡන්ද විමසීම හරහා හෝ වෙනත් ප්‍රධාන ප්‍රවාහ සහ සමාජ මාධ්‍ය මාර්ග වලින් ලබාගත හැක;
  - මෙම අවබෝධයන් ගැන සමීක්ෂණ, දුර්මතයන් ගැන වඩාත් ගැඹුරු සහ වඩාත් සියුම් තේරුම් ගැනීමකට ඉඩ සලසා, ප්‍රජා මට්ටමේදී මෙම ගැටළු වටා මැදිහත්වීම් සහ සාකච්ඡා නිර්මාණය කිරීමට උපකාරී වේ.
- මුස්ලිම් ප්‍රජාව තුළ බාල වයස්කාර විවාහ වැනි ගැටළු ගැන, රට පුරාම ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විකේන්ද්‍රීය කළ සංඛ්‍යා ලේඛන එකතු කිරීම අවශ්‍ය වේ.
- මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ප්‍රතිසංස්කරණ සඳහා කෙරෙන උත්සාහයන් ඌනපුරණය කිරීම පිණිස, (පුද්ගල ක්‍රියාකාරීන් හඳුනාගත් අනිකුත් ඒවා අතර) බහුභාර්යත්වය, දික්කසාදය, *කයිකූලි* පිළිබඳ කරුණු, නඩත්තු ගැටළු සහ *හද්* දඬුවම්, යන මේවායෙහි ස්වභාවය, ව්‍යාප්තිය/පැතිරීම, රටාවන් සහ බලපෑම් ගැන ගුණාත්මක සහ ප්‍රමාණාත්මක අධ්‍යයනයක් සිදුකළ යුතුය;
  - අවශ්‍ය කරන අනෙකුත් තොරතුරුවලට, එක් එක් කාති අධිකරණය මගින් ගොනුකර ඇති බලාත්මක කිරීමේ නියෝග සංඛ්‍යාව, අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි වර්ගය, වැනි දායක වන තොරතුරු ඇතුළත් වේ;
- සොයාගැනීම්, මාධ්‍යය තුළ සහ අදාළ බලධාරීන් සමග පුළුල්ව බෙදාහදා ගත යුතුය. මෙහිදී සදාචාරාත්මක වාර්තා කිරීමේ භාවිතයන් අනුගමනය කිරීම සහ දිවිගලවා ගත් වින්දිතයින්ගේ අනන්‍යතාවය සහ ඔවුන් ගැන තොරතුරු ආරක්ෂා කිරීම වැදගත් වේ.

## 5. තාක්ෂණික සහාය ලබාදෙන නියෝජිතායතන මගින් ඇතුළු කිරීමේ ප්‍රවේශය

- කාන්තා අයිතීන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, ළමා අයිතීන්, (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇතුළුව) නෛතික ප්‍රතිසංස්කරණ වලට අදාළව අදාළ අමාත්‍යාංශවලට මෙන්ම, පෞද්ගලික පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සමග තාක්ෂණික සහාය සපයන නියෝජිතායතන විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පණතෙහි ගැටළු ගැන කටයුතු කිරීම සහ රජය විසින් පියවර ගැනීම පසුපස යන බව සහතික කළ යුතුය;
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක කරගත් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට සහ කාන්තා අයිතීන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි සමානාත්මතාවය ප්‍රගමනය කිරීමට කටයුතු කරන සංවිධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම්මතයන් තවත් ශක්තිමත් කරන කුඩා පරිමාණයේ ආර්ථික ක්‍රියාකාරකම් පමණක් සැපයීම වෙනුවට, ඔවුන්ගේ වැඩ සටහන් සම්පාදනය තුල මුස්ලිම් කාන්තාවන්ගේ අයිතීන් උල්ලංඝනය කිරීම් ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය වේ.

**මෙම ලේඛණය හුදෙක්ම මෙහි ඉංග්‍රිසි ලේඛණයේ සිංහල පරිවර්ථනයක් වන බැවින් කුමන හෝ පරස්පරතාවයකදි ඉංග්‍රිසි ලේඛණයේ දක්වා ඇති කරුණු බලාත්මකවේ**

"My Muslim identity is not made stronger by unjust laws implemented in the name of my religion, but rather it is strengthened by my ability to have full rights to equality and non-discrimination as a Sri Lankan citizen. And for these rights to be guaranteed by the Constitution and the State, as all others.”